# දෙසතිය

පුවත් සඟරාව

2026 මාර්තු



## ඇඟිලි තුඩේ මීඩියා

# මුහුදු රකින රොබෝ




සොබාදහමේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වී ඇති සාගර ප්ලාස්ටික් දූෂණය පරාජය කිරීමට නූතන ලෝකය දැන් අතිනවීන රොබෝ තාක්ෂණයේ සහ කෘත්‍රිම බුද්ධියේ (AI) සහාය ලබා ගනිමින් සිටිනවා. ඒ, මේ තාක්ෂණික විප්ලවයේ පෙරගමන්කරුවෙකු වෙමින් 'The Ocean Cleanup මෙහෙයුම' නිල් සාගරය සුරැකීමේ සුවිශේෂ මෙහෙයුමක් ලෙස ආරම්භ කරමින්.




මේ ව්‍යාපෘතියෙන් සාගරයට ප්ලාස්ටික් එකතු වන ප්‍රධාන මාර්ග වන ගංගා මුවදොර ඉලක්ක කරගනිමින් Interceptor නමින් හැඳින්වෙන රොබෝ යාත්‍රා පද්ධතියක් හඳුන්වා දී තිබෙනවා. මෙය සම්පූර්ණයෙන් ම සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක වන, ස්වයංක්‍රීය ව කුණු එකතු කරන පාවෙන පද්ධතියක්.




2013 වසරේදී මේ මෙහෙයුම ආරම්භ කරන ලද්දේ එවකට 18 හැවිරිදි වියේ පසු වූ නෙදර්ලන්ත ජාතික Boyan Slat නැමති තරුණ නවෝත්පාදකයා විසින්. ඔවුන්ගේ පර්යේෂණ අනුව සාගර ප්ලාස්ටික් දූෂණයෙන් 80%ක් ම සිදුවන්නේ ලොව ඇති දූෂිතම ගංගා 1000කින්. මේ වන විට ඔවුන් ලොව පුරා සාගර සහ ගංගාවලින් ප්ලාස්ටික් හා වෙනත් අපද්‍රව්‍ය කිලෝග්රෑම් මිලියන 47කට (ටොන් 47000කට) වඩා වැඩි ප්‍රමාණයක් ඉවත් කරමින් පරිසර සුරැකුමට දැවැන්ත දායකත්වයක් ලබා දී තිබෙනවා.



දැනටමත් ලොව ප්‍රධාන ගංගා පද්ධති කිහිපයක Interceptor රොබෝ යාත්‍රා ක්‍රියාත්මක වන්නේ සාර්ථක ව. එය පිරිසිදු නිල් සාගරයක් පිළිබඳ බලාපොරොත්තුව තවදුරටත් තහවුරු කරන අතර සොබාදහම සුරැකීමට තාක්ෂණය යොදා ගත හැකි බවට ලොවට ම දෙන මහඟු ආදර්ශයක්.

**එම්. එම්. මධුසංක කුමාර**

# දෙසතිය
පුවත් සඟරාව


වෙළුම 48, කලාපය 03,
2026 මාර්තු

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**
48 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





21 ඇඟිලි තුඩේ මීඩියා



12 පිබිදුණු වතුකරය




03 පුවත් සඟරා ඉතිහාසයේ නොමැකෙන සලකුණ



35 මිනිසාට ඇස තියන රුසියානු ලිව්සැරිය



06 හොයියා හෝයියා



40 සුද්දාගේ ක්‍රීඩාව

# දෙසතිය
පුවත් සඟරාව

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..............................................

Address ..............................................

..............................................

..............................................

..............................................

..............................................

ID Number ..............................Tel / Mobile ..............................

Signature ..............................Date..............................

දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1680.00

අර්ධ වාර්ෂික දායකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදාළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

# 48 සටහන

සඟරා ඉතිහාසයේ අඩසියවස ආසන්නයේ සිටින ' **දෙසතිය** පුවත් සඟරාව' මේ වන විට නූතන සඟරා මාධ්‍ය අවකාශයේ සිය අනන්‍යතාව සලකුණු කර අවසන්. ඒ, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ ව පළ කරනු ලබන මෙරට එක ම සිංහල පුවත් සඟරාව ලෙසින්. 1978 පෙබරවාරි 04 දින එය ඇරඹී ඇත්තේ එවක තරුණ පරපුරට ලබාදෙන බුද්ධිමය තිළිණයක් ලෙසින්. එනම් සිංහල උගත් තරුණ පරපුරට ජාත්‍යන්තර මට්ටමින් පුවත් සඟරාවක් ප්‍රදානය කිරීම එහි ප්‍රමුඛ අරමුණක් වුණා.

එදා තරුණ පරපුර ඒ අයුරින් **දෙසතිය** සමඟ අත්වැල් බැඳ ගනිද්දී අද තරුණ පරපුර **දෙසතිය** සමඟ එක් වන්නේ මුද්‍රිත අවකාශයෙන් පමණක් නොව ඩිජිටල් අවකාශයෙනුත්. ඒ, දශක 04ක් ඉක්මවා යමින් පාඨකයාගේ බුද්ධිමය නිම්වළලු පුළුල් කරමින් පැමිණි ගමන්මඟ නව මාධ්‍ය සංස්කෘතියට ගැළපෙන අයුරින් යාවත්කාලීන කිරීමට **දෙසතිය** තැබූ නව පියවරත් සමඟ. මේ අනුව www.desathiya.lk වෙබ් පිටුව සහ දෙසතිය අන්තර්ජාල යෙදවුම (desathiya app) ඔස්සේ වත්මන් පාඨකයන්ට **දෙසතිය** සඟරාව කියවීමට අවකාශය ලැබෙනවා. එහෙත් ඩිජිටල් තාක්ෂණය හමුවේ මුද්‍රිත මාධ්‍ය ලෝකයේ සීමා මායිම් බිඳ දමමින් යන ගමනේ වුව **දෙසතිය** ඊට අනුගත වෙමින්, සිය පැවැත්ම තහවුරු කර ගන්නේ මුද්‍රිත සඟරාවකට ද හිමිකම් කියමින්.

'රජයේ දැක්ම' ජනතාව වෙත ගෙන යන විශ්වසනීය තොරතුරු මාධ්‍යයක් ලෙසත් **දෙසතිය** වැදගත්. ආර්ථික, සමාජ, දේශපාලන, විද්‍යා, කලා, සාහිත්‍ය, ක්‍රීඩා යනාදී සෑම ක්ෂේත්‍රයක් ම ආවරණය වන අයුරින් මධ්‍යස්ථ වාර්තාකරණයක් ඔස්සේ තොරතුරු විශ්ලේෂණාත්මක ව හා විග්‍රහාත්මක ව සංගෘහිත මේ සඟරාව වර්තමානයේ බාල, තරුණ, වැඩිහිටි වයස් භේදයකින් තොර ව පරිශීලනය කළ හැකි දැනුම් සම්භාරයකින් සරසන බවට මෙතෙක් **දෙසතිය** සමඟ රැඳී සිටින පාඨක ප්‍රජාව සාක්ෂ්‍යය දරනු ඇති. පාසල්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව මෙන් ම පුස්තකාල පාඨක සමාජ ද නියෝජනය වන නිත්‍ය පාඨක පිරිසක් **දෙසතිය** වටා රොක් වීම සැබවින් ම සතුටට කරුණක්. එසේ ම ඩිජිටල් මාධ්‍ය අවකාශය ඔස්සේ එය දෙස් විදෙස් පාඨකයන් අතරට යන්නට මඟ හෙළිපෙහෙළි වී ඇති බැවින් ඉදිරියේදී එම පාඨක පිරිස පුළුල්වනු ඇතැයි යන්න අපගේ ඉදිරි අපේක්ෂාවක්. එහිදී සුහුරු මාධ්‍යයෙන් කියවන නූතන පරම්පරාව (Gen Z) විශ්ලේෂණාත්මක පුවත් රැගත් සඟරා සාර සංග්‍රහයකට සම්බන්ධ කර ගැනීමත් අපගේ ඉදිරි අභිප්‍රායයක්.

වසර 48ක් ඉක්මවමින් **දෙසතිය** යන ගමනේ එදා මෙදා තුර ඒ වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය, බුද්ධිය කැප කළේ විශාල පිරිසක්. සන්නිවේදන ලෝකයේ බහුල ව පුවත් මැවෙද්දී, ඒවායින් වැදගත් ම පුවත් සීරු මාරුවට තෝරා බේරා ගනිමින් විශ්ලේෂණාත්මක ව පාඨක ප්‍රජාව වෙත සමීප කරන්නට නන් අයුරින් ඊට දායක වූ සහ දායක වන පිරිස කෘතවේදී ව සිහිපත් කිරීම අපගේ යුතුකමක්.

එළඹෙන සියලු අභියෝග ජය ගනිමින් **දෙසතිය** මාධ්‍ය මෙහෙවර නොනවත්වා ඉදිරියටත් පාඨක ඔබ වෙනුවෙන් ඉටු කිරීමයි අපගේ අභිප්‍රාය. ඒ, නව මුහුණුවරකින් හා වෙනස් වන මාධ්‍ය ලෝකයේ නව ප්‍රවණතා කෙරෙහි ද අවධානය යොමු කරමින් පාඨක ඔබේ රුචිකත්වය වෙනුවෙන් ගෙනෙන සාර සංග්‍රහයක් ලෙස ඔබ අතට එය පත් කරමින්. මෙවැනි පසුබිමක අඛණ්ඩ ව පළ කෙරෙන එක ම පුවත් සඟරාව ලෙස **දෙසතිය** සන්නාමය සියවසක් ඉක්මවා ආයු විඳිනු දැකීම පාඨක ඔබගේ ද ඒකායන පැතුම වනු නොඅනුමානයි.

මාලා මල්ශානි ජයසිංහමගේ

\- සංස්කාරක -



# පුවත් සඟරා ඉතිහාසයේ නොමැකෙන සලකුණ

අනුහස් මහවලගේ

අවුරුදු 48ක් පුවත් සඟරාවක් අඛණ්ඩ ව ජනතාව අතර ගැවසීම ම එහි වටිනාකම, අගය හා වැදගත්කම නොනැසී පවතින බව කියාපාන වැදගත් සාධකයක්. පරම්පරා දෙක තුනක සුවහසක් පාඨක ප්‍රජාවක් 1978 සිට මේ දක්වා දෙසතිය සිය ජීවිතයට ළෙන්ගතුව වැලඳගත්තේ සමීප මිතුරෙකු, දැනුම් බෙදන්නෙකු, හෘදයාංගම වැඩිහිටියෙකු නිරතුරු ව ම තමන් අසල සිටිනවා වැනි හැඟීමකින්.

පුවත්පත් හා ගුවන්විදුලිය පමණක් ජනමාධ්‍ය ලෝකයේ රජකරමින් සිටි එම යුගයේ පුවත්පතට අමතර ව පාඨකයා අතරට ගියේ ලෝ ප්‍රකට ටයිම් සඟරාව, නිවුස් වීක්, ඒෂියා වීක්, ඉන්ඩියා ටුඩේ, රීඩර්ස් ඩයිජස්ට් වැනි සඟරා. ඒවා ඉංග්‍රීසි පාඨක පිරිසට ලොව පුරා පුවත් දැනගැනීමට තිබූ පහසු ම මුද්‍රිත මාධ්‍ය ලෙසයි සැලකෙන්නේ. බීබීසී සහ වෙනත් ජාත්‍යන්තර ගුවන්විදුලි සේවාවල භාවිත වුණෙත් ඉංග්‍රීසි භාෂාව.

සිංහල පාඨක පිරිසට එවැනි මුද්‍රිත සඟරාවක අපේක්ෂාව තදින් ම තිබූ යුගයකයි **දෙසතිය** පාඨක පිරිස අතරට පැමිණියේ. ඉන්ටර්නෙට්, ඊමේල්, සමාජ මාධ්‍ය නොතිබූ එදවස ලොව පුරා ඇතිවන තතු සරල ව, සංක්ෂිප්ත ව සිංහල පාඨකයන් අතරට සමීප කරවන්නට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ආචාර්ය සරත් අමුණුගම මුලපිරූ ප්‍රයත්නය සුවහසක් පාඨක පිරිස වැලඳගත්තේ හෘදයාංගම අයුරින්. පාඨකයන් ලද ඒ නවමු අත්දැකීම




කොතෙක් ද? යන්න එදවස දෙසතිය වෙත ලැබූ ප්‍රතිචාරවලින් පිළිබිඹු වුණා.

රාජ්‍ය ආයතනයකින් නිකුත් කරන සඟරාවක් නිසා රජයේ සංවර්ධන තොරතුරු අතිශයෝක්තියෙන් වනන හොරණෑවක් යැයි ජනතාව මුලින් උපකල්පනය කළත් මෙහි හැඩරුව සහ අන්තර්ගතයෙන් ඒ තර්කය සුනු විසුනු වුණා. කාලීන ප්‍රවෘත්ති සඟරාවක සමබර පුවත් මවන ආකෘතිය මේ යැයි ජනතාවට ඒත්තු යන්න කලාප දෙක තුනකට වඩා වැය වුණේ නැහැ. ලිපිවල අන්තර්ගතය, කවරයේ කතාවෙන් සහ ලිපි සිරස්තලවලින් මින් පෙර මතු නොවූ නැවුම් බව, ඡායාරූප කැප්ෂන්වලට යෙදූ අමුතු යෙදුම් මෙන් ම දෙසතිය වෙනුවෙන් ම හඳුන්වාදුන් රචනා ශෛලිය ඇති කළ අමුත්ත පාඨක පිරිස ඇදබැඳ ගැනීමට සමත් වුණා. දේශපාලනය අමුවෙන් කතා නොකර ඒවාට රසකාරක එකතුකර සමාජීය, සංස්කෘතික, විශ්වීය දැනුම සරල ව ගැඹුරින් කතා කරන හරවත් පුවත් මවන ජනප්‍රිය සඟරාවක් බවට දෙසතිය පත්වීමට වැඩි කලක් ගත වුණේ නැහැ. ලොව පුරා විදෙස් පුවත් ඩැහැගෙන ඒවා සිංහල පාඨකයාට සමීප කරවීමට සරිලන දැනුමෙන් සපිරි ලේඛක බළඇණියක් ගොඩනැඟීමට දෙසතියේ උන්නතිය වෙනුවෙන් ඇප කැප වූ ඩී.බී. වර්ණසිරිගේ උත්සාහයේ ප්‍රතිඵල වටෙන් ගොඩින් ඉස්මතු වුණා. දක්ෂයන් පසුපස හඹාගොස් ඔවුන් දෙසතියට සම්බන්ධ කරවීමෙන් සඟරාවේ අගය ඉහළ තලයකට ගෙන යාමට තිබූ අපේක්ෂාවට ආයතනයෙන් ලැබුණේ මහගු උත්තේජනයක්. සිරිල් බී. පෙරේරා, ගාමිණී විජේතුංග, වින්සන්ට් පෙරියප්පෙරුම, කැමිලස් පෙරේරා වැනි මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබලයන් මෙයට එක් වූ අතර විශේෂාංග ලිපි සඳහා එවක පුවත්පත් ලෝකයේ සැරිසැරූ විද්වත් ලේඛක පිරිසක් දෙසතිය හා යාවජීව ඇසුරක් ඇතිවීම දෙසතිය සශ්‍රීක වීමට ඉවහල් වූ තවත් කරුණක්. සඟරාව එසේ පෝෂණ ගුණයෙන් ඉහළයත් ම එහි රසය, සාරය උරා බීමට රුචියක් ඇති

> මුල් කලාපවල සිට ම විදෙස් පුවත් සඳහා දෙසතියේ විශේෂ ඉඩක් වෙන් වුණා. සමාජයේ එදිනෙදා කතිකාවක යෙදෙන කාලීන මාතෘකාවක් සැමවිට ම කවරයේ කතාවට යොදා ගැනීම පාඨක අවධානය දිනාගැනීමට හේතුවක්. අන්තර්ජාල පහසුකම් නොතිබූ එදවස විදෙස් පුවත්පත්වලින්, විදෙස් සඟරාවලින් හා විදෙස් ප්‍රවෘත්ති සේවාවලින් උකහාගන්නා පුවත් සමබර හා නිවැරදි ලෙසට සිංහල පාඨකයන් අභිමුවට ගෙන ආවේ කාලීන පුවත් සඟරාවක අඩංගු විය යුතු පරිපූර්ණත්වය ප්‍රකට කරමින්. ඒ වෙනුවෙන් බාහිර ලේඛකයන්ගේ ලිපි පවා සඟරාවේ පළ කිරීමට මැළි වුණේ නැහැ. ආරම්භයේ සිට ම අංකුර ලේඛකයන් දෙසතියට එවූ ලිපි ඒවායේ ගුණාත්මක හරය සලකා සඟරාවේ පළ කිරීමට ඉඩ හසර ලබා දුන්නා.

පාඨක පිරිස් දෙසතිය හා සමීප වූයේ වයස් භේදයකින් තොර ව.

සඟරා පරිහරණයක් අවම වූ එදවස රාජ්‍ය ආයතනයකින් එළිදැක් වූ මෙවැනි සඟරාවකින් ගුවන්විදුලියට, පුවත්පතට වඩා වැඩි යමක් උකහාගත හැකි බවයි පාඨකයාගේ අදහස වුණේ. කලාවේත් සාහිත්‍යයේත් ස්වර්ණමය යුගයක් අතපතගාමින් දැනුම් පිපාසාවෙන් සිටි විවිධ වයස් මට්ටම්වලට අයත් පිරිස්හට එකවර සක්වළ අතැඹුලක් සේ දෝතට පාවී එන සාර සංග්‍රහයේ ගුණ සුවඳ විඳගත්තේ මතු මතුත් දෙසතියේ ඉල්ලුමට මඟ පාදමින්.

පාසල් පරපුර දෙසතියට ආසක්ත වීමට කරුණු කිහිපයක් බලපෑවා. මේ පිළිබඳ ව ලද පුළුල් ප්‍රචාරය, පාසල් පුස්තකාලයට මාසයකට සඟරා දෙකක් ලැබීම, එහි රචනා විලාසයෙහි තිබූ අපූර්වත්වය සහ නැවුම් බව සේ ම විෂයානුබද්ධ දැනුම ඔප්නැංවීමට යෙදූ ලිපිවල හරය එයට ඉවහල් වූ බවට සැකයක් නැහැ. 'කැලණි ගඟේ මාළු තොගයක් එකවර මිය යාම' එදින මාධ්‍යයෙන් හෙළි කළ එක් පුවතක්. මාළු මිය යාම සාමාන්‍ය පෙළ විෂය නිර්දේශයට අයත් නොවුව ද එයට බලපෑ විද්‍යාත්මක හේතු එම වසරේ සාමාන්‍ය පෙළ විභාගයෙන් විමසා තිබුණා. කාලීන පරිසර සිදුවීම් විද්‍යාත්මක ව පහදන ලිපියක් ලෙසින් එම විෂයය අලළා සැකසූ ලිපියක් දෙසතිය සඟරාවේ පළ වුණේ විභාගයට මාස දෙක තුනකට පෙරාතුව. විභාගයෙන් අනතුරු ව ගුරු, සිසු, දෙමාපිය, විදුහල්පතිවරුන්ගේ පවා ඒ දැනුවත් කිරීම වෙනුවෙන් පැසසුම් ගලා ආවේ පුවතේ විශේෂත්වය නිසි ලෙස සිසු මනසට ප්‍රවේශ කිරීමට මඟ පෑදීම හේතුවෙන්. පාසල් ප්‍රජාව අතර දෙසතියේ අගය ශීඝ්‍රයෙන් විකසිතවීමට බලපෑ එක් නිදසුනක් ඒ.

රාජ්‍ය ආයතනවල සඟරා සංස්කෘතියක් බිහි වුණේ දෙසතිය බිහි වීමෙන් අනතුරු ව. නිවාස සහ ඉදිකිරීමේ අමාත්‍යාංශයෙන් **පෙරමඟ** සඟරාව, මහවැලි අමාත්‍යාංශයෙන් **ඉසුර** සඟරාව සහ ලංකා බැංකුව මුල් වී බිහි කළ **කල්පනා** සඟරාව ඒවා අතර මුලින් ම කියැවෙන නම්. මාසික ව එළිදැක්වූ එම සඟරා සමඟ මසකට දෙකක් නිකුත් වූ **දෙසතියට** ප්‍රමුඛත්වයක් ලබමින් පාඨක පිරිස අතර වැජඹුණේ සඟරා ඉතිහාසය නව මානයකට ගෙනයමින්.


1980 දශකයේ මුල්භාගයේදී සඟරාව ඕෆ්සෙට් යුගයට එළැඹීමත් 90 දශකයේ මැදභාගයේ සිට ඇති වූ ඩිජිටල් පරිවර්තනයත් දෙසතියේ බාහිර සහ අභ්‍යන්තර රූ රටාව තවත් ආකර්ෂණීය ලෙස දිස් වුණා. මේ යුගයේ ම දේශපාලන පරිසර සමාජ විද්‍යාත්මක තේමා අරමුණු කරගත් සඟරා, පුවත්පත් සහ පුවත් අතිරේක බහුල වශයෙන් නිකුත් වුණේ ඉහළ මුද්‍රණ තාක්ෂණයේ උපරිම ඵල නෙළා ගනිමින්. දෙසතිය ඉදිරියට ඇදුණේ මෙවැනි පරිවාර සඟරා රැසක් සමඟ. එවිටත් දෙසතිය පුළුල් ලෙස පාඨකයා හා බද්ධ වී අවසන්.


මුල් කලාපවල සිට ම විදෙස් පුවත් සඳහා දෙසතියේ විශේෂ ඉඩක් වෙන් වුණා. සමාජයේ එදිනෙදා කථිකාවක යෙදෙන කාලීන මාතෘකාවක් සැමවිට ම කවරයේ කතාවට යොදා ගැනීම පාඨක අවධානය දිනාගැනීමට හේතුවක්. අන්තර්ජාල පහසුකම් නොතිබූ එදවස විදෙස් පුවත්පත්වලින්, විදෙස් සඟරාවලින් හා විදෙස් ප්‍රවෘත්ති සේවාවලින් උකහාගන්නා පුවත් සමබර හා නිවැරදි ලෙසට සිංහල පාඨකයන් අභිමුවට ගෙන ආවේ කාලීන පුවත් සඟරාවක අඩංගු විය යුතු පරිපූර්ණත්වය ප්‍රකට කරමින්. ඒ වෙනුවෙන් බාහිර ලේඛකයන්ගේ ලිපි පවා සඟරාවේ පළ කිරීමට මැළි වුණේ නැහැ. ආරම්භයේ සිට ම අංකුර ලේඛකයන් දෙසතියට එවූ ලිපි ඒවායේ ගුණාත්මක හරය සලකා සඟරාවේ පළ කිරීමට ඉඩ හසර ලබා දුන්නා. අද දවසේ ප්‍රසිද්ධ ලේඛක ලේඛිකාවන් පමණක් නොව ආචාර්ය මහාචාර්යවරු, ප්‍රවීණ විද්වත් පිරිස් පවා එදවස දෙසතියේ පිටුවකට දෙකකට හිමිකම් පෑ අය.

රාජ්‍ය සඟරාවක රජයේ සංවර්ධන පුවත් හා ක්‍රියාකාරකම් පළ කිරීම සාමාන්‍ය දෙයක්. එම විෂයට අදාළ සංවාද පළ කිරීමේදී විකල්ප අදහස් එහි ම පළ කිරීමේ 'දෙසතිය සාම්ප්‍රදාය' සියලු සංස්කාරකවරුන් රැකගත්තේ ප්‍රශස්ත අන්දමින්. විමසුම් සහගත ව ඉටු කළ ඒ ක්‍රියාකාරකම නිසා දේශපාලන අධිකාරියේ අනවශ්‍ය ඇඟිලිගැසීම් නිශේධනය කිරීමට තරම් ශක්තියක් දෙසතියට තිබුණා.

බොහෝ රටවල බහුතරයකගේ අතැඟිලි අතරට අද සිර වී ඇත්තේ සුහුරු දුරකතන. මේ ප්‍රවණතාව වර්ධනය වුණේ දශක දෙක තුනක පටන්. නැවතත් බටහිර ජනයා මේ ව්‍යසනයෙන් ක්‍රමික ව මිදෙමින් පවතින බව වාර්තා වෙනවා. පොතක්, පත්තරයක් අතට ගෙන එහි නැවුම් සුවඳ විඳ ගනිමින් ආස්වාදනය කරන දිගුකාලීන හුරුවයි නැවතත් මතුවෙමින් පවතින්නේ. වසරකට ප්‍රකාශයට පත්වෙන සහ විකිණෙන අතිදැවැන්ත පොත් සංඛ්‍යාවෙන් කියැවෙන්නේ මුද්‍රණ අනාගතය අසුබ නොවන බව. සඟරාව තැපෑලෙන් ගෙන්වා ගැනීමට අදටත් ලැබෙන අයැදුම්පත් ගණනින් හැඟවෙන්නේ එවැනි අලුත් පාඨක සංඛ්‍යාවක් තවමත් දෙසතිය කෙරෙහි තබා ඇති විශ්වාසයේ තරම. ඩිජිටල් මාධ්‍යයට දෙසතිය යොමු වී තිබුණත් තවමත් දෙසතිය මුද්‍රණයෙන් එළිදැක්වීම අඛණ්ඩ ව සිදුවන්නේ ඒ නිසා.

කාලයක් තිස්සේ දෙසතිය වටා පරිවාර සඟරා කොතෙක් තිබුණ ද අද වන විට ඒ සියල්ල අතීතයට එක් වී අවසන්. පැමිණි සියලු අභියෝග බිඳ දමමින් දැනටමත් දීර්ඝකාලීන පුවත් සඟරා වාර්තාවට හිමිකම් කියන දෙසතිය නුදුරේදී ම සිය අඩ සියවස සපුරනු ඇති. එය මෙලක පුවත් සඟරා ඉතිහාසයේ රන් සලකුණක් ලෙස සටහන් වීම කිසිවෙකුටත් වැළැක්විය නොහැකි වනු ඇති.







කියවීම යම් පමණකට සමාජයෙන් බැහැර වීම සහ පොදුවේ සියලු කර්මාන්තවලට සිදු වූ අවගමනය දෙසතියටත් පොදු වුණා. කොවිඩ් 19 වසංගතයට හා වෙනත් රජයේ ආර්ථික අර්බුදවලට ගොදුරු වීම හමුවේ නොවැළැක්විය හැකි ලෙසින් සඟරාව ද යම් පසුබෑමකට ලක්වුණා. එහෙත් සිය අනන්‍යතාව රැක ගනිමින් දෙසතිය ඉදිරියට ඇදුණේ පැමිණි අභියෝග ජය ගනිමින්.

රජය යටතේ පවතින සඟරාවක් මෙතරම් දුරක් පැමිණීම සාඩම්බරයට කරුණක්. පැවති සියලු ආණ්ඩු දෙසතිය රැකගත්තේ එහි වටිනාකම අත්දුටු බැවින්. අද දෙසතිය 48 වැනි විය පසු කරන්නේ යම් අභිමානයකින් යුතු ව. නමුත් දෙසතිය ද මරණ මංචකයට ආසන්න වූ අවස්ථා නැතුවා නොවෙයි. ඒවාට මුහුණ දී සඟරාව නොනැවතී පවත්වාගෙන යාමට ඇප කැප වූ අධ්‍යක්ෂවරුන් අතර ආරිය රුබසිංහගේ සහ මහාචාර්ය ආරියරත්න ඇතුගලගේ නම් අමතක කරන්නට බැහැ. එලෙසින් ම වසන්තප්‍රිය රාමනායක, සුමිත් මායාදුන්නේ යන සංස්කාරකවරුන්ගෙන් ඉටු වූ ප්‍රශස්ත කැපවීම නොවන්නට අද අපට කතා කරන්නට දෙසතියක් ඉතුරුවන්නේ නැහැ.

කාලයක් තිස්සේ දෙසතිය වටා පරිවාර සඟරා කොතෙක් තිබුණ ද අද වන විට ඒ සියල්ල අතීතයට එක් වී අවසන්. පැමිණි සියලු අභියෝග බිඳ දමමින් දැනටමත් දීර්ඝකාලීන පුවත් සඟරා වාර්තාවට හිමිකම් කියන **දෙසතිය** නුදුරේදී ම සිය අඩ සියවස සපුරනු ඇති. එය මෙලක පුවත් සඟරා ඉතිහාසයේ රන් සලකුණක් ලෙස සටහන් වීම කිසිවෙකුටත් වැළැක්විය නොහැකි වනු ඇති.



දේශ චිත්ති

# හොයියා හෝ්යියෝ

**රංගිකා අබේසේකර**

මා දැල් ධීවර කර්මාන්තය සඳහා ට්‍රැක්ටර් රථ සහ වින්ච් යන්ත්‍ර භාවිත කිරීමේ ගැටලු සම්බන්ධයෙන් ගෙවුණු සමයේ සංවාද විසංවාද මතු වුණා. ඒ, මාදැල් ධීවර කර්මාන්තයේ නිරත එවැනි පිරිස් සහ රාජ්‍ය ආයතන හා පරිසරය සුරකින කණ්ඩායම් අතර එකිනෙකට ප්‍රතිවිරෝධී ව අදහස් හා මත පළ වීමෙන්. එහිදී ජනාධිපතිවරයාගේ මැදිහත්වීමෙන් ආයතනික හා විද්වත් අදහස් විමසා එම ගැටලු සඳහා සාධාරණ හා තිරසර විසඳුම් ලබා දීමට රජය එකඟ වීමත් සමඟ එම සංවාද මඳකට නතර වී තිබෙනවා.

විවිධ රටවල ධීවර කර්මාන්තය ක්‍රියාත්මක කරන්නේ ඒ ඒ රටවලට අවේණික ආකාරයට. මුහුදු පතුලේ ඇඳගෙන යන දැල් (Bottom Trawling) භාවිත කරමින් සිදු කරන ධීවර කර්මාන්තය මෙරට තහනම් කර තිබෙනවා. එවැනි ක්‍රම නෝර්වේ, ස්වීඩනය, ෆින්ලන්තය වැනි ජනගහනය අඩු රටවල ක්‍රියාත්මකයි. එම රටවල විශාල මුහුදු තීරයක් පැවතීමත් ජනගහනය අවම වීමත් යාත්‍රා සංඛ්‍යාව සීමිත වීමත් ඊට හේතුවක්. එක් එක් රටවල පන්න ක්‍රම වෙනස්. එහෙත් මෙරට භූගෝලීය සීමාව වෙරළ ආසන්නයේ සිට ඉතා පහසුවෙන් ම ගැඹුරු මුහුද වෙත ගමන් කිරීමේ ස්වභාවයක් තිබෙන නිසා මත්ස්‍ය සම්පත බෝවන ස්ථාන සීමා සහිත වෙනවා. ඒ නිසා මෙරට ධීවර කළමනාකරණ ක්‍රම, ධීවර පන්න ක්‍රම සැකසී ඇත්තේ ශ්‍රී ලංකාවට ආවේණික ආකාරයට.

සාම්ප්‍රදායික මා දැල් කර්මාන්තය යාන්ත්‍රීකරණය වීමෙන් විවිධ අර්බුද පැන නැගී තිබෙනවා. සාම්ප්‍රදායික

එක් එක් රටවල පන්න ක්‍රම වෙනස්. එහෙත් මෙරට භූගෝලීය සීමාව වෙරළ ආසන්නයේ සිට ඉතා පහසුවෙන් ම ගැඹුරු මුහුද වෙත ගමන් කිරීමේ ස්වභාවයක් තිබෙන නිසා මත්ස්‍ය සම්පත බෝවන ස්ථාන සීමා සහිත වෙනවා. ඒ නිසා මෙරට ධීවර කළමනාකරණ ක්‍රම, ධීවර පන්න ක්‍රම සැකසී ඇත්තේ ශ්‍රී ලංකාවට ආවේණික ආකාරයට.

ක්‍රමයේදී වෙරළ කලාපයේ සිට මා දැලක් ඇදීමේදී සිදුවන්නේ මිනිස් ශ්‍රමයෙන් (මිනිසුන් 30ක් පමණ) වෙරළ කලාපයේ ස්ථාන දෙකක සිට මා දැල ගොඩට ගෙන ඒම. එහෙත් යන්ත්‍ර භාවිත කිරීම නිසා වෙරළ කලාපයේ වැලිවල සැකැස්ම සම්පූර්ණයෙන් වෙනස් වීමට ලක්වන බව ඒ පිළිබඳ සිදු කර ඇති නිරීක්ෂණ හා අධ්‍යයන අනුව පෙනී යන බව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර අවධාරණය කරන්නක්. මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කපිල මහේෂ් රාජපක්ෂ සඳහන් කරන්නේ සාගර පරිසර පද්ධති සහ වෙරළාරක්ෂිත පරිසර පද්ධතිවල විද්‍යාත්මක පැවැත්ම මේ හේතුවෙන් තර්ජනයට ලක් ව ඇති බව. බොටම් ට්‍රෝලිං වැනි තහනම් පන්න ක්‍රමය වයඹ දිග වෙරළ කලාපයේ ක්‍රියාත්මක වන නිසා එයින් වෙරළාශ්‍රිත පරිසර පද්ධතියේ වඩාත් සක්‍රිය කලාපය විනාශ වී ඇති බව ඔහු එහිදී පෙන්වා දෙනවා.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති සමන්ත ගුණසේකර පවසන්නේ යාන්ත්‍රික මාදැල් කර්මාන්තය හේතුවෙන් සමුද්‍ර පරිසර පද්ධතියට ප්ලාස්ටික් ද්‍රව්‍ය ඇතුළු ව අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා අතිශයින් දූෂණය වී ඇති බව. අදහස් දක්වන ඔහු; "විශේෂයෙන් නයිලෝන් දැල්, කඹ හා ඒවායේ කොටස් විශාල වශයෙන් වෙරළේ දැක ගැනීමට පුළුවන්. ඇතැම් ප්‍රදේශවල මහා පරිමාණ යාන්ත්‍රික මා දැල් කර්මාන්තය සිදු කරන්නේ පිට පළාත්වලින් පැමිණි පිරිස්. මේ නිසා පාරම්පරික මා දැල් ධීවරයන් මේ ක්‍රියාවලියට විරුද්ධයි. ඇතැම් වෙරළ කලාපවල කිලෝමීටර් ගණනක් වෙරළට සමාන්තර ව ගැඹුරු කානු සෑදී තිබීම සමුද්‍රීය වෙරළේ පැවැත්මට විශාල හානියක්. විශේෂයෙන් නොගැඹුරු මුහුද කාබන් තිර කිරීමට, ආහාර දාමවලට, ආහාර චක්‍රවලට මූලස්ථානය වෙනවා".

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (සමුද්‍ර) රේඛා රාජසිංහ; "මා දැල් කර්මාන්තය සඳහා වින්ච් යන්ත්‍ර භාවිත කිරීම නිසා සමුද්‍රීය ජීවී විශේෂවලට, විශේෂයෙන් මුහුදු උරග

විශේෂයක් වන කැස්බෑවන්ට ඔවුන්ගේ නිජබිම්වලට හා ජීවී ක්‍රියාකාරකම්වලට බාධා සිදුවෙනවා. පරිසර පද්ධතිවලටත් සිදු වන්නේ විනාශයක්. විශේෂයෙන් වෘක්ෂලතා ආඥා පනතින් ආරක්ෂිත විශේෂ ලෙස ප්‍රකාශයට පත්කර ඇති දෘඪ කොරල්, මෘදු කොරල් ඇතුළු මුහුදු තෘණ විනාශ වෙනවා. ට්‍රැක්ටර් හා වින්ච් භාවිතයෙන් මා දැල් අදින විට විශාල භූමි ප්‍රමාණයකට දැල එළන නිසා එම අවස්ථාවලදී දැල සකසා ගැනීමට බර ද්‍රව්‍ය භාවිත කරනවා. මෙවැනි ක්‍රියා සඳහා ධීවරයන් පෙලඹීමෙන් ධීවර ආම්පන්න ක්‍රමය සාම්ප්‍රදායික තත්ත්වයෙන් බැහැරට ගමන් කර තිබෙනවා”.

මේ නිසා විශේෂයෙන් ඒ ආශ්‍රිත නීති රාමුවට අදාළ ව මත්ස්‍ය සම්පත නිවැරදි ව කළමනාකරණයට හා ඒ ආශ්‍රිත පරිසර පද්ධතිය පිළිබඳ සැලකිලිමත් වීම මෙහිදී වඩා වැදගත්. මෙරට ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා නීති රීති, රෙගුලාසි සහ නියෝග මාලාවක් ක්‍රියාත්මක කරන්නේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව. නෛතික පසුබිම විමසීමේදී ධීවර කර්මාන්තය කළමනාකරණය සඳහා 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතත් ඒ යටතේ රෙගුලාසි 100කට අධික සංඛ්‍යාවකුත් සකස් කර තිබෙනවා. ඊට අදළ නියෝග මාලාවක් ද තිබෙන්නේ 1984 නොවැම්බර් 06 දින සිට ක්‍රියාත්මක. ධීවර සම්පත කළමනාකරණයට ඇතැම් ජාත්‍යන්තර නීති රීති ක්‍රියාත්මක කිරීමට ද ශ්‍රී ලංකාව බැඳී සිටිනවා.

1980 අංක 47 දරන ජාතික පරිසර පනත ස්ථාපිත කිරීමේදී එහි 4 වැනි පරිච්ඡේදයේ 17 හා 18 කාණ්ඩය යටතේ සාගර සම්පත්, වෙරළ ආශ්‍රිත සම්පත් ආරක්ෂා කිරීම වෙනුවෙන් ප්‍රතිපාදන තිබෙනවා. 1981 අංක 59 දරන සමුද්‍රීය දූෂණ වැළැක්වීමේ පනතේ 27 වැනි වගන්තියට අනුව සමුද්‍රීය පරිසරයට යම් ද්‍රව්‍යයක් බැහැර කිරීම, පරිසරය විනාශ කිරීම, සමුද්‍රීය පරිසර පද්ධතිය අවුල් කිරීම සහ ඒවාට හානි කිරීම දඬුවම් ලැබිය හැකි වරද ලෙස දක්වා තිබෙනවා. 1937 අංක 02 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වන ජීවී රක්ෂිත

> මෘදු කොරල් ඇතුළු මුහුදු තෘණ විනාශ වෙනවා. ට්‍රැක්ටර් හා වින්ච් භාවිතයෙන් මා දැල් අදින විට විශාල භූමි ප්‍රමාණයකට දැල එළන නිසා එම අවස්ථාවලදී දැල සකසා ගැනීමට බර ද්‍රව්‍ය භාවිත කරනවා. මෙවැනි ක්‍රියා සඳහා ධීවරයන් පෙලඹීමෙන් ධීවර ආම්පන්න ක්‍රමය සාම්ප්‍රදායික තත්ත්වයෙන් බැහැරට ගමන් කර තිබෙනවා

111කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රකාශයට පත්කර තිබෙනවා. ඒවායින් 28ක් වෙරළ කලාප සහ සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ ලෙසයි හඳුනාගෙන තිබෙන්නේ.

මෙරට ධීවර කර්මාන්තය කළමනාකරණයට ප්‍රදේශ ගැසට් කර තිබෙනවා. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත පවසන්නේ 1.5kmක වෙරළ සීමාවේ පමණක් දැල එළීම සඳහා ධීවරයන්ට අවසර ලබා දී තිබෙන බවත් ඉන් ඔබ්බට නොගැඹුරු මුහුද වෙන්කර තිබෙන්නේ සුළු පන්න ධීවරයන්ට රැකියාව සඳහා බවත්. ට්‍රැක්ටර් රථ සහ වින්ච් යන්ත්‍ර භාවිතයෙන් 1.5kmට වඩා වෙරළ සීමාවක් මා දැල් වට කිරීමත් දෛනික ව 3-5 අතර වාර ගණනක් දැල් වට කිරීමත් උදේ සිට රාත්‍රිය තෙක් ඇතැම් දැල් වට කර තැබීමත් හේතුවෙන් පරිසර පද්ධතිය යථා තත්ත්වයට පත්වීමට අවශ්‍ය ඉඩකඩ අවම වන බව.

වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වයේ ඇති සමස්ත මාදැල් සංඛ්‍යාව 827ක්. මේ අතරින් ට්‍රැක්ටර් රථ සහ වින්ච් ආධාරයෙන් ක්‍රියාත්මක වන මා දැල් ගණන 300කට වඩා අඩු බවයි අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත සඳහන් කළේ. අදහස් දක්වන ඔහු; “මා දැල් ඇදීම සඳහා වින්ච් යන්ත්‍ර භාවිත කිරීමට තනි තනි වශයෙන් කිසිදු මා දැල් හිමියෙකුට නීත්‍යානුකූල අවසරයක් ලබා දී නැහැ. එහෙත් එක්තරා අවස්ථාවක ධීවරයන් 183 දෙනෙකුගේ නාම ලේඛනයකට පර්යේෂණ මට්ටමේ මාදැල් සඳහා ට්‍රැක්ටර් රථ සහ වින්ච් භාවිත කිරීමට අවසර ලබා දී තිබෙනවා. ඒ අවසරයයි දිගින් දිගට ම ක්‍රියාත්මක වන්නේ. වසර ගණනාවක සිට මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී දැනුවත් කර තිබෙනවා මෙවැනි යන්ත්‍ර භාවිත නොකරන ලෙස. මේ ගැටලු සැලකිල්ලට ගෙන 2025 ජූනි මස ධීවර අමාත්‍යාංශය විසින් මා දැල් හිමියන්ගේ සංගමය ඇතුළු පාර්ශ්වකරුවන් රැසකගෙන් යුතු සාකච්ඡාවක් කළා. ඒ අනුව 2026 ජනවාරි 01 දින සිට මා දැල් ඇදීම සඳහා වින්ච් යන්ත්‍ර භාවිත නොකරන ලෙස මා දැල් හිමියන්ට දැනුම් දුන්නා”.

ඇතැම් අවස්ථාවල විද්‍යාත්මක පදනමක් රහිත ව හදිසි තීරණවලට එළඹීම හේතුවෙන් මේ කර්මාන්තය යාන්ත්‍රීකරණය කරගෙන ඇත්තේ සුළු පිරිසක්. එහෙත් අවශ්‍ය වන්නේ සාම්ප්‍රදායික මාදැල් කර්මාන්තයෙන් රැකුණු ධීවර ප්‍රජාවට ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පසුබිම සැකසීම සහ පරිසරය ආරක්ෂා කිරීමට අදාළ නෛතික පසුබිම ක්‍රියාත්මක කිරීම බවයි ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධිත නියෝජිත ආයතනයේ සභාපති ආචාර්ය සනත් හෙට්ටිආරච්චි සඳහන් කරන්නේ. ඒ, සිදුකර ඇති අධ්‍යයන මත පදනම් ව ට්‍රැක්ටර් රථ සහ වින්ච් යන්ත්‍ර භාවිතය මා දැල් ධීවර කර්මාන්තය සඳහා සුදුසු බවට නිරීක්ෂණය නොවන පසුබිමක.

මේ අනුව වෙරළ කලාපය කළමනාකරණය සහ එහි සම්පත් ආරක්ෂා කරමින් වෙරළ කලාපයට ආසන්න ව ඇති සංචාරක ධීවර කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත සඳහා අවශ්‍ය වටපිටාව සැකසීම රජයේ අරමුණක්. එම අරමුණ ඉටු වීමටනම් ස්වාභාවික සම්පත්වල අනාගතය සම්බන්ධයෙන් ගන්නා තීරණාත්මක තීන්දුවලදී කෙටිකාලීන විසඳුම් සහ ක්ෂණික ලාභ නොතකා ක්‍රියා කිරීමයි වැදගත් වන්නේ. දීර්ඝකාලීන සහ තිරසර පැවැත්මක් සහිත තීන්දු කෙරෙහි එහිදී අවධානය යොමු කිරීම එලදායී වෙනවා.

(රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවැති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරිනි)

# ත්‍යාගශීලීත්වයේ ශක්තිය

REBUILDING Sri Lanka

2025 වසරේ නොවැම්බර් මාසයේදී ඇති වූ 'දිට්වා' සුළි කුණාටුව ශ්‍රී ලංකාවට හදිසි ආපදා තත්ත්වයක් ඇති කළා. Rebuilding Sri Lanka අරමුදල මඟින් වෙනස් ම වූ වැඩසටහනක් නිර්මාණය වන්නේ දිට්වා සුළි කුණාටුව සමඟ හානියට පත් වූ ශ්‍රී ලංකාවේ ජන ජීවිතය සහ ආර්ථිකය නැවත ගොඩනැගීමේ අරමුණ ඇති ව. ශ්‍රී ලංකාවේ මෙයට පෙර ඇති වූ ආපදා තත්ත්වවලදී විවිධ විධි ක්‍රම භාවිත කර තිබුණා. එහිදී විවිධ චොදනා ද එල්ල වී තිබුණා. එම නිසා Rebuilding Sri Lanka අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන එයට වඩා වෙනස් ක්‍රමයකට සැලසුම් කළ යුතු බවට ජනාධිපතිවරයාගේ අදහස වී තිබුණා. මෙයට පෙර ක්‍රියාත්මක වූ වැඩසටහන් සඳහා එල්ල වූ ප්‍රධාන චෝදනාවක් වූයේ ඒවායේ විනිවිදභාවය ප්‍රමාණවත් නොවන බව. මේ නිසා උපරිම විනිවිදභාවයකින් යුතුවයි මෙය ක්‍රියාත්මක වන්නේ. එමෙන් ම 2026 වසර සඳහා පාර්ලිමේන්තුවේ සම්මත කරගන්නා ලද අය වැය වෙනස් කිරීමකින් තොර ව මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ද ජනාධිපතිවරයාට තිබුණා. දිට්වා සුළි කුණාටුව ඇති වන අවස්ථාව වන විට 2026 වර්ෂය සඳහා අය වැය සම්මත කරගෙනයි තිබුණේ. 2026 වර්ෂයේ අය වැය සම්පාදනය වූ පසුබිම ද සුවිශේෂයි. දැඩි ආර්ථික අර්බුදයකින් පසුව රට බංකොලොත්භාවයට පත්වීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගිතා ගිවිසුමක් ඇති කර ගැනීමටත් ඉන්පසුව ආර්ථිකයේ යම් ස්ථාවරත්වයක් ඇති කරගැනීමටත් රජයට හැකියාව ලැබුණා. 2026 වර්ෂයේ අයවැය සංවර්ධන අය වැයක් ලෙසින් ඉදිරිපත් වූයේ මෙවැනි පසුබිමක. විවිධ පාර්ශ්වවල යෝජනාවක් වූයේ 2026 අය වැය පූර්ණ සංශෝධනයකට ලක්කොට සුළි කුණාටුවෙන් ඇති වූ හානි ප්‍රතිපූර්ණය කළ යුතු බවක්. එහෙත් මේ සඳහා ජනාධිපතිවරයාගේ උපදේශය වූයේ 2026 අය වැය සංශෝධනය කිරීමකින් තොර ව ආපදාවෙන් හානි වූ ක්ෂේත්‍ර තිරසර ලෙසින් නැවත ගොඩනැගීමත්



**ජී. එම්. ආර්. ඩී. අපොන්සු**
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්,
ලේකම්
Rebuilding Sri Lanka
ජනාධිපති කාර්ය සාධක බලකාය

2026 සංවර්ධන අයවැය යෝජනා ද එයට සමගාමී ව ක්‍රියාත්මක කිරීමත් කළ යුතු බව. මේ නිසා අත්වෙන වාසිසහගත තත්ත්වය වන්නේ ආර්ථිකයේ හානි වූ ක්ෂේත්‍ර ඇතුළු ව සමස්ත ආර්ථිකය ම ඉහළ තත්ත්වයකට ළඟාවීමේ හැකියාව ලැබීම.

Rebuilding Sri Lanka වැඩසටහන සැලසුම් කිරීමේදී, වෙනත් රටවල් ආපදාවකදී මුහුණදෙන සාමාන්‍ය ක්‍රියාපටිපාටිය සහ ශ්‍රී ලංකාවේ සුවිශේෂ තත්ත්ව පිළිබඳවත් අවධානය යොමු කර තිබෙනවා. සාමාන්‍යයෙන් මෙවැනි ස්වාභාවික ආපදාවකදී ඕනෑ ම රටක ගලවා ගැනීම (Rescue), සහන ලබා දීම (Relief) සහ නැවත ගොඩනැඟීම (Reconstruction) යනුවෙන් අදියර තුනක් ක්‍රියාත්මක වෙනවා. Rebuilding Sri Lanka වැඩසටහන ද ක්‍රියාත්මක වන්නේ මේ අදියර තුන යටතේ.

ගලවා ගැනීමේ අදියරේදී රජය, පවතින යාන්ත්‍රණය යටතේ ක්ෂණික ව ක්‍රියාත්මක වෙමින් ගලවා ගැනීම් සිදු කළා. මෙහිදී පවතින යාන්ත්‍රණයට අමතර ව රජයට හැකියාව ලැබුණා ආපදාවේ බලපෑම අඩු ප්‍රදේශවල ජනතාවගෙන් ඉහළ හානියක් සිදු වූ ප්‍රදේශවලට කඩිනම් සහාය ලබා ගැනීමට. ආපදාව අවස්ථාවේ අඩු හානියක් සහිත ප්‍රදේශවල සිවිල් වැසියන් විශාල වශයෙන් සහ සමූහ වශයෙන් ගොස් ගලවා ගැනීම් ක්ෂණික ව සිදු කළා. මේ සඳහා හේතුව රජය පිළිබඳ ජනතාවගේ තිබූ විශ්වාසයත් ගලවා ගැනීම් බළමුළු ගැන්වීමට රජයට තිබූ හැකියාවත් නිසා.


සහන ලබා දීමේදී ද වෙනස් වූ වැඩපිළිවෙළක් අනුගමනය කළා. එහිදී ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සිදු කරන පරිත්‍යාග ශ්‍රී ලංකා රජය මගින් ලබා දීමේ උනන්දුවේ ඉහළ යාමක් දකින්න පුළුවන් වුණා. පෞද්ගලික ව සහන සැලසීමේ කාර්යය වැළැක්වීමට රජය පෙලඹුණේ නැහැ. කෙසේ වුවත් සහන සැලසීමේ අදියරේදී රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහන කළමනාකරණයට රජය මැදිහත් වුණා. උදාහරණ වශයෙන් සහන අවශ්‍ය ප්‍රදේශ, අවශ්‍ය සහනය හෝ පරිත්‍යාග, ආපදාව නිසා හානි සිදු වූ මාර්ග පිළිබඳ තොරතුරු ආදිය රජය කඩිනම් ව සැපයුවා. විදේශීය ආධාර සහ පරිත්‍යාග ගෙන්වා ගැනීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ආධාර කිරීමට බලාපොරොත්තු වන රටවල් පූර්වයෙන් දැනුවත් කර තිබුණා. රේගුවෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී ඒවා කඩිනමින් සිදු කර ගැනීමට මාර්ගෝපදේශ නිකුත් කර තිබෙනවා. එය තවමත් වලංගුයි. රජය සිදු කළ මේ නිසි කළමනාකරණය නිසා රාජ්‍ය සහන සැලසීම්වලට අමතර ව පෞද්ගලික අංශයේ සහ විදේශීය අංශයේ ආධාර පරිත්‍යාග අදාළ පාර්ශව වෙත ගලා යාමට අවශ්‍ය තොරතුරු පරිත්‍යාගශීලීන්ට ලබා ගැනීමටත් ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු රාජ්‍ය යාන්ත්‍රණයේ සහාය ලබා ගැනීමටත් හැකි වුණා. මේ ආධාර හා පරිත්‍යාග ලබා දීමේ ක්‍රියාවලියේදී එයට අදාළ සියලු ම තොරතුරු දත්ත පද්ධතියක් වශයෙන් ගබඩා කරගනිමින් තොරතුරු ගලායාමේ ක්‍රියාවලිය යාවත්කාලීන වීම නිසා කඩිනම් සහන සැලසීමේදී සාමාන්‍යයෙන් සිදුවන අපතේ යාම සහ නාස්තිය අවම කරගැනීමටත් එය විනිවිදභාවයක් සහිත ව සිදු කිරීමටත් රජයට හැකියාව ලැබුණා.

තුන් වැනි අදියර ලෙස නැවත ගොඩනැගීම ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එම අදියර මෙතෙක් ක්‍රියාත්මක වූ තත්ත්වයට වඩා ගුණාත්මක බවින් සහ ඉහළ විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහායි Rebuilding Sri Lanka අරමුදල බිහිවන්නේ. ආපදාව නිසා හානියට පත් වූ ක්ෂේත්‍ර පැවති තත්ත්වයට වඩා ගුණාත්මක බවින් සහ ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් සහිත ව ගොඩනැඟීමයි මෙහි ප්‍රධාන

අරමුණ. මෙහිදී විවිධ අමාත්‍යාංශවලට අයත් ක්ෂේත්‍රවල සිදු වූ හානි සහ ඒ අනුව එම ක්ෂේත්‍ර පැවති තත්ත්වයට වඩා ඉහළ ගුණාත්මකභාවයකින් යුතු ව නැවත ගොඩනැඟීම සඳහා විවිධ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක වීමට නියමිත ව තිබෙනවා. ඒ, ප්‍රධාන ක්ෂේත්‍ර 08ක මෙවැනි ව්‍යාපෘති 198ක්. කිසියම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට මේ ක්ෂේත්‍රවල ස්ව කැමැත්ත අනුව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීමේ අවශ්‍යතාවක් තිබෙනවානම් ඒ සඳහා ඍජු ව ම දායක විය හැකියි. ඒ අනුව ඉදිරියේදී මේ ව්‍යාපෘති සංඛ්‍යාව තවදුරටත් ඉහළ යනු ඇති.

දිට්වා සුළි කුණාටුව නිසා සිදු වූ හානිය ඇස්තමේන්තු කිරීමේදී ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල ව එය සිදු කිරීම වැදගත්. එහිදී ශ්‍රී ලංකාව කළ ඉල්ලීම අනුව ලෝක බැංකුව සිදු කළ කඩිනම් හානි ඇස්තමේන්තුව ඇමරිකානු ඩොලර් බිලියන 4.1ක් පමණ වෙනවා. එය ශ්‍රී ලංකා මුදලින් රුපියල් බිලියන 1200ක් පමණ. 2026 වර්ෂයේ අය වැයෙහි සංවර්ධන කටයුතු සඳහා (ප්‍රාග්ධන වියදම්) වෙන්කරන ලද මුදල රුපියල් බිලියන 1380ක්. එයින් අපට අවබෝධ වනවා වසරකදී සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද මුදලට බොහෝ සෙයින් සමාන හානියක් ආපදා තත්ත්වය නිසා සිදු ව ඇති බව. මේ හානි ඇස්තමේන්තුවේ ප්‍රවාහන පද්ධතිය ඇතුළු යටිතල පහසුකම්වලට සිදු වූ හානි, පාසල් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ හානි, නිවාස, වගාබිම්, සත්ත්ව පාලනය, කර්මාන්ත ආදි ක්ෂේත්‍ර ගණනාවකට සිදු වූ හානි ඇතුළත්. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් 'පශ්චාත් ආපදා තක්සේරුකරණයක්' (Post Disaster Need Assessment) විවිධ ජාත්‍යන්තර සංවිධානවල තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් සිදු කරමින් සිටිනවා. මේ ඇස්තමේන්තු දෙක අතර වෙනස්කම් ඇතිවිය හැකියි. එය ස්වාභාවික තත්ත්වයක්. ගණනය කිරීමේ අරමුණ, ගණනය කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් පැවතීම ඊට හේතු. එම වාර්තාව නුදුරු කාලයේදී ම ලැබේවි. මේ තක්සේරුව සිදු කරමින් පවතින අතරතුරයි විවිධ අමාත්‍යාංශ විවිධ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කරමින් සිටින්නේ.

පුනරාවර්තන වියදම් කළමනාකරණයෙහි උපක්‍රමයක් ලෙස IMF සමඟ වූ එකගතාව අනුව අවම වශයෙන් 4.2%ක් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන් කිරීමට බැඳියාවක් පවතිනවා. ඒ අනුව එය දැනටමත් 2026 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙසින් වෙන් කර තිබෙනවා. ආපදා හානි ඇස්තමේන්තුව ද ඒ හා සමාන මුදලක්. ශ්‍රී ලංකාව IMF සමඟ ඇතිකරගෙන තිබෙන ගිවිසුම අනුව ඔවුන්ගේ එකඟතාව ද ලබා ගත යුතු ව තිබුණා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ම මෙවැනි ව්‍යසනයකදී මේ අනුපාතය යම් තරමකින් ඉහළ දැමීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව අමතර මුදලක් ලෙසින් රුපියල් බිලියන 350ක් ප්‍රාග්ධන වියදම් ලෙසිනුත් බිලියන 150ක් වර්තන වියදම් ලෙසිනුත් වෙන් කර තිබෙනවා. ඒ සඳහා IMF එකඟතාව ද ලැබී තිබෙනවා. නිවාස වන්දි ලබා දීම ආදිය සිදුවන්නේ වෙන් කරන ලද පුනරාවර්තන වියදම්වලින්. වන්දි ලබා දීමේ වේගය රඳා පවතින්නේ පහළ ම පරිපාලන මට්ටමේ ඒ සඳහා වූ ක්‍රියාවලිය අවසානයේදී. නිවාස ඉදිකිරීම හා නැවත පදිංචි කිරීම වැනි කාරණාවලදී වැඩසටහනේ මූලික අරමුණක් වන තිරසර වූ, ඔරොත්තු දෙන නැවත ගොඩනැඟීමක් අපේක්ෂා කරනවා. එය තාක්ෂණික ක්‍රියාවලියක්. එය ක්ෂණික ව කළ හැකි හෝ කළ යුතු දෙයක් හෝ නොව නිවැරදි ව කළ යුත්තක්.




ආපදාවෙන් පසු හානි ප්‍රතිපූර්ණයේදී ක්‍රියාත්මක කරන ව්‍යාපෘති මූල්‍යනය කිරීමේ උපක්‍රම ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදෙනවා. දැනටමත් ක්‍රියාත්මක වන ව්‍යාපෘති හඳුනාගෙන ඒවායේ අරමුණ (Scope) වෙනස් කිරීමෙන් (Repurpose) එම ව්‍යාපෘති වඩාත් නම්‍යශීලී සහ ඒකාබද්ධතාවකින් යුතු ව ක්‍රියාත්මක වීමට ඉඩ දීමයි පළමු උපක්‍රමය. දෙවැන්න වන්නේ නව ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ඒවා විදේශීය ණය ආධාර මගින් මූල්‍යනය කිරීම (Reallocating). මේ සඳහා දැනටමත් විවිධ රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන ඉදිරිපත් ව තිබෙනවා. තුන් වැනි උපක්‍රමය වන්නේ පරිත්‍යාගශීලීන්ගේ ආධාර මත පදනම් ව ව්‍යාපෘති මූල්‍යනය කිරීම. මේ අනුව පශ්චාත් ආපදා කළමනාකරණයේ නැතහොත් ආපදා හානි ප්‍රතිපූර්ණයේ තුන් වැනි මූල්‍යන උපක්‍රමය Rebuilding Sri Lanka අරමුදල.

ආපදාවකදී හානි පූර්ණයේ සමස්ත ක්‍රියාවලිය ම පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රතිපූර්ණය කළ නොහැකි වුවත් ශ්‍රී ලංකාවේ දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ හානි ප්‍රතිපූර්ණය සඳහා සැලකිය යුතු මට්ටමකින් පරිත්‍යාගශීලීන් ඉදිරිපත් වෙමින් තිබෙනවා. සෑම දායකත්වයක ම පූර්ණ විනිවිදභාවය සහතික කරන, රජයේ අනුමැතියලත් සුරක්ෂිත ද්වාරයක් පවත්වාගෙන යමින්, ජාතික මට්ටමින් අනුමත කරන ලද ප්‍රමුඛතා සහන ව්‍යාපෘති සඳහා අරමුදල් රැස් කිරීමට පුරවැසියන් සහ සංවිධාන ඒකාබද්ධ කිරීමෙන් දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාව වඩාත් ශක්තිමත් තලයකට ඔසවා තැබීම සඳහා අත්‍යවශ්‍ය සේවා යළි ස්ථාපිත කරමින් ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් බිහි කිරීමයි Rebuilding Sri Lanka වැඩසටහනේ පරමාර්ථය. ඕනෑ ම පරිත්‍යාගශීලියෙකුට මේ සඳහා ඍජු ව ම දායක විය හැකියි, www.rebuldingsrilanka.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ Info@mode.gov.lk විද්‍යුත් ලිපිනයෙන් හෝ 1800 දුරකතන අංකය සමඟ හෝ සම්බන්ධ වීමෙන්.

සාකච්ඡාව හා සටහන
**දීප්ත කුමාර බටගොඩ**

# වීදුරු සිවිලිම බිඳීම සහ නිදහසේ සීමා මායිම්

අචාර්ය කෞශල්‍යා හේරත්

ජාත්‍යන්තර කාන්තා දිනය යනු හුදෙක් සුබපැතුම් පත්වලට හෝ වෙළෙඳපොළ වට්ටම්වලට හෝ සීමා වූ දිනයක් නොවෙයි. එය දශක ගණනාවක් තිස්සේ කාන්තාවන් තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කළ අරගලයේ සහ අත්පත් කරගත් ජයග්‍රහණවල සංකේතය. තවමත් විවිධ කෝණවලින් ස්ත්‍රිය පීඩාවට පත් වන ලෝකයක වුව ද කාන්තාව අධ්‍යාපන, වෘත්තීය සහ ආර්ථික ක්ෂේත්‍රවල ලබා ඇති ප්‍රගතිය අතිමහත්. එහෙත් එම ජයග්‍රහණ සැමරිය යුත්තේ එම ප්‍රගමනය සිදුවන 'රාමුව' පිළිබඳ විවේචනාත්මක අවබෝධයකින් යුතු ව.

ඒ අනුව අප ලාංකික කාන්තාව දෙස බැලිය යුත්තේ හුදු වින්දිතයෙකු ලෙස නොවෙයි. ඇය යටත්විජිතවාදය, ධනවාදී වෙළෙඳපොළ සහ පීතෘමූලිකත්වය වැනි දැවැන්ත ව්‍යුහවල පීඩනය ද දරාගෙන ඒ සෑම ව්‍යුහයක් තුළ ම සිය නිදහස සහ ජීවිකාව උදෙසා අරගල කරන 'ක්‍රියාකාරී නියෝජිතවරියක්'. පොදු ලාංකික කාන්තාවගේ අරමුණ වන්නේ මේ ව්‍යුහ පරාජය කිරීමේ න්‍යායාත්මක සටනක් නොව පවතින රාමුව ඇතුළේ හිඳිමින් තම ජීවිතය සහ පවුල රැකගැනීමේ ප්‍රායෝගික පැවැත්ම තහවුරු කර ගැනීම.

වර්තමාන ලාංකික කාන්තාව තමන් මත පැටවුණු බටහිර කේන්ද්‍රීය දියුණුවේ ආකෘති සහ වෙළෙඳපොළ අවස්ථා භාවිත කරමින් සිය නිදහස සෙවීමට උත්සාහ කරනවා. ලෝක වෙළෙඳපොළ තුළ පරිධියේ රටක සිටින ලාංකික පොදු කාන්තාවන් ඇඟලුම් කර්මාන්ත රැකියා, විදේශ ගෘහ සේවය සහ වතු කම්කරු වැනි අඩු වැටුප් සහිත රැකියාවලින් රටේ ආර්ථිකයට විදේශ විනිමය සපයන අතර රාජ්‍ය අංශයේ ද රැකියාවල බහුතරය කාන්තාවන්. පුද්ගලික අංශයේ ද රැකියාවල කාන්තාවන් නිරත වෙනවා. මේ වැඩ ලෝකයේ වීදුරු සිවිලිම් කඩාගෙන ඉහළට යෑමේ වටිනාකම ගැන ද කතාබහක් පවතිනවා.

කාන්තාවන් රැකියාවකට යන්නේ හෝ ව්‍යවසායිකාවක වන්නේ තමන්ගේ ම ආර්ථික ස්වාධීනත්වයක් ගොඩනඟා ගැනීමට. එහෙත් එම රාමුවේ ඇය සොයන 'නිදහස' ම ඇය ව තවත් පැතිවලින් හිර කරනවා. මූල්‍යමය නිදහස සොයා වෙළෙඳපොළට පිවිසෙන කාන්තාවට 'ද්විත්ව වැඩ බරක්' දැරීමට සිදුවෙන බව ස්ත්‍රීවාදීන් පෙන්වා දී ඇති කරුණක්. ඇය රැකියාවේ වැඩ කරන අතර ම නිවසේ සාම්ප්‍රදායික වගකීම්වලින් නිදහස් නැහැ. මේ අනුව ඇය නිදහස කියා වැලඳගන්නා ධනවාදී ආර්ථික අවකාශය ඇත්ත වශයෙන් ම ඇය ව තවදුරටත් වෙහෙසට පත් කරන උගුලක් බවටයි පත්වෙන්නේ. ඇය වීදුරු සිවිලිම බිඳ දැමුව ද ඒ බිඳුණු වීදුරු කැබලි මත ඇයට ඇවිදීමට සිදු වී තිබෙනවා.

මේ සමඟ ම බොහෝ රටවල තරුණියන් විවාහය හා දරුවන් බිහි කිරීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කිරීම ගැටලුවක්. පුරුෂමූලික ක්‍රමය වඩා ශක්තිමත් එහෙත් වෙළෙඳපොළ

**කාන්තාවන් රැකියාවකට යන්නේ හෝ ව්‍යවසායිකාවක වන්නේ තමන්ගේ ම ආර්ථික ස්වාධීනත්වයක් ගොඩනඟා ගැනීමට. එහෙත් එම රාමුවේ ඇය සොයන 'නිදහස' ම ඇය ව තවත් පැතිවලින් හිර කරනවා. මූල්‍යමය නිදහස සොයා වෙළෙඳපොළට පිවිසෙන කාන්තාවට 'ද්විත්ව වැඩ බරක්' දැරීමට සිදුවෙන බව ස්ත්‍රීවාදීන් පෙන්වා දී ඇති කරුණක්. ඇය රැකියාවේ වැඩ කරන අතර ම නිවසේ සාම්ප්‍රදායික වගකීම්වලින් නිදහස් නැහැ. මේ අනුව ඇය නිදහස කියා වැලඳගන්නා ධනවාදී ආර්ථික අවකාශය ඇත්ත වශයෙන් ම ඇය ව තවදුරටත් වෙහෙසට පත් කරන උගුලක් බවටයි පත්වෙන්නේ. ඇය වීදුරු සිවිලිම බිඳ දැමුව ද ඒ බිඳුණු වීදුරු කැබලි මත ඇයට ඇවිදීමට සිදු වී තිබෙනවා.**



නැගී සිටීම ද ඒ තරමට ම ඇති දකුණු කොරියාව, ජපානය සහ චීනයේ සමහර නගරවල මෙය වඩා පැහැදිලි ව දක්නට ලැබෙනවා.

යටත්විජිතකරණය විසින් අපේ දේශීය සමාජය තුළ තිබූ සාමුහික වටිනාකම් යටපත් කර, ඒ වෙනුවට තනි පුද්ගල නිදහස සහ වික්ටෝරියානු සදාචාරය ආදේශ කළා. ග්‍රාමීය ලාංකික කාන්තාව සතු ව එකිනෙකා රැකබලා ගන්නා, 'අත්තම්' වැනි සහයෝගිතා ජාල තිබුණා. එය ධනවාදී වෙළෙඳපොළට හසු නොවූ සැබෑ ප්‍රජා ශක්තියක්. අතීත ගැමි සමාජයේ ද කාන්තාවන් යම් යම් සීමා කිරීම්වලට නතුවන්නට ඇති. එහෙත් අද අප මුහුණදෙන ගැටලුව වන්නේ, එම පැරණි ප්‍රජා සහයෝගිතාව දිය වී ගොස් ඒ වෙනුවට වෙළෙඳපොළ විසින් සියල්ල 'අලෙවි කරන සේවාවක්' බවට පත් කිරීම. මූල්‍යමය දියුණුව වෙනුවෙන් වැඩකරන කාන්තාවට එදා ඇය වටා තිබූ එම මානුෂීය සහයෝගිතාව අහිමි වී තිබෙනවා. වෙළෙඳපොළ තුළ නිදහස සොයන තරමට වන්නේ ඇය හුදෙකලා වීම.

කාන්තාව අධ්‍යාපනික ව සහ ආර්ථික ව සක්‍රිය වීම නිසා සාම්ප්‍රදායික පවුල් ව්‍යුහය තුළ තිබූ බල තුලනය වෙනස් වී තිබෙනවා. මෙහිදී කාන්තාව සෘජු ව පුරුෂාධිපත්‍යයට එරෙහි ව සටන් වදින්නේ නැහැ. ඇය උත්සාහ කරන්නේ පවතින ගැටුම් මඟහරවා ගනිමින් තම ජීවිතය කළමනාකරණය කර ගැනීමට. එහෙත් මේ ක්‍රමය ඇතුළේ පිරිමියාට ද ඇත්තේ සිය අනන්‍යතාව පිළිබඳ අර්බුදයක්. අද සමාජයේ පවතින ගැටලුවක් වන්නේ ස්ත්‍රියගේ භූමිකාව වෙනස් වීමත් සමඟ පිරිමින්ට සිය භූමිකාව කුමක්දැයි අවබෝධ කරගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී තිබීම.

පිරිමියා සහ කාන්තාව යනු එකිනෙකාගේ සතුරන් නොවෙයි. මේ දෙපිරිස ම පුරුෂාධිපත්‍යයෙන්, වෙළෙඳපොළෙන් සහ යටත්විජිතකරණයෙන් පාලනය වන සහ නිර්මාණය වූ පිරිස් වේ. සැබෑ නිදහස යනු මේ ක්‍රමවලින් ඔබ්බට දැකීම.

සැබෑ විමුක්තිය ලැබෙන්නේ පුරුෂමූලික, ධනවාදී සහ බටහිර කේන්ද්‍රීය ක්‍රමය තුළ නිදහස සෙවීමේ හුදෙකලා අරගලයකින් නොවෙයි. ඒ වෙනුවට එම රාමුවෙන් ඔබ්බට ගිය අහිමි වූ සාමුහිකත්වය, එකිනෙකා රැකගැනීම සහ බෙදාහදා ගැනීම වැනි වටිනාකම් මත පදනම් වූ නව ප්‍රජාමූලික සංස්කෘතියක් ගොඩනැගීමෙන්.

කාන්තාවට අවශ්‍ය වන්නේ පිරිමියා හා තරග වදින වෘත්තීය ලෝකයක හුදෙකලා වීමට ද නැත්නම් ඇය සතු 'රැකවරණයේ ශක්තිය' පිරිමියා සහ සමස්ත සමාජය සමඟ සම ව බෙදාගන්නා ක්‍රමයක් ද යන්න අප ප්‍රශ්න කළ යුතු වෙනවා. පවතින රාමුවේ කාන්තා නිදහස යන මාතෘකාවෙන් ඔබ්බට පවතින රාමු වෙනුවට ස්ත්‍රීමූලික වටිනාකම්වලින් ගොඩනැගුණු සමාජයක් ගැන මේ කාන්තා දිනයේදී අපට සිහින දැකිය හැකියි.

එය අතීතයට ආපසු යාමක් නොව, අතීතයේ තිබූ මානුෂීය සහයෝගිතාව නූතන නිදහස සමඟ බද්ධ කළ 'නව ගම්මානයක්' නිර්මාණය කිරීමක්. සැබෑ ප්‍රගමනය යනු වෙළෙඳපොළේ සාර්ථකත්වය නොව මනුෂ්‍යත්වය සහ ප්‍රජා ආරක්ෂණය කේන්ද්‍රකරගත්, ස්ත්‍රියට ඇය ලෙස ම ගෞරවාන්විත ව ජීවත් විය හැකි සමාජ පර්යායක්. ජාත්‍යන්තර කාන්තා දිනයේදී අප මෙනෙහි කළ යුත්තේ, අප ලබාගත් බව පවසන 'නිදහස' තුළ අප කෙතරම් සිර වී ඇත් ද යන්නත් සැබෑ නිදහස ඇත්තේ අප ම ගොඩනගා ගත යුතු ප්‍රජාමූලික වටිනාකම්වල බවත්.







# පිබිදුණු වතුකරය

**ප්‍රියදර්ශන දයාරත්න**

මේ දකින්නේ දවල් හීනයක කටහඬක් බව ඔවුන් බොහෝ දෙනෙකු සිතන්නට ඇති. මඳක් සිහිය එළවාගෙන අවට බැලූ කල දැක ගන්නට හැකිවී තිබුණේ චින්නම්මා, ලෙච්චමී, කමලා, කාලිමුත්තු, කරුපයියා, රාමයියා ආදී කී නොකී බොහෝ දෙනෙකු ද ඒ හීනයක් බඳු හඬින් පිබිදවිත් ඇති බව. "ආඬවනේ මේක හීනයක් නෙමෙයි !" සියවස් දෙකකට ආසන්න කාලයක් පිපිරී, ඉරිතලා, වේදනා දුන් ඇඟිලිවලින් යුත් ගැහැනුන් පළමුවරට ප්‍රීති ප්‍රමෝදයේ කිරිබතක් පිසින්නට එළිමහනේ තැන් සෙව්වා. ලිග්ගල් තැබුණා. දර එකතු කෙරුණා. එළිමහන් ලිප් දැල්වුණා. වතුර ඇද්දා. සහල් එක් රැස් කෙරුණා. කිරිබත් පිසුණා. "වතු කම්කරු දෛනික වැටුප රුපියල් 1750/- දක්වා වැඩි කරනවා" දෝරේ ගලා ආ මිනිසුන්ගේ හා ගැහැනුන්ගේ ප්‍රීති සාගරය රළ නඟන්නට වූයේ මෙන්න මේ ප්‍රවෘත්තිය.

ජනාධිපති සහ මුදල් ඇමති අනුර කුමාර දිසානායක 2026 වසර වෙනුවෙන් අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මේ වැටුප් වැඩි කිරීම නිවේදනය කරන විට ඔවුන්ට ලැබෙමින් තිබුණේ දිනකට රුපියල් 1350/ක වැටුපක්. එයට තවත් රුපියල් 400/-ක් එකතුකර දීමට අය වැයෙන් යෝජනා කෙරුණා. ඒ, වතු හාම්පුතුන්ගෙන් රුපියල් 200/-ක් සහ රජයෙන් රුපියල් 200/-ක් වශයෙන් රුපියල් 400/-ක් සම ව බෙදීමෙන්. මේ වෙනුවෙන් මහජන ධනය රුපියල් මිලියන 5000ක් යෙදවීමට ද යෝජනා කෙරුණා. මේ භූමිය තුළ මිහිදන් කළ මළයගම් ජනතාවගේ ඇටකටු පවා අලුතින් හුස්මක් ගන්නට මේ යෝජනාව හේතු වන්නට ඇති.

මළයගම් ජනතාව අවුරුදු දෙසීයක ඉතිහාසය පුරා ම රැවටීම්වලට හසු වූ පිරිසක්. හිමාලය තරම් උස් ව ද වේදනා විඳිමින්, ගිනි උහුලමින්, සුසුම් පොදි දරා ගනිමින් ගෙවූ ජීවිතවලින් එළියට පැමිණි ඓතිහාසික නිශ්චිත කඩඉම උදා වූයේ 1943 වසරේදී. එදා පැවැති ලංකා සම සමාජ පක්ෂය ඇතුළු වමේ පක්ෂවල සහායවීමෙන් වතු කම්කරුවන්ගේ අරගලයක් දියත් කෙරුණා. මහනුවර, හේවාහැට ප්‍රදේශයේ පිහිටි 'මුල්ඔය' වතු යාය කේන්ද්‍රගත ව දියත් කෙරුණු මේ අරගලයේ මූලික ඉල්ලීම වුණේ සාධාරණ ජීවන තත්ත්වයක් ගොඩනඟා ගැනීමට ප්‍රමාණවත් වැටුපක් දිනා ගැනීම. අප්‍රමාණ පර පීඩනයකට ගොදුරු වී සිටි ජනතාව එකාවන් ව එළියට පැමිණ අරගල කළ ඓතිහාසික මොහොතයි එය. පාලකයන්ගෙන් ඊට ලැබුණේ වෙඩි උණ්ඩය. ගෝවින්දන් නමැති කම්කරු නායකයා මිය ගොස් තවත් කිහිපදෙනෙකු මෙහිදී තුවාල ලැබුවා.

මුල්ඔය වතු යාය භූමියේ ගලා ගිය ලේවලට සහ අහිමි වූ ජීවිතවලට අගයක් එකතු වී සහෝදර කම්කරු ජනතාවගේ කුලිය ශත 16කින් ඉහළ නංවා ගැනීමට මේ අරගලයේදී හැකි වුණා. ඉන්පසුව ක්‍රමයෙන් වර්ධනය වූයේ මළයගම් දෙමළ ජනතාව සියුම් ලෙස බෙදා වෙන්කර මර්දනය කිරීමේ යුගය. එක් පැත්තකින් 1947 මැතිවරණයෙන් බලය ලබාගත් එක්සත් ජාතික පක්ෂය මළයගම් දෙමළ ජනතාවගේ පුරවැසි අයිතිය අහිමි කිරීමේ අණ-පනත් සම්මත කර ගත්තා. අනෙක් පැත්තෙන් මළයගම ජනතාවගේ වෘත්තීය සමිති බලය වමේ දේශපාලනයෙන් ඉවත් කරගෙන එක්සත් ජාතික පක්ෂය සමඟ අවස්ථාවාදී ඩීල් දේශපාලනයේ යෙදෙන කණ්ඩායමකට බාර දුන්නා. ලංකා කම්කරු කොංග්‍රෙසය (CWC) සහ සෞම්‍යමූර්ති තොන්ඩමන් කරළියට එන්නේ මේ අනුව.

ඓතිහාසික මුල්ඔය සටනට මගපෙන්වීම ලබා දුන් වමේ ව්‍යාපාරයේ බලය 1947 මහා මැතිවරණයෙන් ඔප්පු වී තිබුණා. විවිධ බෙදීම් සහිත ව වුව ද වමේ මන්ත්‍රීවරු 18

දෙනෙකු එහිදී තේරී පත් ව සිටියේ ලංකා සම සමාජ පක්ෂයෙන් 10ක්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයෙන් 03ක් සහ බොල්ෂෙවික් ලෙනින් පක්ෂයෙන් 05ක් වශයෙන්. (එදා මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 95ක්.) මේ මන්ත්‍රීවරුන් පත්කර ගත් ඡන්ද අතර සැලකිය යුතු පදනමක් ව තිබුණේ මළයගම් දෙමළ ජනතාව මත. මේ ජනතාවගේ ඡන්ද අයිතිය අහිමි කිරීමට ඩී. එස්. සේනානායක ප්‍රමුඛ මෙරට ප්‍රභූ පාලකයන් ක්‍රියා කළ අතර පුරවැසි පනත ගෙනැවිත් මළයගම් දෙමළ ජනතාවගේ ප්‍රජා අයිතිය අහිමි කළා. 'රටක් නැති ජනතාව - කල්ලතෝනි' ආදී වශයෙන් හැඳින්වූයේ මේ ජනතාව.

ඉන්පසුව දිගින් දිගට ම 'මළයගම් ජනතාවගේ' හඬ යටපත් කර ප්‍රභූත්වයෙන් වැජඹීමට ඉන්දීය සම්භවයක් සහිත කල්ලියකටයි බාර කෙරුණේ. සෞම්‍ය මූර්ති තොන්ඩමන්ගෙන් පටන්ගෙන මේ දක්වා ඉදිරියට පැමිණියේ එම බල අධිකාරිත්වය. මළයගම් දෙමළ ජනතාවගේ කම්කරු 'අයිතීන් හා සටන්වල' තීරකයා වී සිටියේ තොන්ඩමන් ප්‍රභූ තන්ත්‍රය. ඔවුන් විශේෂයෙන් ම එක්සත් ජාතික පක්ෂය සමඟ දිගුකාලීන ඩීල් දේශපාලනයක නිරත වී මළයගම් ජනතාව හපයක් බවට පත් කළේ කොන්දේසි විරහිත ව. 'තොන්ඩමන් - රජුන් තනන්නා' බවට පත්වූයේ මේ ආකාරයට.

එක්සත් ජාතික පක්ෂය සහ ලංකා කම්කරු කොන්ග්‍රසය අතර ඩීල් දේශපාලනයේ තීරණාත්මක කඩඉම් කිහිපයක් තිබුණා. ඒ අතර වූ වැටුප් ප්‍රශ්නය ගත් විට 1992 වර්ෂය විශේෂිතයි. ඒ වන විට එක්සත් ජාතික පක්ෂයේ නායකයා මෙන් ම මෙරට විධායක ජනාධිපති වී සිටියේ රණසිංහ ප්‍රේමදාස. එම වර්ෂය විශේෂිත වන්නේ සිරිමා බණ්ඩාරනායක පාලන සමයේ රජයට පවරා ගත් වතු නැවත සමාගම්වලට පවරා දීමේ ක්‍රියාවලිය දියත් කිරීම නිසා. මෙහිදී රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන දෙක යටතේ තිබූ තේ සහ රබර් වතු 225ක් පෞද්ගලික අංශයේ සමාගම් 49කට දිගුකාලීන බදු පදනම යටතේ පවරා දුන්නේ තුට්ටු දෙකේ මුදලකට. මෙසේ පවරා දීමේදී ලාභය උපයමින් තිබූ වතු පෞද්ගලික සමාගම්වලට ලබා දී, පාඩු ලබමින් තිබූ වතු රජයේ තබා ගැනීම විශේෂත්වයක්. මේ තත්ත්වය යටතේ නැවත වරක් මළයගම් වතු කම්කරු ජනතාව කොම්පැනි හාම්පුතුන්ගේ වහලුන් බවට පත් කළා.

සිය¨ වරප්‍රසාද සහ කේවල් කිරීමේ බලය එක පැත්තකින් වතු සමාගම්වලටත් අනෙක් පැත්තෙන් ලංකා කම්කරු කොංග්‍රසය මතත් පවරා දුන්නා. ඒ, පඩිපාලක සභා ක්‍රමය යටතේ. වතුවල තිබූ වටිනා ශාක, ෆැක්ටරිවල තිබූ යන්ත්‍රසූත්‍ර, යකඩ ඇතුළු වටිනා සියල්ල ම ඉක්මනින් තුට්ටු දෙකට විකුණා දමා වතු කොම්පැනි අතිවිශාල ලාභයක් කෙටි කාලයකින් ඉපයුවා. කම්කරු ප්‍රජාවගේ ජීවිත දිනෙන් දින ප්‍රපාතයට හෙළුවා. නූතන වහල් සමයේ පතුළට ම හෙළුවා. මේ තත්ත්වය හමුවේ පඩිපාලක සභා අහෝසි කර වතු සමාගම් හා ලංකා කම්කරු සමාගම් මූලික වශයෙන් මැදිහත් වී 'සාමූහික ගිවිසුම්' අත්සන් කිරීම නම් ඇස්බැන්දුමකට මුල පිරුවා. මේ සාමූහික ගිවිසුම් අත්සන් කිරීම වසර දෙකක් සඳහා වලංගුයි. එනම් වසර දෙකක් යනතුරු වතු කම්කරු ජනතාවගේ කටවල් වසා, අතපය බැඳ දමා තිබුණා.



2026 වසර වෙනුවෙන් අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මේ වැටුප් වැඩි කිරීම නිවේදනය කරන විට ඔවුන්ට ලැබෙමින් තිබුණේ දිනකට රුපියල් 1350/ක වැටුපක්. එයට තවත් රුපියල් 400/-ක් එකතුකර දීමට අය වැයෙන් යෝජනා කෙරුණා. ඒ, වතු හාම්පුතුන්ගෙන් රුපියල් 200/-ක් සහ රජයෙන් රුපියල් 200/-ක් වශයෙන් රුපියල් 400/-ක් සම ව බෙදීමෙන්. මේ වෙනුවෙන් මහජන ධනය රුපියල් මිලියන 5000ක් යෙදවීමට ද යෝජනා කෙරුණා. මේ භූමිය තුළ මිහිදන් කළ මළයගම් ජනතාවගේ ඇටකටු පවා අලුතින් හුස්මක් ගන්නට මේ යෝජනාව හේතු වන්නට ඇති.

රනිල්-මෛත්‍රී හවුල් පාලනය යටතේ ද මේ වැටුප් ප්‍රශ්නයට යන්තමින් හෝ විසඳුමක් ලැබුණේ නැහැ. මේ නිසා 2018 වසරේදී පමණ වතු කම්කරු දිනෙක වැටුප රුපියල් 1000/-ක් කිරීමේ සටන් පාඨය එළියට පැමිණියා. එය ගැන හඬ නැඟුණේ ලංකා කම්කරු සංගමයේ ඩීල් දේශපාලනයට යටපත් කළ නොහැකි ප්‍රබල පසුබිමකින්. 'මළයගම් දෙමළ ජනතාව'ට අයත් නොවෙන උතුර සහ නැගෙනහිර දෙමළ ජනතාව ද වෙනත් බහු ජන සංවිධාන, සිවිල් සංවිධාන පමණක් නොව තරුණ කණ්ඩායම් ද මේ අරගලය වෙනුවෙන් පොදු ජන දායකත්වය උපරිමයෙන් ලබා දුන්නා. මන්නාරමේ සිට මාතලේ දක්වා ඓතිහාසික පා ගමනක් මෙන් ම මේ වෙනුවෙන් ගෝල්ෆේස් පිටියට රැස් වූ දස දහස ගණන් එක්දින විරෝධතාවක් ද පැවැත්වූවා. එහෙත් එහිදී දිනෙක වැටුප රුපියල් 900/-ක් දක්වා ඉහළ දැමීමට පමණයි හැකි වුණේ.

මේ ආකාරයට ජනතාව රැවටීම් හමුවේ දිනෙක වැටුප රුපියල් 1700/-ක් දක්වා සටන් පාඨය යළිත් දියත් කෙරුණා. එය අවම වශයෙන් රුපියල් 2000/-ක් විය යුතු බවට ද තවත් ඉල්ලීමක් වුණා. මේ අතර 2024 සැප්තැම්බර් මස පැවැති ජනාධිපතිවරණයෙන් ජාතික ජන බලවේග යේ නායක අනුර කුමාර දිසානායක ජයග්‍රහණය කළ පසු බොහෝ දේ වෙනස් ආකාරයෙනුයි දියත් කෙරුණේ. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තිය 'ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය' ජනතාවට දිනා දීමයි. මේ අනුව ඉල්ලීමක් හෝ නොමැති ව රජයේ සේවකයන්ගේ මූලික වැටුප වැඩි කෙරුණා. මේ වසරේ සිට මළයගම් වතු දෙමළ ජනතාවගේ ද වැටුප් වැඩි කිරීමේ යෝජනාව ක්‍රියාත්මක කර තිබෙනවා.

සමගි ජන බලවේගයේ මන්ත්‍රී රෝහිණී කවිරත්න සහ ප්‍රසාද් සිරිවර්ධන ඊට එරෙහි මුලින් ම ප්‍රහාරය දියත් කළේ මහජන මුදල් අනිසි ලෙස යොදා ගන්නා බව කියමින්. තවත් විවිධ පිරිස් තර්ක කළේ සමාගම්වල සේවකයන් වෙනුවෙන් රජයේ මුදල් මෙලෙස යෙදවිය නොහැකි බව. වතු සමාගම්වලින් ද විවිධ බාධා අවහිරතා ගෙන ඒමට මාන බැලුණා. එහෙත් මේ සියල්ල පරාජය කරමින් අවුරුදු 200ක් පුරා මේ මහ පොළොවේ වැළලී තිබූ ඇටකටු පවා සැනසුම් සුසුම් හෙළන්නට ඇති. ජීවත් ව සිටින මිනිසුන් සහ ගැහැනුන් කිරිබත් පිසුවේත් අත්පුඩි ගැසුවේත් මේ නිසා.

# ඉන්දු - යුරෝපා වෙළෙඳ හවුල්කාරිත්වය




**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

ඇමරිකාවේ නිතර අලුත්වෙන බදු තරවටු මෙන් ම ලෝකයේ නව යුද ගැටුම් මැද ඉහළ යන භූ දේශපාලනික ආතති හා ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ ලෝකයේ දෙ වැනි හා සිව් වැනි විශාලතම ආර්ථික දෙක අතර ඓතිහාසික වැදගත්කමක් සහිත නිදහස් වෙළෙඳ ගිවිසුමක් සඳහා වූ අවසන් එකඟතාව නොබෝදා ඇතිවුණා. 2026 ජනවාරි 27 දින මේ ගිවිසුම සඳහා වන එකඟතාව ප්‍රකාශයට පත්වුයේ නවදිල්ලියේ හයිද්‍රාබාද් මන්දිරයේ පැවති ඉන්දියා-යුරෝපා සංගම් සමුළුවේදී. ඒ සඳහා **Narendra Modi** අග්‍රාමාත්‍යවරයා මෙන් ම යුරෝපා කවුන්සිලයේ සභාපති **António Costa** සහ යුරෝපා සංගමයේ සභාපති **Ursula von der Leyen** එක් ව සිටියා.

‘ඉන්දීය-යුරෝපා සංගම් නිදහස් වෙළෙඳ ගිවිසුම’ ලෙස හැඳින්වෙන මෙය දශක දෙකකට ආසන්න කාලයක් පැවති සාකච්ඡාවලින් පසුව, ඉන්දියානු ජනරජය සහ යුරෝපීය සංගමය (EU) අතර අත්සන් තැබීම සඳහා අවසන් එකඟතාවකට එළඹුණු පුළුල් නිදහස් වෙළෙඳ ගිවිසුමක් (FTA). විශාලතම නිදහස් වෙළෙඳ ගිවිසුම ලෙස ලෝක ඉතිහාසයේ නව සංධිස්ථානයක් සනිටුහන් කරන්නට සමත් මේ සම්මුතිය හටගත්තේ ඉන්දියාව සහ යුරෝපා සංගමයේ රටවල් 27ක් අතර.

ගිවිසුමේ ප්‍රමුඛ අරමුණ දෙපාර්ශ්වයේ වෙළෙඳාම සහ ආයෝජන පුළුල් බදු නිදහසකට පත් කිරීම. මේ වෙළෙඳ ගිවිසුම දෙපාර්ශ්වය වෙත ම ඉහළ යන ඇමරිකා තීරුබදුවලට එරෙහි ව ගත් ශක්තිමත් උපායමාර්ගික ආරක්ෂාවක්. එසේ ම මෙය ඉන්දියාවේ සහ යුරෝපා සංගමයේ කර්මාන්ත රැසකට ශක්තියක් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන ආර්ථික මෙන් ම දේශපාලන සබඳතාවක් සඳහා වූ නව මුලපිරීමක්.

මේ එකඟතාවෙන් නිර්මාණය වුණේ ලොව විශාලතම නිදහස් වෙළෙඳ කලාපය. එය නියෝජනය කරන්නේ ඩොලර් ට්‍රිලියන 27කට ආසන්න ඒකාබද්ධ වෙළෙඳපොළක්. ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් 25%කට ආසන්න ප්‍රමාණයක් හෙවත් ලොව සමස්ත ජනගහනයෙන් 1/4ක් පමණ වන බිලියන 02ක ජනතාවක් මේ වෙළෙඳපොළ නියෝජනය කරනවා. එය නිර්මාණය කිරීමේදී ඉන්දියාවට මෙන් ම එරටින් යුරෝපා සංගමයේ අදාළ රටවලට අපනයනය කරන භාණ්ඩ සේවා සඳහා 100%කට ආසන්න වාර්තාගත පුළුල් තීරු බදු අඩු කිරීමක් සිදු වනවා. ඒ, 2032 වසර වන විට ද්විපාර්ශ්වික වෙළෙඳාම දෙගුණ කිරීම අරමුණු කරගනිමින්.

ගිවිසුමට විධිමත් ව අත්සන් තැබීමට පෙර දැනට එය පවතින්නේ නීතිමය පරීක්ෂාවට ලක් වෙමින් සහ යුරෝපා සංගමයේ සාමාජික රටවල නිල භාෂා 23කට පරිවර්තනය වෙමින්. නීතිමය කාර්ය සම්පූර්ණ වූ පසු ගිවිසුම අත්සන් තැබීම සහ බලාත්මක වීම 2027 වසරේ මුල්භාගය වන විට සිදු වනු ඇති බවටයි අපේක්ෂාව.

මේ සුවිශේෂ ගිවිසුමේ මූලික සාකච්ඡා ආරම්භ වූයේ 2007 වසරේදී. තීරුබදු, වෙළෙඳපොළ ප්‍රවේශය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ නියාමන ප්‍රමිති පිළිබඳ එකඟ නොවීම් හේතුවෙන් 2013 වසරේදී සාකච්ඡා වරක් ඇණ හිටි අතර 2022 ජූලි මාසයේදී සාකච්ඡා නිල වශයෙන් නැවත ආරම්භ කෙරුණා. එම සාකච්ඡාවලට ඇතුළත් ව තිබුණේ භාණ්ඩ හා සේවා වෙළෙඳාම, ආයෝජන ආරක්ෂාව, තිරසර සංවර්ධනය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, ඩිජිටල් වෙළෙඳාම සහ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණ ඇතුළු බහු පරිච්ඡේද ගණනාවක්.

ඉන්පසු නැවත සාකච්ඡා ඇරැඹුණේ 2025 පෙබරවාරි මාසයේදී. ඒ, අගමැති නරේන්ද්‍ර මෝදි සහ යුරෝපීය කොමිසමේ සභාපති **Ursula von der Leyen** අතර. එලෙස පැවති සාකච්ඡාවලින් පසුව 2026 ජනවාරි වන විට සාකච්ඡාවට ඇතුළත් ව තිබූ පරිච්ඡේද 24න් 20ක් පමණ පිළිබඳ එකඟතාවකට පැමිණ තිබුණා.

එම සාකච්ඡා මධ්‍යයේ, යුරෝපීය කොමිසමේ සභාපති **Ursula von der Leyen** සහ ඉන්දීය වෙළෙඳ අමාත්‍ය **Piyush Goyal** යන දෙදෙනා ම මේ නව ගිවිසුම ‘සියලු වෙළෙඳ ගනුදෙනුවල මව’ ලෙස විස්තර කළා. ඒ, එතෙක් මෙතෙක් ඇති වූ ද්විපාර්ශ්වික ගිවිසුම් අතර දෙපාර්ශ්වයට ම යහපත් වාසිදායක තත්ත්ව ඉහළ ම මට්ටමෙන් ලබාදෙන විශිෂ්ටතම ගිවිසුමක් හැටියට මේ ගිවිසුම පිළිගැනීමට ලක් ව තිබෙන නිසා.

මේ ගනුදෙනුවේ ප්‍රධාන වෙළෙඳ අරමුණ වන්නේ 2032 වසර වන විට ද්විපාර්ශ්වික භාණ්ඩ සහ සේවා වෙළෙඳාම දෙගුණ කිරීම. පසුගිය දශකයේ ඉන්දියාව සහ යුරෝපය අතර භාණ්ඩ වෙළෙඳාම සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණා. එය 2020 වසරේදී ඩොලර් බිලියන 74ක් පමණ වූ අතර 2024-2025 වසරවලදී ඩොලර් බිලියන 136ක් දක්වා ඉහළ අගයක් ගත්තා. දෙපාර්ශ්වය ම බලාපොරොත්තු වන්නේ 2030 වසර වන විට එය ඩොලර් බිලියන 200ක් පමණ දක්වා වැඩි කිරීමට.

ITC Trademap.org දත්ත අනුව යුරෝපීය සංගමය 2024 වසරේදී ඉන්දියාවෙන් යුරෝ බිලියන 89.8ක භාණ්ඩ ආනයනය කර තිබෙනවා. ඒ අන්දමට කාලයක් තිස්සේ යුරෝපය නැගී එන ඉන්දියා ආර්ථිකයේ විශාලතම භාණ්ඩ හා සේවා වෙළෙඳ හවුල්කරුවා බවට පත් ව තිබෙනවා. එබැවින් මේ හවුලේ වැඩි වාසිය ඉන්දියාවට ඇති බවයි බැලූ බැල්මට පෙනෙන්නට තිබෙන්නේ.

නව ගිවිසුම යටතේ ඉන්දියාව යුරෝපා අපනයනවලින් 96.6%ක් සඳහා වටිනාකම අනුව තීරුබදු ඉවත් කරන්නට හෝ අඩු

කරන්නට හෝ නියමිත වෙනවා. මේ අතර යුරෝපය ඉන්දියානු භාණ්ඩවලින් 99.5%ක් සඳහා එනම් 100%කට ආසන්න ව තීරුබදු අඩු කිරීමෙන් ප්‍රතිඋපකාර කරන්නට සූදානම්. ඒ අනුව යුරෝපීය කොමිසම වාර්ෂික තීරු බදු ඉතිරි කිරීම් වාසිය ඩොලර් බිලියන 4.7ක් වනු ඇතැයි ප්‍රක්ෂේපණය කර තිබෙනවා.

මේ ගිවිසුම උදා කරන්නේ ඉන්දියාවේ කෘෂි නිෂ්පාදන, තාක්ෂණ සේවා සහ ඩිජිටල් වෙළෙඳාම සඳහා යුරෝපා වෙළෙඳපොළට ප්‍රවේශයක් මෙන් ම ඉන්දියානු කාර්මික භාණ්ඩ, රෙදිපිළි, ඇඟලුම්, සම්, පාවහන්, මැණික් සහ ස්වර්ණාභරණ වැනි ශ්‍රම-අධික අපනයන සඳහා ක්ෂණික ශුන්‍ය තීරු බදු ප්‍රවේශයක්. එරට දක්ෂ වෘත්තිකයන් සහ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ, වෘත්තීය සේවා සහ අධ්‍යාපනය ඇතුළු උප අංශ 144කට ආසන්න නව අවස්ථා ද යුරෝපයේ උදා වෙනවා. සමුද්‍රීය නිෂ්පාදන සඳහා 26% දක්වා සහ රසායනික ද්‍රව්‍ය සඳහා 12.8% දක්වා තීරුබදු ක්‍රමයෙන් ඉවත් කෙරෙන්නට ද නියමිතයි.

වඩාත් ම වැදගත් වන්නේ හරිත සංක්‍රාන්තිය සඳහා ලැබෙන උපකාරය. මෙහිදී කාබන් විමෝචනය අඩු වන ලෙස සිය කාර්මික කටයුතු යාවත්කාලීන කර ගැනීමට ඉන්දියාවට සිදුවනවා. ඒ සඳහා යුරෝ මිලියන 500කින් (ආසන්න වශයෙන් ඩොලර් මිලියන 590ක්) උපකාර කිරීමට යුරෝපය සූදානම්. ඒ අනුව ඉන්දියානු භාණ්ඩ සඳහා එක්සත් ජනපදයෙන් පැනවෙන තීරු බදු දඬුවම් බලපෑම් මධ්‍යයේ එක්සත් ජනපදයෙන් සහ චීනයෙන් ඈත් ව සිය වෙළෙඳාම විවිධාංගීකරණය කරගැනීම සඳහා මේ ගනුදෙනුව ඉන්දියාවට සරු වෙළෙඳපොළක් සකසා දී තිබෙනවා.



ඉන්දියාවේ බිලියන 1.45ක ජනගහනය යුරෝපා නිෂ්පාදන සඳහා සුවිශාල සරු වෙළෙඳපොළක් ලෙසයි ක්‍රියා කරන්නේ. 2024 වසරේදී ඉන්දියාවට යුරෝපා සංගමය වෙතින් භාණ්ඩ හා සේවා අපනයනය කිරීම දළ වශයෙන් යුරෝ බිලියන 75ක්. දැන් ලැබෙන බදු නිදහසින් සිදුවන්නේ මේ වෙළෙඳාමේ පුළුල් වර්ධනයක්.

**ගිවිසුමේ ප්‍රමුඛ අරමුණ දෙපාර්ශ්වයේ වෙළෙඳාම සහ ආයෝජන පුළුල් බදු නිදහසකට පත් කිරීම. මේ වෙළෙඳ ගිවිසුම දෙපාර්ශ්වය වෙත ම ඉහළ යන ඇමරිකා තීරුබදුවලට එරෙහි ව ගත් ශක්තිමත් උපායමාර්ගික ආරක්ෂාවක්. එසේ ම මෙය ඉන්දියාවේ සහ යුරෝපා සංගමයේ කර්මාන්ත රැසකට ශක්තියක් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන ආර්ථික මෙන් ම දේශපාලන සබඳතාවක් සඳහා වූ නව මුලපිරීමක්.**

යුරෝපය සඳහා මෙයින් ලැබෙන වාසිදායක තත්ත්වය අතර කැපී පෙනෙන ම වාසිය උදා වන්නේ මෝටර් රථ සඳහා. යුරෝපා රථ ගෙන්වීමේදී ඉන්දියාව වාර්ෂික ව වාහන 250,000ක කෝටාවකට යටත් ව (යුරෝ 15,000ට වැඩි මිල මෝටර් රථ සඳහා) වසර පහක් තුළ මෝටර් රථ ගාස්තු 110% සිට 10% දක්වා අඩු කිරීමට නියමිත අතර මෝටර් රථ අමතර කොටස් සඳහා තීරු බදු ශුන්‍ය වනු ඇති.

යුරෝපා ප්‍රධාන අපනයන වන වයින් සඳහා 150% සිට 20%-30% දක්වාත් ස්ප්‍රීතු සඳහා 150% සිට 40% දක්වාත් ඔලිව් තෙල් සඳහා 45% සිට 0% දක්වා තීරු බදු අඩු කෙරෙන අතර චොකලට් සහ පැස්ටා සඳහා දැඩි තීරු බදු කප්පාදුවකුත් වෙනවා. ඖෂධ අපනයනය යුරෝ බිලියන 1.1ක් වන අතර එය දැනට 11%ක පමණ තීරු බදුවලට යටත්. එය සම්පූර්ණයෙන් ම ඉවත් කෙරෙනවා. යන්ත්‍රෝපකරණ සහ විදුලි උපකරණ මේ වන විට යුරෝපා සංගමයෙන් ඉන්දියාවට අපනයනය කරන විශාලතම වෙළෙඳ භාණ්ඩ කාණ්ඩයක්. එය 2024 වසරේදී යුරෝ බිලියන 16.3ක් වටිනා ගනුදෙනුවකට මුල් ව තිබුණා. මේ නිෂ්පාදන දැනට 44% දක්වා තීරු බද්දකට යටත්. එහෙත් ගිවිසුමෙන් එය ඉවත් කරනවා.

ගුවන් යානා සහ අභ්‍යවකාශ යානා අපනයනය පසුගිය වසරේ යුරෝ බිලියන 6.4ක්. මේ සඳහා 11% දක්වා දැනට පවතින තීරු බදු ශුන්‍ය කෙරෙනවා. ඉන්දියාව වෙත 2024 වසරේදී සිදු කළ රසායනික අපනයනයේ වටිනාකම යුරෝ බිලියන 3.2ක්. එය දැනට 22% දක්වා තීරු බදුවලට යටත්. මේ බොහෝ තීරු බදු ඉවත් වෙනවා.

විශේෂයෙන් කුඩා සහ මධ්‍යම මට්ටමේ සමාගම්වලට වෙළෙඳ ගනුදෙනුවලින් ප්‍රතිලාභ ලබා ගැනීම මෙතෙක් වැළැක් වූ අවාසි ඉවත් කිරීමටත් වාසිදායක අවස්ථා උදාකර දීමටත් උත්සාහ දැරීමක්. ඒ සඳහා දෙපාර්ශ්වය ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධතා මධ්‍යස්ථාන හා තීරු බදු, රේගු ක්‍රියාපටිපාටි සහ වෙළෙඳපොළට ඇතුළුවීමේ අවශ්‍යතා පිළිබඳ පැහැදිලි මෙන් ම යාවත්කාලීන තොරතුරු සපයන බෙදාගත් ඩිජිටල් වේදිකාවක් පිහිටුවන්නටයි නියමිත.

වෙළෙඳ එකඟතාවට සමගාමී ව දෙපාර්ශ්වය සමුද්‍රීය සහ සයිබර් ආරක්ෂාව සම්බන්ධයෙන් සහයෝගයෙන් ක්‍රියා කිරීම සඳහා ආරක්ෂක හවුල්කාරිත්වයකට ද අත්සන් තැබීම විශේෂත්වයක්. ලොව සුවිශාල ආර්ථික කලාප දෙකෙහි වෙළෙඳ එකමුතුව නිසා වක්‍ර ව උදා වන මේ ආරක්ෂක හවුල්කාරිත්වයට හිමි වන්නේ වත්මන් ගෝලීය භූ දේශපාලනික හැලහැප්පීම් මැද ඉතා වැදගත්, ප්‍රබල, බලාත්මක භූමිකාවක්.



# බෙංගාලයේ දැල්වුණු අපේක්ෂා

**නිහාල් පීරිස්**

ලෝක දේශපාලනය ගැන උනන්දුව දක්වන බොහෝ දෙනාගේ අවධානය දිනාගත් පාර්ලිමේන්තු මැතිවරණයක් නොබෝද (පෙබරවාරි 12) පැවැත්වුණා. ඒ, බංගලි දේශයේ මහා මැතිවරණය.

මේ මැතිවරණය කැපී පෙනුණු මැතිවරණයක් වූයේ රටේ මතු වූ දැවැන්ත විරෝධතා ව්‍යාපාරයකින් හිටපු අගමැතිනි ෂෙයික් හසිනා සහ ඇගේ ආණ්ඩුව බලයෙන් පහ කිරීමෙන් පසු පවත්වන ලද පළමු වැනි මැතිවරණය වූ නිසා. 2024 වසරේ මැදභාගයේ ඇය බලයෙන් පහ කෙරුණේ 2009 වසරේ සිට අඛණ්ඩ ව වසර 15ක් බලය හෙබවීමෙන් පසුව.

ඇයට සහ ඇයගේ පාලනයට එරෙහි ව පැන නැගුණු විරෝධතා නිසා ෂෙයික් හසීනාට බලය අහිමි වූවා පමණක් නොව රටින් ද පලා යාමට සිදු වුණා. 2024 අගෝස්තු 05 දින බංගලි දේශයෙන් පලා ගිය ඇය මේ වනවිට රැඳී සිටින්නේ ඉන්දියාවේ නව දිල්ලි නුවර. ඒ, ඉන්දියානු රජයේ රැකවරණය යටතේ. හසීනා කවදත් ඉන්දියාවේ සමීප මිතුරියක හැටියටයි සැලකුණේ.

හසීනා බලයෙන් නෙරපා හැරීමෙන් පසු කවුරුත් කුතුහලයෙන් යුතු ව බලා සිටි කාරණයක් වූයේ බංගලි දේශයේ මීළඟ නායකයා හෝ නායිකාව හෝ කවුරුන් වනු ඇත් ද යන්න. පෙබරවාරි 12 දින පැවැති මැතිවරණයෙන් දැන් මේ ප්‍රශ්නයට පිළිතුරක් ලැබී තිබෙනවා.

බංගලි දේශයේ නව අගමැතිවරයා ලෙස පත් ව සිටින්නේ එරට ප්‍රබල දේශපාලන පවුලක සාමාජිකයෙක්. ඒ, තරික් රහ්මන්. මේ වනවිට 60 වැනි වියෙහි පසුවන ඔහු බංගලි දේශයේ ප්‍රකට නායක යුවළක වූ සියාඋර් රහ්මන්ගේ සහ බලිඩා සියාගේ වැඩිමහල් පුත්‍රයා. ඔහු අයත් වන්නේ බංගලි දේශයේ ප්‍රධාන ම දේශපාලන පක්ෂයක් වන බංගලි දේශ ජාතිකවාදී පක්ෂයට. ෂෙයික් හසීනාගේ අවාමි ලීගය නැමැති පක්ෂයේ ප්‍රධාන ම දේශපාලන ප්‍රතිවාදියා වූයේ මේ බංගලි දේශ ජාතිකවාදී පක්ෂය.

පසුගිය කාලයේ එම පක්ෂයේ නායකත්වය දැරුවේ බලිඩා සියා. එහෙත් 2025 දෙසැම්බර් මාසයේ ඇය අභාවප්‍රාප්ත වීමෙන් පසු තරික් රහ්මන් පක්ෂ නායකත්වයට පත් වුණා. තරික් රහ්මන් පසුගිය කාලයේ ජීවත් වූයේ බංගලි දේශයේ නොවෙයි. 2008 වසරේ සිට ම ඔහු සිය බිරිඳ සහ දරුවන් ද සමඟ වාසය කළේ එංගලන්තයේ. වසර 17කට පසු ඔහු නැවත බංගලි දේශය වෙත පැමිණියේ පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ. එසේ වුවත් එංගන්තයේ සිටි කාලයේත් ඔහු පක්ෂයේ වගකීම් දරමින් දේශපාලනයේ නිරත වුණා.

2008 වසරේ රහ්මන් එංගලන්තයට ගියේ ඔහුට එරෙහි ව වංචා දූෂණ චෝදනා ඇතුළු විවිධ චෝදනා එල්ල වූ පසුබිමක. 2007 වසරේ මේ ඇතැම් චෝදනා නිසා රහ්මන් අත්අඩංගුවටත් පත් වුණා. ඒ වන විට බලයේ සිටියේ හමුදාවේ සහය ලැබූ භාරකාර ආණ්ඩුවක්. 2008 වසරේ ඔහු ඇප මත නිදහස් වී එම වසරේ ම එංගලන්තය බලා ගියා. ඊට හේතු වශයෙන් දක්වුණේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා යන්න.

2008 වසර අවසන් භාගයේ පැවැති මැතිවරණයකින් ෂෙයික් හසීනාගේ අවාමි ලීගය බලයට පත් වුණා. එයින් පසු වසර 15ක් ම බලය හෙබවූයේ එම පක්ෂය. මේ කාලයේ රහ්මන්ට එරෙහි ව තිබූ ඇතැම් චෝදනාවලට ඔහු වරදකරු කරමින් අධිකරණ තීන්දු ලැබුණු අතර ඔහුට සිර දඬුවම් ද නියම කෙරුණා. ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ද ඒ අතර තිබුණා. මෙවැනි පසුබිමක රහ්මන් නැවත බංගලි දේශයට පැමිණියේ නැහැ. තමාට එරෙහි ව පැවති චෝදනා රහ්මන් දිගින් දිගට ම ප්‍රතික්ෂේප කළ අතර ඔහු පැවසුවේ ඒවා



ෂෙයික් හසීනා

දේශපාලන වශයෙන් පළිගැනීම සඳහා එල්ල කළ චෝදනා බව.

2024 වසරේ හසීනාගේ අවාමි ලීගයේ පාලනය බිඳ වැටීමෙන් පසු 2025 වසරේ රහ්මන්ට එරෙහි ව පැවති බොහෝ චෝදනාවලින් ඔහු නිදොස්කොට නිදහස් කෙරුණා. පෙබරවාරි 12 දින පැවති මැතිවරණයේදී පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක සුපිරි බහුතරයක් හිමි කර ගැනීමට රහ්මන්ගේ පක්ෂයට හැකි වීම විශේෂත්වයක්.

බංගලි දේශ පාර්ලිමේන්තුව සමන්විත වන්නේ ආසන 350කින්. ඒ අතරින් ආසන 300ක් සඳහා නියෝජිතයන් තෝරා ගැනීම මැතිවරණයේදී ජනතා ඡන්දයෙන් සිදු වෙනවා.

2024 වසරේ හසීනාගේ අවාමි ලීගයේ පාලනය බිඳ වැටීමෙන් පසු 2025 වසරේ රහ්මන්ට එරෙහි ව පැවති බොහෝ චෝදනාවලින් ඔහු නිදොස්කොට නිදහස් කෙරුණා. පෙබරවාරි 12 දින පැවති මැතිවරණයේදී පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක සුපිරි බහුතරයක් හිමි කර ගැනීමට රහ්මන්ගේ පක්ෂයට හැකි වීම විශේෂත්වයක්.



තරික් රහ්මන්

ඉතිරි ආසන 50 වෙන් කර තිබෙන්නේ කාන්තා නියෝජිතවරියන් වෙනුවෙන්. එම නියෝජිතවරියන් පත් කර ගන්නේ සමානුපාතික නියෝජන ක්‍රමයට. මැතිවරණයේදී එක් එක් පක්ෂය දිනා ගන්නා ආසන සංඛ්‍යාවට සමානුපාතික ව මේ ආසන 50 එම පක්ෂ අතර බෙදී යනවා.

මේ ඡන්ද විමසීම පැවැත්වුණේ ආසන 300න් 299ක් සඳහා පමණයි. එක් ආසනයක් සඳහා ඉදිරිපත් ව සිටි අපේක්ෂකයකුගේ මරණය නිසා එම ආසනය සඳහා ඡන්ද විමසීම එදින පැවැත්වුණේ නැහැ. ඡන්ද විමසීම පැවැත්වුණු ආසන 299න් ද මේ සටහන ලියන අවස්ථාව වනවිට ප්‍රතිඵල නිකුත් කර තිබුණේ ආසන 297ක පමණයි. ආසන 2ක ප්‍රතිඵල අධිකරණ නියෝගයක් නිසා ප්‍රකාශයට පත් කර තිබුණේ නැහැ.

ප්‍රතිඵල නිකුත් කර තිබූ ආසන 297න් ආසන 209ක් ම හිමිකර ගැනීමට බංගලි දේශ ජාතිකවාදී පක්ෂය සමත් වී තිබුණා. එයින් අදහස් වූයේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයක් ඔවුන් දිනාගෙන ඇති බව. මේ නිසා බංගලි දේශ ජනතාව එම පක්ෂය සහ එහි නායකයන් මත තබා ඇති බලාපොරොත්තු ඉටු කිරීම සඳහා උපකාරී වන පසුබිමක් නිර්මාණය වී ඇති බව පවසන්නට පුළුවන්.

ෂෙයික් හසීනාගේ පාලනය ජනතාවට එපා වීමට හේතු වූ කාරණා රැසක් තිබුණා. ප්‍රධාන ම කාරණයක් වූයේ ඇයගේ ඒකාධිපති ස්වරූපයේ පාලනය නිසා ප්‍රජාතන්ත්‍රවාදයට, මානව හිමිකම් ආදියට එල්ල වී තිබූ තර්ජනය. ඇයගේ කාලයේ දේශපාලන ප්‍රතිවාදීන්ට බොහෝ හිංසනවලට, කරදර හිරිහැරවලට මුහුණ දෙන්නට සිදු වූ බව වාර්තා වුණා. අතුරුදහන් කිරීම් ආදිය ගැනත් චෝදනා නැගුණා. බලය රැක ගැනීම සඳහා මැතිවරණ දූෂණ සහ අක්‍රමිකතාවල නිරත වූ බවටත් චෝදනා එල්ල වුණා. මේ තත්ත්වය මත විරුද්ධ පක්ෂ ඇතැම් මැතිවරණ වර්ජනය කළ අවස්ථාත් තිබුණා.

රටේ ජනතාව මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා ද හසීනාගේ පාලනය අප්‍රසාදයට ලක් වීමට තවත් හේතුවක්. ඉහළ යන ජීවන වියදම වැනි කාරණා නිසා ජනතාව දැඩි පීඩාවට පත් ව සිටියා. තරුණ පරපුර තුළ විරැකියාව ඉහළ යාමත් දකිය හැකි වුණා.

බංගලි දේශ ජනතාව හසීනා බලයෙන් නෙරපා අලුත් කණ්ඩායමක් බලයට පත් කරගෙන ඇත්තේ මේ ගැටලු විසඳීමට ඔවුන් පියවර ගනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් බව අමුතුවෙන් කිව යුතු නැහැ. කවුරුත් කුතුහලයෙන් යුතු ව බලා සිටින්නේ ඒ සඳහා සාධනීය වැඩපිළිවෙළක් දියත් කිරීමට තරික් රහ්මන් ඇතුළු බංගලි දේශ ජාතිකවාදී පක්ෂ ආණ්ඩුව සමත් වේවි ද යන්න පිළිබඳ ව. යම් හෙයකින් ඔවුන් ඊට අසමත් වුවහොත් එරට තරුණ පරපුර නැවතත් ඔවුන්ට එරෙහි ව ද වීදි බසිනවාට සැකයක් නැහැ.

මේ වනවිට බංගලි දේශය සහ කලාපීය බලවතා වන ඉන්දියාව අතර පවතින ආතතිය ඉදිරියේදී සමනය වේවි ද? නැතහොත් තවත් වර්ධනය වේවි ද? යන්නත් බොහෝ පාර්ශ්ව අවධානයෙන් පසුවන කාරණයක්. ෂෙයික් හසීනාගේ කාලයේ බංගලි දේශ-ඉන්දියා සබඳතා වඩාත් ශක්තිමත් ව පැවතුණා. එහෙත් බංගලි දේශයෙන් පලා ගිය හසීනාට ඉන්දියාව රැකවරණ ලබා දීම වැනි හේතු නිසා පසුගිය කාලයේ මේ සබඳතාවල යම් ආතතියක් ඇති වුණා.

හසීනාට බංගලි දේශ අධිකරණයක් මරණ දඬුවම නියම කර ඇති බව රහසක් නොවෙයි. එයට හේතු වුණේ 2024 වසරේ පැන නැගුණු විරෝධතා මර්දනය කළ ආකාරය සම්බන්ධයෙන් එල්ල වූ චෝදනා. මෙවැනි තත්ත්වයක ඉන්දියාව, හසීනා නැවත බංගලි දේශයට ලබා දිය යුතු බවයි බංගලි දේශයේ බොහෝ පාර්ශ්වවල ඉල්ලීම. නව රජය ඉදිරියේදී මේ කාරණය සම්බන්ධයෙන් කවරාකාරයෙන් ක්‍රියා කරනු ඇත් ද යන්න බොහෝ දෙනා කුතුහලයෙන් යුතු ව බලා සිටින කාරණයක්.

# ලෝක සැරිසර

**චන්දන මාරසිංහ**



## ඔටුවන්ටත් ගමන් බලපත්‍රයක්

ඔටුවන්ට නිල ගමන් බලපත්‍රයක් ලබාදීමට සවුදි අරාබිය තීරණය කර තිබෙනවා. වෙළඳාම නියාමනය, හිමිකාරීත්වය ආරක්ෂා කිරීම සහ සවුදි අරාබියේ මිලියන 2.2ක් වන ඔටුවන්ගේ ගහනය කළමනාකරණය කිරීමයි මෙහි අරමුණ. ඔටුවන්ගේ සංස්කෘතික හා ආර්ථික වැදගත්කම ඉස්මතු කරමින් මේ ගමන් බලපත්‍රය නිකුත් කිරීමට පියවර ගෙන තිබෙන්නේ සවුදි අරාබියේ ලාංඡනය මෙන් ම ඔටුවෙකුගේ රන් නිදර්ශකයක් සහිත කොළ පැහැති විදේශ ගමන් බලපත්‍රයක් ලෙස එය සකස් කරමින්. 80,000ක් පමණ වන එරට ඔටු අයිතිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් එය ඉවහල් වනු ඇති. ධනයේ මෙන් ම සමාජ තත්ත්වයේ සංකේතයක් ලෙසටත් සැලකෙන ඔටුවන් වාර්ෂික ව පවත්වන උත්සවවලදී අලෙවි කෙරෙන්නේ ඩොලර්වලට. වසර 7000ක් පමණ පැරණි ඔටුවන්ගේ රූප සහිත කැටයම් පවා එරට හමු වී තිබෙනවා.



## කල් ඉකුත් වූ ගිවිසුම

න්‍යෂ්ටික අවි පිළිබඳ ව ඇමරිකාව හා රුසියාව අතර ඇතිකරගත් ගිවිසුමේ කාලය ඉකුත් වී තිබෙනවා. 2008 වසරේදී ඇමරිකා ජනාධිපති Barack Obama සහ රුසියාවේ ජනාධිපති ලෙස කටයුතු කළ **Dmitry Medvedev** අත්සන් කළ මේ ගිවිසුම 2011 වසරේ සිට බලාත්මක වුණා. ඉන්පසු ඇමරිකා ජනාධිපති **Joe Biden** එය දීර්ඝ කළේ තවත් වසර 05කින්. මේ ගිවිසුමේ අරමුණ වී තිබුණේ රටවල් දෙකේ ම න්‍යෂ්ටික අවිභාවිතයට සීමා පැනවීම. 2026 පෙබරවාරි මාසයේදී කල් ඉකුත්වන ගිවිසුම දීර්ඝ කිරීමට රුසියාවෙන් යෝජනා ඉදිරිපත් වුවත් ඇමරිකාව ඊට කැමැත්ත පළ කර නැහැ. න්‍යෂ්ටික ආයුධ සංඛ්‍යාව වැඩි කිරීමට රටවල් දෙකට ම අවකාශ හිමිවනවා. ලොව සියලු ම න්‍යෂ්ටික අවිවලින් 90%කට වඩා ප්‍රමාණයක් පවතින්නේ ඇමරිකාව සහ රුසියාව සතු ව. ගිවිසුම අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ආයතන ඉල්ලීම් කර තිබෙනවා.




## සමාජ මාධ්‍ය තහනම

වයස අවුරුදු 16ට අඩු ළමයින් සඳහා සමාජ මාධ්‍ය තහනම් කරන බව ස්පාඤ්ඤය පවසනවා. ඩිජිටල් හිංසනවලින් ළමයින් ආරක්ෂා කිරීම එහි අරමුණ බවයි අගමැති **Pedro Sánchez** පවසන්නේ. නීති විරෝධී අන්තර්ගත ඉවත් කිරීමට මෙන් ම ඇල්ගොරිතම බලපෑම පාලනය කිරීමටත් නව නීති ඉවහල් වෙනවා. සැප්තැම්බර් මාසය වන විට තහනම ක්‍රියාත්මක කිරීමයි ඔවුන්ගේ අරමුණ. ඩිජිටල් වේදිකා ඔස්සේ වෛරීය ප්‍රකාශන සමාජගත වීම වැළැක්වීම සඳහා නීතිය යොදා ගන්නා අතර නීතිය සම්මත කිරීමට දුෂ්කර වන්නේ සභාග රජයට අතිබහුතරයක් පාර්ලිමේන්තුවේ නොමැති බැවින්. කෙසේ වෙතත් ස්පාඤ්ඤයේ ප්‍රධාන විපක්ෂය සමාජ මාධ්‍ය තහනමට සහාය ලබා දෙනවා.



## ඝාතනය කළ ගඩාෆි

ලිබියාවේ හිටපු නායක **Muammar Gaddafi** පුත්‍රයා වන **Saif al-Islam Gaddafi** ඝාතනය කර තිබෙනවා. සිව් දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් ඔහුගේ නිවසේදී මේ ඝාතනය කර ඇති බවයි වාර්තා වන්නේ. 1969 වසරේ සිට 2011 වසර දක්වා ලිබියාව පාලනය කළ **Muammar Gaddafi** ගෙන් පසු එරට වඩාත් බලගතු හා බිය උපදවන චරිතය බවට පත්වුණේ ඔහුගේ පුත්‍රයා. 1972 වසරේදී උපත ලැබූ ඔහු ලිබියාවේ ගඩාෆි පාලනය බිඳ වැටෙන තෙක් බටහිර රටවල් සමඟ ලිබියාව සම්බන්ධ කිරීමේ කාර්යයෙහි නිරත වුණා. පියා මිය යාමෙන් පසු **Saif** වසර 06කට ආසන්න කාලයක් සිරගත කර සිටියා. ජාත්‍යන්තර අපරාධ අධිකරණයට ද ඔහු අවශ්‍ය ව සිටි පුද්ගලයෙක්.



## ඉරාන - ඇමරිකා අවිශ්වාසය

ඉරානය සහ ඇමරිකාව අතර පැවැත්වුණු සෘජු සාකච්ඡාවලදී මූලික අවධානය යොමු වූ කරුණු කිහිපයක් තිබෙනවා. ඉරාන න්‍යෂ්ටික වැඩසටහන, විරෝධතාකරුවන්ට දඬුවම් කිරීම සහ ඉරානයට පනවා ඇති සම්බාධක යනාදිය එහිදී කැපී පෙනෙන කාරණා. මැදපෙරදිග මතු ව ඇති ආතතිය සමථයකට පත්කිරීම එහි අරමුණ වී තිබුණා. සාකච්ඡාවලින් අනතුරු ව ඉරානය සඳහන් කළේ ඉදිරි පියවර සඳහා රාමුවක් ඇතිකර ගැනීමට එකඟ වූ බව. ඒ අනුව සාකච්ඡාවල යම් ප්‍රගතියක් පවතිනවා. සාකච්ඡාවලින් ගිවිසුමකට එළඹීමට ඉරානය කටයුතු නොකරන්නේනම් දැඩි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බව ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කළා. මේ වන විටත් ඇමරිකාවේ ගුවන් යානා ප්‍රවාහන නෞකා සහ යුද නෞකා මෙන් ම ප්‍රහාරක යානා මැදපෙරදිග කලාපයට යොමු කර තිබෙනවා. කෙසේ වෙතත් ඉරානය සඳහන් කළේ යානා ප්‍රවාහන නෞකාවලට වඩා ඒවා මුහුදේ ගිල්වා දැමිය හැකි ආයුධ බලවත් බව. ඉරානයේ සංවේදී ආරක්ෂක මධ්‍යස්ථානවල ආරක්ෂාව සඳහා කොන්ක්‍රීට් බංකර් සකස් කරන බව චන්ද්‍රිකා ඡායාරූපවලින් තහවුරු වී තිබෙනවා. ඉන් පෙනී යන්නේ සාකච්ඡා පැවතියත් දෙපාර්ශ්වය ම එකිනෙකා පිළිබඳ විශ්වාසයක් නොමැති බව.



## ජපානය අගමැති

ජපානයේ මහ මැතිවරණයෙන් අගමැති **Sanae Takaichi** ගේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ජය ගත්තේ පාර්ලිමේන්තුවේ ආසන 465න් ආසන 316ක් ම හිමි කර ගනිමින්. ඒ අනුව අගමැති ලෙස ඇය යළි දිවුරුම් දුන්නා. ලොව සිව් වැනි විශාලතම ආර්ථිකය හිමි ජපානයට මන්දගාමී වර්ධනය සහ වැඩ කරන ජනගහනය වයස්ගත වීම වැනි ගැටලු රැසක් පවතිනවා. කර්මාන්ත ශාලාවල ආයෝජනය ඇතුළු ආර්ථික ක්‍රියාකාරකම් රැසක් අනුගමනය කිරීමටත් සහල්වල පිරිවැය ඉහළ යාම ඇතුළු ගැටලුවලට විසඳුම් සෙවීමටත් ඇයට සිදුවනවා. හිටපු අගමැති **Shinzo Abe**ගේ ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ හිටපු සාම සාමාජිකයෙකු වන **Tomohiko Taniguchi** පවසා තිබෙන්නේ අගමැතිවරිය ජපානය නිවැරදි දිශාවට මෙහෙයවන බව. ජපන් වෙළෙඳපොළේ කොටස් මිල දී ගැනීමට ද ආයෝජකයන් පෙළඹී සිටින අතර ජපන් මුදලේ වටිනාකම ද ඉහළ ගොස් තිබෙනවා. ජපානයේ බැඳුම්කර වෙළෙඳපොළ ද විශාල වන බැවින් එහි සිදුවන වෙනස්කම් ජාත්‍යන්තරයට දැනෙනු ඇති.

> ඉන්දියාව සමඟ වෙළෙඳ ගිවිසුමකට එළඹි බව ඇමරිකා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කළා. ඉන්දියාව වසර 05කදී ඇමරිකා ඩොලර් බිලියන 500ක් වටිනා ඇමරිකන් භාණ්ඩ මිල දී ගන්නා බවට වන ඒකාබද්ධ ප්‍රකාශයක් ද නිකුත් වී තිබෙනවා. ඉන්දියාවට පනවා ඇති තීරු බදු 50% සිට 18% දක්වා අඩු කිරීමටත් ඇමරිකාව එකඟ වී තිබෙනවා. සාකච්ඡා පැවතියත් රුසියාවෙන් තෙල් මිල දී ගැනීම නතර කළ යුතුයි යන ඇමරිකාවේ මතය ගැන වැඩිදුර තොරතුරු ඉදිරිපත් කර නැහැ.



## අසමාන හුවමාරුව

ඉන්දියාව සමඟ වෙළෙඳ ගිවිසුමකට එළඹි බව ඇමරිකා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කළා. ඉන්දියාව වසර 05කදී ඇමරිකා ඩොලර් බිලියන 500ක් වටිනා ඇමරිකන් භාණ්ඩ මිල දී ගන්නා බවට වන ඒකාබද්ධ ප්‍රකාශයක් ද නිකුත් වී තිබෙනවා. ඉන්දියාවට පනවා ඇති තීරු බදු 50% සිට 18% දක්වා අඩු කිරීමටත් ඇමරිකාව එකඟ වී තිබෙනවා. සාකච්ඡා පැවතියත් රුසියාවෙන් තෙල් මිල දී ගැනීම නතර කළ යුතුයි යන ඇමරිකාවේ මතය ගැන වැඩිදුර තොරතුරු ඉදිරිපත් කර නැහැ. ගිවිසුමට අනුව ඇමරිකාවේ කාර්මික භාණ්ඩ මෙන් ම ආහාර හා ඇතැම් කෘෂිකාර්මික නිෂ්පාදනවල තීරු බදු අඩු කිරීමත් ඉන්දියාවේ පොරොන්දුවක්. එහෙත් මෙය ඉන්දියාවේ ගොවි ජනතාවගේ කනස්සල්ලට

හේතු වූ කරුණක්. ඇමරිකාව එකඟ වී තිබෙන්නේ ඉන්දීය අපනයනවලින් 55%ක් වන තීරු බදු අඩු කිරීමට. කෙසේ වෙතත් ගෝලීය වෙළෙඳ හා පර්යේෂණ ආයතනය පෙන්වා දෙන්නේ මෙය අසමාන හුවමාරුවක් බව. විධායක නියෝගයකින් ජනපති ට්‍රම්ප් සඳහන් කළේ ඉන්දියාව රුසියාවෙන් තෙල් මිල දී ගන්නේ ද? නැද්ද? යන්න පිළිබඳ ඇමරිකාව නිරීක්ෂණය කරන බව.



## ව්‍යවස්ථා වෙනස

සිම්බාබ්වේ ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර 05 සිට 07 දක්වා දීර්ඝ කිරීමේ යෝජනාවකට එරට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දුන්නා. ඒ අනුව ව්‍යවස්ථාව වෙනස් කිරීමටයි පියවර ගෙන තිබෙන්නේ. ජනාධිපති **Emmerson Mnangagwa**ගේ ධුර කාලය 2028 වසරේදී අවසන් වෙනවා. නව සංශෝධනය අනුව 83 හැවිරිදි ජනාධිපතිවරයා 2030 වසර දක්වා ධුරයේ රැඳී සිටිනු ඇති. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ පනත් කෙටුම්පතේ සඳහන් තවත් කරුණක් වන්නේ ජනාධිපතිවරයා සෘජු ඡන්දයකින් නොව පාර්ලිමේන්තුවෙන් තෝරා පත් කර ගත යුතු බව. එසේ ම ජනාධිපතිවරයාට සෙනෙට් සභිකයන් 10 දෙනෙකු පත් කිරීමට අවස්ථාව ලබාදීමත් ඊට අයත්. 2017 වසරේදී **Robert Mugabe** බලයෙන් පහකිරීමෙන් අනතුරු ව නව ජනාධිපතිවරයා තේරී පත් වුණා.

ධුර කාලය දීර්ඝ කිරීමේ යෝජනාවට විපක්ෂය දැඩි ලෙස විරුද්ධ වී ඇති අතර ඔවුන් ඉල්ලා සිටින්නේ ජනමත විචාරණයක්.



## රොබෝවරුන්ගේ සටන

චීනයේ චන්ද්‍ර අලුත් අවුරුදු උදාවන නිමිත්තෙන් පැවැත්වෙන වාර්ෂික උත්සවයේදී නව තාක්ෂණයේ විශාල ප්‍රගතියක් සහිත සංදර්ශනයක් පැවැත්වුණා. එහිදී පළමුවරට වේදිකාව මත මිනිස් සහ රොබෝ ඒකාබද්ධ සටන් සංදර්ශනයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ සංදර්ශනය Youtube ඔස්සේ ලොව පුරා නරඹා තිබෙන්නේ ලක්ෂ 05ක පමණ පිරිසක්. රොබවරු 24 දෙනෙකු පමණ සංදර්ශනයට එක්කර තිබුණා. මේ සංදර්ශනය සඳහා රොබවරු නිර්මාණය වෙනුවෙන් ඩොලර් මිලියන 14ක් වටිනා ආයෝජන සිදුකර ඇති බව සඳහන්. සමාගම් 04ක් ඒ සඳහා එක්වුණා. රොබෝවරු මුලින් ම විකට සංදර්ශනයක් ඉදිරිපත් කළ අතර පසුව ළමා සටන් ශිල්පීන් සමඟ එක් ව සංදර්ශනයක් ඉදිරිපත් කර තිබෙනවා. කැලිෆෝනියා විශ්වවිද්‍යාලය පවසන්නේ මෙය චීනයේ ප්‍රබල හැකියාවක් බව. රොබෝ තාක්ෂණයේ ප්‍රබල දියුණුවක් අත්කර ගැනීමට චීනයට හැකි ව තිබෙනවා. මෙහි තවත් ප්‍රවණතාවක් වන්නේ කම්කරු පන්තියේ ජනතාවගේ කාර්ය මෙන් ම යුද පිටියේ කාර්ය සඳහා ද රොබෝවරු යෙදවීම.



## ජීවිතාන්ත සිර දඬුවම

දකුණු කොරියාවේ හිටපු ජනාධිපති **Yoon Suk Yeol** ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වුණා. 2024 දෙසැම්බර් මාසයේදී යුද නීතිය පනවා හමුදා පාලනයක් ඇති කිරීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් වන චෝදනාවටයි ඔහු වැරදිකරු වී තිබෙන්නේ. හිටපු ජනාධිපතිවරයාට එරෙහි ව විභාග වෙමින් පවතින්නේ තවත් නඩු දෙකක්. කැරැල්ලක් මෙහෙයවීම පිළිබඳවත් ඔහුට චෝදනා ඉදිරිපත් වී තිබෙනවා. බලය අනිසි ලෙස භාවිත කිරීම හා ව්‍යවස්ථා නියෝග කඩ කිරීම ගැනත් ඔහුට චෝදනා එල්ල වුණා. හිටපු ජනාධිපතිවරයා

චීනයේ චන්ද්‍ර අලුත් අවුරුදු උදාවන නිමිත්තෙන් පැවැත්වෙන වාර්ෂික උත්සවයේදී නව තාක්ෂණයේ විශාල ප්‍රගතියක් සහිත සංදර්ශනයක් පැවැත්වුණා. එහිදී පළමුවරට වේදිකාව මත මිනිස් සහ රොබෝ ඒකාබද්ධ සටන් සංදර්ශනයක් ඉදිරිපත් කර තිබෙනවා.

මෙන් ම හිටපු බුද්ධි අංශ ප්‍රධානියාට සහ හිටපු පොලිස් ප්‍රධානියාට ද සිර දඬුවම් නියම වී තිබෙනවා. 65 හැවිරිදි හිටපු ජනාධිපතිවරයාට හිමි වූ දඬුවමට එරෙහි ව අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔහුට හැකියාව පවතිනවා.

# ඇඟිලි තුඩේ මීඩියා



ටී. එම්. ජී. චන්ද්‍රසේකර

රටක සිව් වැනි ආණ්ඩුව ලෙස සැලකෙන ජනමාධ්‍ය, සාමාන්‍ය ජන ජීවිතයේ අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත් වී අවසන්. මෙවැනි පසුබිමක සාම්ප්‍රදායික ජනමාධ්‍ය අභිභවමින් ඩිජිටල් මාධ්‍ය වෙත ප්‍රේක්ෂක, ශ්‍රාවක අවධානය යොමු වීම වර්තමානයේ නොවැළැක්විය හැකි ප්‍රවණතාවක් බවට පත් ව තිබෙනවා. ඒ අනුව 'සමාජ මාධ්‍ය' භාවිතය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින්, පුද්ගල ජීවිත හා බද්ධ වෙමින් ඇති කර තිබෙන්නේ ගෝලීය වශයෙන් ම විපර්යාසයක්. මේ නිසා ඇති වන යහපත් සහ අයහපත් බලපෑම් පිළිබඳ ශ්‍රී ලංකාවේ ද සමාජ සංවාදයක් ගොඩනැගෙමින් තිබෙන මොහොතක මෙවර කවරයේ කතාවේ කතාබහ සිදු වන්නේ එය මූලික ව.

## මාර්ගගත සන්නිවේදනය

අන්තර්ජාලය යනු ලෝකය පුරා පවතින පරිගණක ජාල එකිනෙකට සම්බන්ධ කරමින් තොරතුරු හුවමාරු කරගැනීමට ඉඩ සලසන විශාල ජාල පද්ධතියක්. මුල්කාලීන ව ආරක්ෂක තොරතුරු හුවමාරුව සඳහා සීමිත ව යොදාගත් ජාල (ARPANET) වඩාත් පුළුල් ලෙස වර්ධනය කරමින් ජාලවල ජාල බවට පත්වීමෙන් අන්තර්ජාල සේවාව ඇරඹෙනවා. පසුව එය විද්‍යුත් තැපැල්, වෙබ් අඩවි, වීඩියෝ සම්මන්ත්‍රණ, අධ්‍යාපනික සේවා සහ ව්‍යාපාරික කටයුතු වැනි විවිධ සේවා සඳහා භාවිත වීමෙන් ලෝකයේ ඕනෑ ම ස්ථානයක සිට තොරතුරු ඉක්මනින් ලබාගැනීමට හැකියාව ඇති මාධ්‍යයක් බවට පත්වුණා.

සමාජ මාධ්‍ය යනු අන්තර්ජාලය මත ක්‍රියාත්මක වන පරිශීලකයන්ට තොරතුරු, අදහස්, ඡායාරූප, වීඩියෝ සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට ඉඩ සලසන ඩිජිටල් වේදිකාවක්. ෆේස්බුක් (Facebook), යූටියුබ් (YouTube), වට්ස්ඇප් (WhatsApp), ඉන්ස්ටර්ග්‍රෑම් (Instagram) සහ ටික්ටොක් (TikTok) වැනි වේදිකා ඊට උදාහරණ. මේ ඔස්සේ පුද්ගලයන්ට තම අදහස් ප්‍රකාශ කිරීමට, මිතුරන් සමඟ සම්බන්ධ වීමට සහ සමාජ ජාල ගොඩනැගීමට හැකියාව තිබෙනවා.

මේ අනුව අන්තර්ජාලය (Internet) සහ සමාජ මාධ්‍ය (Social Media), තාක්ෂණ ඉතිහාසයේ පරිවර්තනීය විප්ලවයක් ඇති කළ නවෝත්පාදනක් ලෙසයි සැලකෙන්නේ. මෙයින් මූලික ව ම වෙනස් කර තිබෙන්නේ පරිශීලකයා තොරතුරු හුවමාරු කරගන්නා, සන්නිවේදනය කරන, දැනුම ලබාගන්නා සහ සමාජ සම්බන්ධතා ගොඩනැගීමේ ස්වභාවය. එම නිසා අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය, නවීන මානව සංවර්ධනයේ වැදගත් තාක්ෂණික අවධියක් ලෙස අර්ථ ගැන් වී තිබෙනවා.

විවිධ පර්යේෂකයන් සමාජ මාධ්‍ය පිළිබඳ ව දරන අදහස් විමසා බලන විට අනාවරණය වන්නේ එය යහපත, අයහපත කැටි වූ සංකීර්ණ මාධ්‍යයක් වන බව. සමාජ මාධ්‍ය ඔස්සේ වැරදි තොරතුරු හා වදන් ප්‍රචාරය, දේශපාලන වෙනස්වීම් සහ සමාජ විරෝධතා වර්ධනය වීම ඔවුන්ගේ දැඩි අවධානයට යොමුවූවක්. විශේෂයෙන් යෞවනයන් අතර මානසික ආතතිය, සමාජ සැසඳීම් සහ අධික භාවිතය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටලු පිළිබඳ ව ද ඇතැම් අධ්‍යයනවලදී අවධානය යොමු කර තිබෙනවා. එහි බලපෑම පුද්ගලයන් සමාජ මාධ්‍ය භාවිත කරන ආකාරය මත විශාල වශයෙන් රඳා පවතින බවට බොහෝ පර්යේෂකයන් අතර ඇති වී තිබෙන්නේ පොදු එකඟතාවක්. ඒ අනුව සමාජයට සමාජ මාධ්‍ය ප්‍රයෝජනවත් වීමටනම් එහි නිසි භාවිතය, මාධ්‍ය සාක්ෂරතාව සහ වගකීම මෙන් ම පාලනය අත්‍යවශ්‍ය බව ගෝලීය මට්ටමේ ලෝක පර්යේෂකයන්ගේ මතය වී තිබෙනවා.

1970 දශකයේ අගභාගයේ සහ 1980 ගණන්වල 'Bulletin Board Systems (BBS) සහ Usenet' ක්‍රමවේද ඔස්සේ පණිවිඩ හුවමාරු කරගැනීමට, ලිපිගොනු බෙදා ගැනීමට සහ සාකච්ඡාවලට සහභාගි වීමට අවස්ථාව සැලසුණා. ඒ සඳහා මොඩම් භාවිත කරමින් ඩයලප් දුරකතන මාර්ග ඔස්සේ සම්බන්ධ වීමට අතරමැදි සේවා සපයන්නෙකුගේ සහාය ද ලබා ගත යුතු වුණා.

1979 වසරේදී නිර්මාණය කරන ලද Usenet ලෙස හඳුන්වන ප්‍රවෘත්ති කණ්ඩායම් විවිධ කාලීන මාතෘකා මත පදනම් වූ සංසද ඔස්සේ ගෝලීය සාකච්ඡාවලට ඉඩ දීමෙන් මාර්ගගත සන්නිවේදනය පුළුල් වී තිබෙනවා. මෙහිදී, භූගෝලීය සීමා ඔස්සේ නිර්මාණය වුණේ අදහස් සහ තොරතුරු හුවමාරු කර ගත හැකි මහා පරිමාණ ඩිජිටල් ප්‍රජාවගෙන් යුත් වේදිකාවක්.

## සමාජ ජාල වෙබ් අඩවිවල ආරම්භය

සමාජ ජාලකරණය පිළිබඳ නූතන සංකල්පය ආරම්භ වන්නේ 1990 දශකයේ අගභාගයේදී. ඒ සමඟ අන්තර්ජාල ප්‍රවේශය වඩාත් පුළුල් පරාසයක් වෙත විහිදෙනවා. 1997 වසරේදී **Andrew Weinreich** විසින් දියත් කරන ලද 'SixDegrees.com' ඔස්සේයි පුළුල් ලෙස පළමු වැනි සැබෑ සමාජ ජාල වෙබ් අඩවිය ආරම්භ වන්නේ. 'සමාජ ජාලකරණයේ පියා' ලෙස **Andrew Weinreich** ඉතිහාසයට එක් වන්නේ මේ හේතුවෙන්. එය පරිශීලකයන්ට පැතිකඩ නිර්මාණය කිරීමට, මිතුරන් ලැයිස්තුගත

කිරීමට සහ අනෙකුත් පරිශීලකයන් සමඟ මාර්ගගත ව සම්බන්ධ වීමට ඉඩ සලසා දෙන්නක්.

මේ සියල්ල දුරස්ථ සම්බන්ධතා ජාලයක් (Network of connections) ලෙස ක්‍රියා කළ අතර පසුව එම සංකල්පය අනෙක් නව සමාජ මාධ්‍ය සේවා විසින් පුළුල් පරිමාණයකින් දියත් කරනු දැකගත හැකියි. උදාහරණයක් ලෙස Facebook, Instagram, Linkedin වැනි අලුත් ම සමාජ මාධ්‍ය වේදිකා සියල්ල SixDegrees.com විසින් පළමුවරට හඳුන්වා දුන් 'පැතිකඩ+සම්බන්ධතා' මූලික සංකල්පය පදනම් කරගෙනයි බිහිවන්නේ.

2000 දශකයේ මුල්භාගයේදී 'Friendster (2002) සහ MySpace (2003)' වැනි සමාජ මාධ්‍ය වේදිකා විශේෂයෙන් තරුණ



Myspace මුල් profile පිටුව


ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය වී තිබුණා. පරිශීලකයන්ට සංගීතය, ඡායාරූප සහ පුද්ගලික අන්තර්ගත බෙදා ගැනීමට මේ වේදිකා ඉඩ සලසන අතර සමාජ ජාලකරණය වඩාත් අන්තර්ක්‍රියාකාරී සහ විනෝදාස්වාදය කේන්ද්‍රකරගත්තක් බවට පත් කරගනීමට හැකිවෙනවා.

ජාලකරණය, අනන්‍යතා බෙදාගැනීම සහ සන්නිවේදනය එක් වේදිකාවකට ඒකාබද්ධ කළ Facebook දියත් කිරීමත් සමඟ වඩාත් පරිවර්තනීය වෙනසක් සන්නිවේදන තාක්ෂණ අංශයේ සිදුවෙනවා. එය 2004 පෙබරවාරි 04 දින ඇමරිකාවේ හාවඩ් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු වූ මාර්ක් සකර්බර්ග් (Mark Zuckerberg) විසින් ආරම්භ කරන ලද අතර ඔහු සමඟ Dustin Moskovitz, Eduardo Saverin, Chris Hughes සහ Andrew McCollum යන මිතුරන් ද මේ ව්‍යාපෘතියට සහභාගි වුණා.

මුල් කාලයේ Facebook හඳුන්වා දුන්නේ TheFacebook ලෙස. එය හාවඩ් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට පමණයි භාවිත කිරීමට හැකි වුණේ. එහි අරමුණ වූයේ විශ්වවිද්‍යාලයේ සිසුන් අතර සම්බන්ධතා ගොඩනැගීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම. ඉතා කෙටි කාලයකදී ජනප්‍රිය වූ Facebook පසුව ඇමරිකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලවලට ද පුළුල් කෙරුණා. එය සාමාන්‍ය ජනතාවට විවෘත වන්නේ 2006 වසර වන විට. ඒ අනුව අන්තර්ජාලය භාවිත කරන ඕනෑ ම පුද්ගලයෙකුට Facebook ගිණුමක් නිර්මාණය කිරීමට හැකියාව ලැබෙනවා මෙන් ම එම කාලයෙන් පසුව ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වන Facebook, ස්මාර්ට් දුරකතන භාවිතය වැඩිවීමත් සමඟ තවදුරටත් වර්ධනය වුණා.

Facebook සමාජ ජාලකරණය පමණක් නොව ක්‍රමයෙන් වර්ධනය වන විවිධ සේවා ද දක්නට ලැබෙනවා. ඒ අතර ඡායාරූප සහ වීඩියෝ බෙදාහදා ගැනීම, Messenger සේවාව, Live වීඩියෝ විකාශනය, ව්‍යාපාරික ප්‍රචාරණ සේවා, සමූහ (Groups), පිටු (Pages) මඟින් සමාජ සහ ව්‍යාපාරික ජාලකරණය දක්නට පුළුවන්. පසුව Facebook සමාගම විසින් Instagram සහ WhatsApp වැනි ජනප්‍රිය සමාජ මාධ්‍ය සේවා මිල දී ගන්නා අතර අද එය හඳුන්වන්නේ Meta සමාගම නමින්.

සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ බෙදාහදා ගන්නා ඡායාරූප, වීඩියෝ, පණිවිඩ සහ අදහස් සියල්ල ම ඩිජිටල් දත්ත බවට පරිවර්තනය කර ඇති බැවින් ඒවා ඩිජිටල් සන්නිවේදන මාධ්‍ය ලෙසයි වර්තමානයේ හැඳින්වෙන්නේ. Digital 2025 Global Overview Report වර්තා අනුව බිලියන 8.1-8.2 අතර වූ ලෝකයේ සමස්ත ජනගහනයෙන් 58.4%ක් අන්තර්ජාලය සමඟ සම්බන්ධ ව සිටින අතර බිලියන 5.66ක, එනම් 68,75ක් සමාජ මාධ්‍ය පරිහරණය කරනවා. එහෙත් සයිබර් ආරක්ෂාව සහ අන්තර්ජාල පුද්ගලිකත්වය (privacy) සපයන සමාගමක් වන **Surfshark** පළ කළ ලිපියකට අනුව චීනය, ඉරානය සහ ටර්ක්මෙනිස්තානය යන රටවල ජනතාවට වසර 14ක් තිස්සේ Facebook, YouTube සහ X වෙත ප්‍රවේශ වීම තහනම් කර තිබුණා. එරිත්‍රියාවේ YouTube වසර 14කට ආසන්න කාලයක් අවහිර කර ඇති අතර උතුරු කොරියාවේ බොහෝ ප්‍රධාන සමාජ මාධ්‍ය වෙබ් අඩවි වසර 8ක් දක්වා තහනම් ව තිබුණා. **Surfshark** සඳහන් කරන පරිදි, එයින් අදහස් වන්නේ බිලියන 1.6ක ජනතාවක්






Social media සංකල්පය මුලින් ම හඳුන්වා දුන් **Andrew Weinreich**

සමාජ මාධ්‍යවලින් කපා හැර ඇති බව. මේ නිසා එම පුද්ගලයන් සංවෘත, පටු ලෝකයකට සීමා වී ඇති අතර එහිදී ඔවුන්ට එකිනෙකාට මෙන් ම අනෙකුත් ජාතීන් සමඟ සම්බන්ධ වීමට තිබූ අවකාශය සීමිත වුණා. මෙලෙස සමාජ මාධ්‍ය ප්‍රවේශය අවහිර කිරීම, බිම් මට්ටමේ සමාජ මාධ්‍යවල බලය පිළිබඳ නිහඬ සාක්ෂියක් ලෙසයි දැක්වෙන්නේ. චීනය වැනි රටවල් තමන්ට ම අනන්‍ය සමජ මාධ්‍ය ජාලා හඳුන්වා දුන්නේ ඔවුන්ගේ දේශපාලනික ප්‍රතිපත්ති මත රඳා සිටිමින්.

Facebookහි සාර්ථකත්වයෙන් පසුව YouTube (2005) විසින් වීඩියෝ බෙදාගැනීමේ විප්ලවීය වෙනසක් සිදු කරනු ලැබුවා. **Twitter** (2006) විසින් වඩාත් කෙටි බ්ලොග්කරණය සහ තත්‍යකාලීන ප්‍රවෘත්ති යාවත්කාලීන කිරීම් හඳුන්වා දෙනු ලබුවා. Instagram, WhatsApp සහ TikTok වැනි වේදිකා දෘශ්‍ය කතන්දර කීම, ක්ෂණික පණිවිඩ යැවීම සහ කෙටි ආකෘති වීඩියෝ අන්තර්ගත කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ මාධ්‍ය තවදුරටත් පුළුල් කිරිමටයි දායක වුණේ. ඵ අනුව වැඩි ම භාවිතයක් ඇති සමාජ මාධ්‍ය වේදිකාව ලෙස YouTube වර්තාගත වුණා.

| **සමාජ මාධ්‍ය වේදිකා භාවිතය (2026)** | |
|---|---|
| YouTube | 2.53 billion |
| Facebook | 2.28 billion |
| Instagram | 1.67 billion |
| TikTok | 1.59 billion |
| WhatsApp | 2+ billion |
| Linkedin | 1.33 billion |

Global Web Index (GWI)

## වත්මන් ශ්‍රී ලංකාවේ ඩිජිටල් තත්ත්වය

ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය පළමුවෙන් ම ආරම්භ වූ 1990 වසරේ මුල් කාර්තුවේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සීමිත භාවිතයකට මේ පහසුකම ලැබුණා. අධ්‍යාපන හා විවිධ පර්යේෂණ කාර්යවල නිරත විදේශගත වෘත්තිකයන්ගේ එකතුවක් වූ The Lanka Education and Research Network-LEARN මීට නායකත්වය ලබා දුන් බව සඳහන්. මොරටුව විශ්වවිද්‍යාලයේ පරිගණක ඉංජිනේරු අංශය විසින් විදෙස්ගත ලාංකික විද්වතුන් සමඟ මෙහි ශාස්ත්‍රීය සබඳතා පවත්වාගනු ලැබුවා. Internet වානිජමය සේවාවක් ලෙස 1995 වසරේදී ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇත්තේ ලංකා ඉන්ටර්නෙට් සමාගම. ඒ සමඟ 1998-1999 වසරවලදී අන්තර්ජාලය පොදු ජනතාවට ද විවෘත වුණා. මෙලෙස ආරම්භ වූ අන්තර්ජාල සබඳතා 2000 වසර වනවිටත් ශ්‍රී ලංකාවේ තිබුණේ 30,000කට ආසන්න ව. එක් සබඳතාවක් 05 දෙනෙකු භාවිත කළත් එකල මෙරට අන්තර්ජාලය භාවිත කළ සමස්තය 150,000කට වැඩි නොවූ බවයි ශ්‍රී ලංකාවේ අන්තර්ජාල ඉතිහාසයේ පළමු 05 වසර පිළිබඳ පර්යේෂණ කෘතියක් සම්පාදනය කළ චානුක වත්තේගම සහ නාලක ගුණවර්ධන සඳහන් කරන්නේ (Internet in Sri Lanka - The First Five Years-2000)

2000 දශකයේ broadband, DSL සහ Wi-Fi සේවා ආරම්භ වීමත් 2010 වසරින් පසු Mobile Internet සහ 4G තාක්ෂණය භාවිතයට ගැනීමත් සමඟ අන්තර්ජාල භාවිතය වර්ධනය වුණේ විශාල ලෙස. එකල විදුලි සංදේශන අංශයේ සිදු වූ පරිවර්තනීය වෙනස්කම් මේ ශීඝ්‍ර වර්ධනයට හේතු වුණා. ශ්‍රී ලංකාවේ වත්මන් ජනගහනයෙන් 60%-65%ක් පමණ අන්තර්ජාලය භාවිත කරනවා. ඒ අනුව පර්යේෂණ සහ අධ්‍යාපන අරමුණු සඳහා අන්තර්ජාලය ආරම්භ වුවත් අද වනවිට ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සේවාවක් බවට එය පත් ව අවසන්.

බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ සමස්ත සෙලියුලර් ජංගම දුරකතන සම්බන්ධතාවල ශීඝ්‍ර වර්ධනය, සමාජ මාධ්‍ය ප්‍රචලිත විමට පහසුවක් වී තිබෙනවා. 2025 වසර අගභාගයේදී මෙරට ජංගම දුරකතන සබඳතා මිලියන 30.3ක් ක්‍රියාකාරී වූ අතර එය මුළු ජනගහනයෙන් 130%ක්. මේ සම්බන්ධතාවලින් සමහරකට හඬ සහ කෙටි පණිවිඩ වැනි සේවා පමණයි ඇතුළත් ව තිබුණේ. ඇතැම් දුරකතනවලට අන්තර්ජාල ප්‍රවේශ ද තිබුණේ නැහැ. එහෙත් 2025 වසර අවසානය වනවිට ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය භාවිත කරන පුද්ගලයන් සංඛ්‍යාව මිලියන 13.9ක් වුණා. ඒ වන විට සක්‍රිය අන්තර්ජාල භාවිතය 59.7%ක් ලෙසයි වර්තා වන්නේ. එයිනුත් 2025 ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය පරිශීලක අනන්‍යතා මිලියන 9ක් වූ බව සඳහන්. එය මුළු ජනගහනයෙන් 38.7%ක්. ඉන් 52.5%ක් වයස 18+ වන අතර 56.6%ක් පුරුෂයන්. මේ පරිශීලකයන්ගේ සමාජ මාධ්‍ය වේදිකා භාවිතය දෙස බැලීමේදී වැඩි ම ප්‍රතිශතයක් වාර්තා වන්නේ YouTube වේදිකාවෙන්. එය මිලියන 12ක් පමණ වන අතර මිලියන 10.4-10.9 අතර සංඛ්‍යාවක් Facebook භාවිත කරන්නන්. මෑතකාලයේ හඳුනාගත් TikTok මිලියන 06 දක්වා ශීඝ්‍ර ලෙස වර්ධනය වී තිබෙනවා. Global Web Index 2025 වාර්තා අනුව මෙරට දිනකට ඒක පුද්ගල සමාජ මාධ්‍ය භාවිතය පැය 2 1/2 - 3ක් වන බවයි සඳහන් වන්නේ.

| **ඒක පුද්ගල සමාජ මාධ්‍ය භාවිතය (ආසන්න ප්‍රතිශතයට) (2025)** | |
|---|---|
| සන්නිවේදනය | 80% |
| විනෝදාස්වාදය | 70% |
| ප්‍රවෘත්ති ලබා ගැනීම | 55% |
| ව්‍යාපාර සහ අලෙවිකරණය | 40% |
| අධ්‍යාපනය | 35% |

Global Web Index



Social media ලෝකයට ජනප්‍රිය කළ Mark Zuckerberg

මෙරට සන්නිවේදන ඉතිහාසයේ අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය බිහිවීම සැලකෙන්නේ විශාල සමාජ පරිවර්තනයක් සිදු කළ යුගයක් ලෙස. දුරකතනය සහ රූපවාහිනිය පසුකරමින් අද සමාජ මාධ්‍ය ජනතාවගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී තිබෙනවා. නවතම ඩිජිටල් පර්යේෂණ දත්ත අනුව ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය භාවිත කරන්නන් සංඛ්‍යාව මිලියන 9කට ආසන්න ව පවතින අතර එය සන්නිවේදනය, ආර්ථිකය සහ ජනමත ගොඩනැගීම කෙරෙහි ඇති කර තිබෙන්නේ දැඩි බලපෑමක්.


සමාජ මාධ්‍ය භාවිතය ජනප්‍රිය වීමට ප්‍රධාන හේතුව සම්බන්ධතා පහසු වීම. විදේශ රැකියා කරන ශ්‍රී ලාංකිකයන්ට

පවුල් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට WhatsApp, Facebook, Messenger වැනි සේවා වැදගත් වේදිකා බවට පත්වීම සමාජමය වෙනසකට ද හේතුවක්. පෙර විශාල මුදලක් මේ සඳහා වැය කළ යුතු ව තිබුණත් රටට වැඩි විනිමයක් සොයා දෙන විදේශ සේවා නියුක්තිකයන්ට සිය ආර්ථික සහ සමාජ සම්බන්ධතා පවත්වාගෙන යාමට මෙය ලාබදායී මඟක් වී තිබෙනවා. Facebook සහ YouTube වැනි වේදිකා ප්‍රවෘත්ති ලබා ගැනීමේ ප්‍රධාන මාර්ග ලෙස ද වර්ධනය වීම, තරුණ පරම්පරාව අතර TikTok සහ Instagram වැනි වීඩියෝ පදනම් වූ වේදිකා විනෝදාස්වාද සංස්කෘතිය නව ආකාරයකට පරිවර්තනය වෙමින් පැවතීම පෙන්නුම් කරන්නේ සාම්ප්‍රදායික මාධ්‍යයට වඩා නව මාධ්‍යය ඔවුන්ගේ එක ම මාධ්‍යය බවට පත් ව තිබීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට ද සමාජ මාධ්‍ය සපයමින් තිබෙන්නේ නව අවස්ථා. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් Facebook සහ Instagram ඔස්සේ තම වෙළෙඳපොළ පුළුල් කරමින් සිටිනවා. ගෘහස්ථ ව්‍යාපාර, Online Marketing සහ Influencer Economy වැනි නව ආදායම් මාර්ග සමාජ මාධ්‍ය ඔස්සේ ගොඩනැගීම දිනපතා වර්ධනය වන්නක්. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද YouTube සහ Digital Learning Platforms භාවිතය වැඩි වී තිබෙනවා. විශේෂයෙන් කොවිඩ් 19 වසංගත සමයේ පැවැතුණු හුදෙකලා වාතාවරණය මේ ගමන වේගවත් කළා.


## භාවිතයේ ගැටලු, අභියෝග සහ අවස්ථා


සමාජ මාධ්‍ය වර්ධනය සමඟ ගැටලු සහ අභියෝග රැසක් ද මතුවෙමින් තිබෙනවා. වැරදි තොරතුරු සහ Fake News ප්‍රචාරය ශ්‍රී ලංකාවේ විශාල සමාජ ගැටලුවක්. විශේෂයෙන් දේශපාලන හා ආගමික සංවේදී කාලවලදී වැරදි තොරතුරු ඉක්මනින් පැතිරීම සමාජ ආරක්ෂාවට හා ජනමත ගොඩනැඟීමට බලපෑ ආකාරය ආගමික නොසන්සුන්තා ඔස්සේ දක්නට ලැබුණා. මේ තත්ත්ව හමුවේ මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත වැනි නිතිමය අණපනත් ගෙන ඒම මෙන් ම බාල වයස්කරුවන්ගේ සමාජ මාධ්‍ය තහනම් කිරීම් වැනි නව සංවාද ද ඇති වී තිබෙනවා.




තරුණ පිරිස අතර සමාජ මාධ්‍ය ආසක්තතාව (Digital Addiction) වැඩිවීම මානසික සෞඛ්‍ය ගැටලු නිර්මාණය වීමට තවත් හේතුවක් වී ඇති බවයි පර්යේෂකයන් පවසන්නේ. මේ තත්ත්වය වැඩිහිටි පුරවැසියන් කෙරෙහි ද බලපා තිබෙනවා. Cyberbullying, Online Harassment සහ පුද්ගලික දත්ත ආරක්ෂාව පිළිබඳ ගැටලු ද වර්ධනය වෙමින් පවතිනවා. පර්යේෂණ දත්ත පෙන්වන්නේ සමාජ මාධ්‍ය භාවිතය වැඩිවීම සමඟ Privacy Risks සහ Online Scams වර්ධනය වන බව.

ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය භාවිතය ගොඩනැගෙන්නේ තොරතුරු හුවමාරුවේ, සන්නිවේදනයේ සහ Online Economyහි විශාල අවස්ථා ලබා ගැනීමේ හැකියාවක් සමඟ. එහෙත් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (Sri lanka CERT) වාර්තා පෙන්වා දෙන පරිදි සමාජ මාධ්‍ය වේදිකා භාවිත කරමින් සිදු වන Cybercrime, Scams, Account Hacking, Phishing සහ Misuse වැනි අපරාධ සමාජයට හා



ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරමින් තිබෙනවා.

සමාජ මාධ්‍ය ඔස්සේ ලැබෙන තොරතුරු සත්‍ය ද? අසත්‍ය ද? යන්න හඳුනා ගැනීමේ දක්ෂතාව (ඩිජිටල් සාක්ෂරතාව) සියලු ජන කොටස්වල සමාන ව නොමැති බව පර්යේෂණවලින් හෙළි වන්නක්. මෙය Misinformation ව්‍යාප්තියට ද හේතුවක්. ශීඝ්‍රයෙන් වර්ධනය වන AI තාක්ෂණය මේ තත්ත්වය තවදුරටත් සංකීර්ණ කරමින් සිටිනවා.

මේ පිළිබඳ සැලකිල්ලට ගනිමින් සමාජ මාධ්‍ය භාවිතය සඳහා වගකීම් සහගත සංස්කෘතියක් ගොඩනැඟීම අත්‍යවශ්‍යයි. ඩිජිටල් සාක්ෂරතා වැඩසටහන්, සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම් සහ වගකීම් සහගත මාධ්‍ය භාවිතය ප්‍රවර්ධනය රටට ඉතා ම වැදගත්. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදී මේ අවශ්‍යතා හඳුනාගෙන තිබීම සහ විෂය මාලාවට සයිබර් සහ ඩිජිටල් සාක්ෂරතාව ඇතුළත් කර තිබීම සාධනීය ආරම්භයක්.

සමාජ මාධ්‍ය ආර්ථික අවස්ථා සාර්ථක ව භාවිත කිරීමටනම් ප්‍රතිපත්ති මට්ටමින් සවිස්තරාත්මක හා සම්මත ක්‍රියාමාර්ග ගැනීම වැදගත්. ඩිජිටල් ව්‍යාපාර සඳහා පැහැදිලි නියාමන සහ බදු රාමුවක් හඳුන්වා දීමට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සමාජ මාධ්‍ය වෙළෙඳාමට සහාය වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහ ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් යටිතල පහසුකම් වර්ධනය සඳහා මූලිකත්වය දීමට රජයේ අවධානය යොමු කිරීම අවශ්‍ය වෙනවා. එමෙන් ම සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීමෙන් සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීමෙන් සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකෙරෙන වෙළෙඳාම පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැඟිය යුතුයි. මෙහිදී රජය, පෞද්ගලික අංශය සහ අධ්‍යාපන ආයතන එක් ව ක්‍රියා කළහොත් ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථික සංවර්ධනයට බලපාන ප්‍රබල මෙවලමක් බවට සමාජ මාධ්‍ය පත් වීම වැළැක්විය නොහැකි වනු ඇති. මේ වනවිට හඳුන්වා දී ඇති ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය හා නව ප්‍රතිසංස්කරණවලින් මේ මූලික කරුණු රැසකට අඩිතාලම දමා තිබීම සුබදායී ලකුණකි.




# දැන සැරිසරන්න



**වරුක දමුණුපොල**
ප්‍රධාන තොරතුරු ආරක්ෂක ඉංජිනේරු
ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය
(Sri lanka CERT)

සමාජ මාධ්‍ය භාවිතයේදී සයිබර් ආරක්ෂාව යන්න ඉතා වැදගත්. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරෙන්නේ තොරතුරු ආරක්ෂා කිරීම සහ පෞද්ගලිකත්වය සම්බන්ධ තොරතුරු ආරක්ෂා කිරීම කෙරෙහි. ඒ සඳහා පරිශීලකයන් කළ යුත්තේ තමන්ගේ පෞද්ගලික තොරතුරු හඳුනා ගැනීමට අදාළ දේ සමාජ මාධ්‍යයේ පළ කිරීමෙන් මෙන් ම වෙනත් පාර්ශ්වයක් සමග අනවශ්‍ය තොරතුරු බෙදා හැරීමෙන් වැළකීම. සමාජ මාධ්‍ය මෙන් ම පොදුවේ සයිබර් අවකාශයේ පාවිච්චි කරන ඕනෑ ම මාධ්‍යක් මීට ඇතුළත්.

සමාජ මාධ්‍ය පරිහරණයේදී බොහෝ විට ව්‍යාජ ලෙස සකස් කරන ලද වෙළෙඳ දැන්වීම් ඔස්සේ ව්‍යාජ වෙබ් අඩවියට සම්බන්ධ කර ගනිමින් කරන බලපෑම් බහුල ව දක්නට ලැබෙනවා. මෙහිදී මූලික වශයෙන් සිදු වන්නට පුළුවන් ඔබගේ ජාතික හැඳුම්පත් අංකය, උප්පැන්න සහතික සම්බන්ධ ලිපිගොනු, බැංකු විස්තර වැනි දේ සොරා ගැනීම. මේ නිසා කෙටි පණිවිඩ සේවා, සමාජ මාධ්‍ය හා සම්බන්ධ වයිබර් වැනි කෙටි පණිවුඩ සේවා පිළිබඳ ප්‍රවේසම් විය යුතුයි.

බොහෝවිට ඔබ විසින් ම පළ කළ ඡායාරූපයක් භාවිත කරමින් AI තාක්ෂණයෙන් සකස් කර නිරුවත් දර්ශනයක් වුවත් බෙදා හරින්නට (share) පුළුවන්. එවැනි සිදුවීම් බහුලයි. තමන්ගේ තොරතුරු පළ කරන විට ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු නොකිරීමයි මීට හේතුව. සෑම සමාජ මාධ්‍යයක ම, අන්තර්ජාල ගිණුමක ම ප්‍රධාන ආරක්ෂකයා වන්නේ තමන්ගේ මුර පදය (Password). එම මුරපදය ශක්තිමත් නොවීම, පහසුවෙන් සොයාගත හැකි වීම, මුරපදය මෙන් ම OTP වැනි දේ අවබෝධයකින් තොර ව වෙනත් පුද්ගලයකු සමඟ බෙදා ගැනීම ඉතා අවදානම්. සමාජ මාධ්‍ය භාවිතයේදී පෞද්ගලිකත්වය සම්පූර්ණයෙන් ම සුරකින්නට බැහැ. යම් හෝ පෞද්ගලික තොරතුරක්, ඡායාරූපයක් සමාජ මාධ්‍ය වෙත මුදා හැරෙන්නට පුළුවන්. මේ නිසා තමන් දැනගත යුතුයි සමාජ මාධ්‍ය යෙදුම්වල තිබෙන ආරක්ෂිත සැකසුම් සහ පෞද්ගලිකත්ව සැකසුම් නිසියාකාරයෙන් යොදා ගන්නට. මේ ඔස්සේ තමන් යම් පෝස්ටුවක් පළ කළ විට එය නැරඹිය යුත්තේ කවුරුන් ද? යන්න තීරණය කළ හැකියි තමන්ට ම. නොදන්නා මිතුරු ඇරයුම් (friend request) පිළිගැනීමෙන් වැළකීම, තමන්ගේ මිතුරු ලැයිස්තුව public ලෙස ප්‍රදර්ශනය නොකිරීම මෙන් ම තමන්ගේ දුරකතන අංකය, location බෙදා හැරීමෙන් වැළකීම සමාජ මාධ්‍ය පරිහරණයේදී දැනුවත් විය යුතු කාරණා. යම්කිසි පීඩාකාරී, හිංසාකාරී පෝස්ටු පළ

# විචාරාත්මක චින්තනයෙන්
# මාධ්‍ය භාවිතය



**ඉසුරු සමරතුංග**
පර්යේෂණ කළමනාකරු
LIRNEasia

ව්‍යාජ තොරතුරු යන විෂයය ඉතා සංකීර්ණ වූවක්. එය තොරතුරක් වැරදි ද? හරි ද? යන්න තීරණය කිරීමෙන් පමණක් නිමාවට පත් වන්නේ නැහැ. එය මිනිසුන්ගේ හැසිරීම්, තාක්ෂණික පද්ධති, ආර්ථික වුවමනා, දේශපාලන බලපෑම් සහ බල අරමුණු වැනි කරුණු එකට සම්බන්ධවෙමින් නිර්මාණය වන තොරතුරු පරිසරයකයි ක්‍රියාත්මක වන්නේ. ව්‍යාජ තොරතුරු හඳුනා ගැනීමේදී වැදගත් ම කරුණ වන්නේ එම තොරතුරු ප්‍රචාරය කරන පුද්ගලයාගේ අභිලාෂය කුමක් ද? යන්න සොයා බැලීම. උදාහරණයක් ලෙස කෙනෙකුගේ පෞද්ගලික තොරතුරක් සත්‍ය විය හැකි නමුත් හෙළි කරන්නේ හානි කිරීමේ අරමුණින්නම් එය Malinformation ලෙස සැලකෙනවා. දැන දැන ම වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම Disinformation ලෙසත් නොදැනුවත් ව වැරදි තොරතුරු බෙදාහැරීම Misinformation ලෙසත් හඳුන්වනවා. වෛරී ප්‍රකාශනවල (Hate Speech) ද ඇතුළත් වන්නේ සමාජයට හානි කරන තොරතුරු. මේ සියල්ලෙන් සමාජයට ඇතිවන හානිය, ඒවායේ අරමුණ සහ භාවිතය අනුව වෙනස් වෙනවා.

සමාජ මාධ්‍ය ඔස්සේ ව්‍යාජ පුවත් (Fake News) පැතිරීම අද ලෝකය මුහුණදෙන විශාල ගැටලුවක්. Facebook, x (Twitter), YouTube වැනි සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ වැරදි හෝ තහවුරු නොකළ හෝ තොරතුරු ඉතා වේගයෙන් විශාල පිරිසකට පැතිර යාමයි මීට හේතුව. මෙවැනි ව්‍යාජ තොරතුරු ජනතාව අතර ගැටලු සහ අවුල් ඇති කරමින් පුද්ගලයන්ගේ කීර්තියට හානි කිරීමටත් දේශපාලන අදහස්, මැතිවරණ ප්‍රතිඵල සහ සමාජ සම්මුතියට බලපෑම් කිරීමටත් හේතු වෙනවා. ව්‍යාජ පුවත් බොහෝවිට ජනතාවගේ හැඟීම් උත්තේජනය වන ආකාරයට නිර්මාණය කර ඇති බැවින් පැතිර යන්නේ සත්‍ය තොරතුරුවලට වඩා වේගයෙන්. එබැවින් සමාජ මාධ්‍ය භාවිතය වර්ධනය වන මේ යුගයේ ව්‍යාජ පුවත් පාලනය මහජන විශ්වාසය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ ස්ථායිතාව ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය කරුණක්. මේ පිළිබඳ ව LIRNEasia පර්යේෂණ ආයතනය දීප ව්‍යාප්ත පර්යේෂණයක් කළා.

අප මේ පර්යේෂණය ජාතික මට්ටමින් සිදු කළේ සියලු පළාත් නියෝජනය වන පරිදි සිංහල සහ දෙමළ භාෂා භාවිත කරන, වයස අවුරුදු 18ට වැඩි 2610 දෙනෙකු සහභාගි කර ගනිමින්. ප්‍රමාණාත්මක (Quantitative) සහ ගුණාත්මක (Qualitative) යන ක්‍රම දෙක ම යොදාගෙන සිදු කරන ලද මේ පර්යේෂණයේදී සමීක්ෂණ පත්‍රිකාවලින් දත්ත එකතු කිරීමත් පුද්ගලයන් සමඟ සෘජු සාකච්ඡා පැවැත්වීමත් සිදු කළා. 50%ක් පමණ ජනතාව වැරදි බව දැන දැන ම තොරතුරු ප්‍රචාරය කරන බව මෙහිදී හෙළි වූ වැදගත් කරුණක්. ඔවුන්ගෙන් හේතුව විමසූ විට පවසා තිබෙන්නේ 'මෙය වැරදි බව පෙන්වීමට' තමන් එය බෙදා හැරිය බව. එහෙත් වැරදි තොරතුරු තවදුරටත් පැතිරවීමට එවැනි ක්‍රියා හේතුවක්.

තමන් දරන මතයට, අදහස්වලට වඩා සමීපනම්, එය ඇත්තක් ද? බොරුවක් ද? යන්න විමසනවාට වඩා තමන් සිටින පූර්ව නිගමන සමඟ පෑහෙනවනම් යම් තොරතුරක් ඇත්ත බව විශ්වාස කරන්න සහ තව කෙනෙකු සමඟ බෙදාගන්න තිබෙන හැකියාව වැඩියි. එය දේශපාලනික වෙන්න පුළුවන්. ජාතික හෝ ආගමික හෝ වෙනත් ආකාර හෝ වෙන්න පුළුවන්. ඇතැම් විට එය බොරු බව දැනගෙන වුණත් ළැදියාව, පක්ෂපාතකම මත එවැනි අදහස් ප්‍රචාරය කරන්නට හැකියාව තිබෙනවා.

කිරීමත් බෙදා හැරීමත් නොකළ යුතුයි. සෑම විට ම සමාජ මාධ්‍ය පරිහරණය කළ යුතු වන්නේ ඉතා වගකීමෙන්.

සමාජ මාධ්‍ය ඔස්සේ ව්‍යාපාරවල යෙදීම විටෙක අනතුරුදායක වන්නට පුළුවන්. මෙහිදී ස්වයං රැකියා, වෙනත් ව්‍යාපාර සඳහා සාමාන්‍ය වෙළෙඳ දැන්වීමක් පළ කරනවාට වඩා සමාජ මාධ්‍ය ඔස්සේ ඉතා ඉක්මනින්, වැඩි පිරිසක් සම්බන්ධ කරගත හැකි නිසා එය පහසු ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස (reach වැඩි වීම මත) පෙනී යා හැකියි. එහෙත් ඒ සඳහා සමාජ මාධ්‍ය පරිහරණය කළ යුත්තේ ඉතා ප්‍රවේසමෙන්. තමන් ව්‍යාපාරය සම්බන්ධ දැන්වීමක් සමාජ මාධ්‍යයේ පළ කරන විට ඊට අදාළ පිටුවක් තිබේනම් එහි admin කවුරුන් ද?, එහි අදාළ ආරක්ෂිත ක්‍රමවේද සකස් කර තිබේ ද?, එහි පළ කර තිබෙන්නේ මොනවා ද? යන කාරණා පිළිබඳ විමසිලිමත් වීම වැදගත්. අදළ පිටුවේ ඔබ පොස්ටුව පළ කරන විට එම පිටුව සම්බන්ධයෙන් පිරිස විශ්වාසය ගොඩනගා ගන්නවා. මේ නිසා එම පිටුවේ පළ කරන දේ පිළිබඳ ඔබ වග කිව යුතුයි. ඇතැම් විට පෝස්ටුවේ ඵලදායිතාව ඇති කරගන්න වෙළෙඳ දැන්වීම්වලට පවා යොමු වෙන්නට පුළුවන්. ඒ සම්බන්ධයෙන් නිසි අවබෝධයෙන් කටයුතු කළහොත් සමාජ මාධ්‍ය ඵලදායී ව යොදා ගන්නට පුළුවන්.

රටකට සමාජ මාධ්‍ය ආරක්ෂාව ශක්තිමත් කිරීමට ප්‍රතිපත්තිමය තීරණ තිබීම ඉතා වැදගත්. සමාජ මාධ්‍ය ආරක්ෂණය පිළිබඳ බොහෝ විට අප කතා කරන්නේ සමාජ මාධ්‍යවලට අදාළ ව. එසේ නැත්නම් මාර්ගගත ආරක්ෂණය (Online safety) ගැන. මෙහිදී ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri lanka CERT) රාජ්‍ය ආයතන සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී තිබෙනවා. එහිදී වන්නේ රාජ්‍ය ආයතනවල තිබෙන තොරතුරුවල ආරක්ෂණය තහවුරු කිරීම. ඉදිරි වසර හතර සඳහා රටේ ජාතික සයිබර් ආරක්ෂණ ක්‍රමෝපායක් ද ක්‍රියාත්මක වෙනවා. ඒ ඔස්සේ සයිබර් ආරක්ෂණ පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම, සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීමට අවශ්‍ය නීති සකස් කිරීම සිදු වෙනවා. කෙසේ වෙතත් සමාජ මාධ්‍ය භාවිතයේදී තමන්ගේ ආරක්ෂාව තිබෙන්නේ තමන්ගේ දැනුවත් බව සහ ප්‍රවේසම මත.

තොරතුරු ප්‍රචාරය වන ආකාරය භාෂාව සහ ප්‍රදේශ අනුව වෙනස් වෙනවා. පර්යේෂණයේදී සිංහල සහ දෙමළ භාෂාවල තොරතුරු පරිභෝජනය කරන පුද්ගලයන් අතර වෙනස්කම් පවතින බව හඳුනා ගන්නට ලැබුණා. උදාහරණයක් ලෙස දකුණු ප්‍රදේශවල වැදගත් වන දේශපාලන මාතෘකා නොවෙයි උතුරු ප්‍රදේශවල ප්‍රධාන මාතෘකා බවට පත්වන්නේ. සිංහල භාෂාව භාවිත ප්‍රදේශවල වැරදි තොරතුරු පරීක්ෂා කරන මාධ්‍යවේදීන් සහ fact-checking ආයතන වැඩි සංඛ්‍යාවක් පවතින විට දෙමළ භාෂාව භාවිත ප්‍රදේශවල දක්නට ලැබුණේ එවැනි පහසුකම් සීමිත බවක්. මේ නිසා වැරදි තොරතුරු හඳුනා ගැනීමේ හැකියාවට බලපෑම් ඇති වී තිබෙනවා.

වයස හෝ අධ්‍යාපන මට්ටම හෝ මත වැරදි තොරතුරු වැඩිපුර ම ප්‍රචාරය කරන්නේ කවුරුන් ද යන්න පැහැදිලි ව තීරණය කිරීම අපහසුයි. මෙහි ප්‍රධාන ගැටලුව වන්නේ ඩිජිටල් සාක්ෂරතාවේ ඌනතාව. තමන් බෙදා හරින්නේ කුමන තොරතුරක් ද? එය කොතරම් විශාල ප්‍රජාවකට පැතිරෙන්නේ ද? යන්න පිළිබඳ අවබෝධය නොමැති වීම වැරදි තොරතුරු සංසරණය වීමට හේතුවක්. ඇතැම් විට උසස් අධ්‍යාපනය ලද පුද්ගලයන් පවා තමන්ගේ දේශපාලන, ආගමික, සමාජ මතයට ගැළපෙන තොරතුරු සත්‍ය ද? නැද්ද? යන්න නොසලකා බෙදා හරින අවස්ථා තිබෙනවා.

ව්‍යාජ තොරතුරුවල බලපෑම මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ බහුල ව දක්නට ලැබෙනවා. උදාහරණයක් ලෙස කොවිඩ් 19 වසංගතය පැවති කාලයේ සෞඛ්‍ය උපදෙස් පිළිබඳ වැරදි තොරතුරු බොහෝ වශයෙන් පැතිරුණා. ලෝක සෞඛ්‍ය සංවිධානය පවා මෙය Infodemic ලෙස හඳුන්වා තිබුණා. පෝෂණය, එන්නත්කරණය සහ රජයේ ප්‍රතිපත්ති පිළිබඳ වැරදි තොරතුරු ජනතාවගේ තීරණවලට බලපාන්නේ ඍජු ව ම. දේශපාලනික වශයෙනුත් ව්‍යාජ තොරතුරු සමාජ භේද, ගැටුම් සහ විශ්වාස පලුදු කරන්නට පුළුවන්.

සමාජ මාධ්‍ය තොරතුරු පද්ධතියක් ලෙස බලන විට එහි හිමිකාරිත්වය තාක්ෂණික සමාගම් සතු වුවත් අන්තර්ගතය නිර්මාණය කරන්නේ පරිශීලකයන්. මේ අනුව ව්‍යාපාරික හෝ දේශපාලනික අරමුණු මත හෝ වැරදි තොරතුරු ප්‍රචාරය කිරීමට හැකියාව තිබෙනවා. මෙහිදී තාක්ෂණික විධික්‍රම ඔස්සේ එම තොරතුරු පාලනය කළ හැකියි. වෛරල් වන අන්තර්ගත හඳුනාගැනීමට සමාජ මාධ්‍යවල Algorithm පද්ධති භාවිත වන නිසා අවශ්‍යනම් වැරදි තොරතුරක් හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට එයට හැකියාවත් තිබෙනවා.

එසේ ම පරිශීලකයන් විසින් වාර්තා කරන යම්කිසි පුවතක් ප්‍රජා අයිතිවාසිකම්වලට නැත්නම් සාරධර්මවලට යම් ආකාරයක හානිකර බව දුටු විට ඔබට පුළුවන් එය වාර්තා (Report) කරන්න. එම වේදිකාවල උපදේශනවලට කෙතරම්දුරට පෑහෙනවා ද? නැද්ද? යන්න විමසා ඒ අනුව තීරණයක් ගැනීමේ හැකියාවකුත් තිබෙනවා. එහෙත් යාන්ත්‍රික ව මෙය සම්පූර්ණයෙන් ම පාලනය කළ නොහැකියි. එහි බලය තිබෙන්නේ පරිශීලකයන් සතු ව.

සාම්ප්‍රදායික මාධ්‍යවල අන්තර්ගතය තීරණය කරන්නේ පුහුණු මාධ්‍යවේදීන්. ඔවුන්ට ආචාරධර්ම පද්ධති පවතිනවා. එහෙත් සමාජ මාධ්‍යවල ඕනෑ ම පුද්ගලයෙකුට ඕනෑ ම අන්තර්ගතයක් ප්‍රචාරය කළ හැකියි. විශේෂයෙන් WhatsApp වැනි වසා ඇති encrypted මාධ්‍යවල පණිවිඩ පුළුල් ලෙස පාලනය කිරීම අපහසුයි. එවැනි තොරතුරු බොහෝවිට හඳුනාගත හැක්කේ සමාජයට බලපෑමක් ඇති වූ පසුව.

ව්‍යාජ තොරතුරු වැළැක්වීම සඳහා බහුවිධ ප්‍රවේශයක් අවශ්‍ය වෙනවා. නීති හා නියාමන ක්‍රියාමාර්ග, මාධ්‍ය සහ ඩිජිටල් සාක්ෂරතාව වැඩි කිරීම, fact-checking පද්ධති ශක්තිමත් කිරීම සහ Ai තාක්ෂණය භාවිතයෙන් වෛරල් වන තොරතුරු හඳුනා ගැනීම මෙහි§ වැදගත්. ආයතන අතර සම්බන්ධීකරණය වැඩි කිරීමත් අවශ්‍ය වෙනවා.

එහෙත් තාක්ෂණික විසඳුම්වලට වඩා වැදගත් වන්නේ පුද්ගලයන් තුළ විචාරාත්මක චින්තනය වර්ධනය කිරීම. මේ හැකියාව පාසල්, විශ්වවිද්‍යාල සහ මාධ්‍ය ආයතන වර්ධනය කළ යුතුයි. එය ක්ෂණික ප්‍රතිඵල ලබා නොදුන්නත් දිගුකාලීන විසඳුමක් ලෙස සලකන්නට පුළුවන්. විශේෂයෙන් පුද්ගලයන් තොරතුරු බෙදා හැරීමට (Share) පෙර එය සත්‍ය ද? නැද්ද? යන්න සොයා බැලීම සමාජ වගකීමක් ලෙස ගත යුතුයි.

# දැනුමට ඉක්මන් ප්‍රවේශයක්




ආචාර්ය
**මනෝජ් ජිනදාස**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
අංශාධිපති
ජනසන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය


අද මානව සමාජයේ සන්නිවේදන රටා, සමාජ සම්බන්ධතා, දේශපාලන සංවේදනය සහ පුද්ගල ජීවිතය ඩිජිටල් මාධ්‍ය සහ සමාජ ජාල මාධ්‍ය යුගය විසින් විශාල ලෙස වෙනස් කරනු ලැබ තිබෙනවා. 1940 සහ 50 දශකවලදී රූපවාහිනිය සමාජයට පැමිණීමත් සමඟ ළමයින් සහ තරුණයන් දිගු කාලයක් දෘශ්‍ය මාධ්‍ය නැරඹීමට යොමු වුණා. එයින් ඔවුන්ගේ හැසිරීම් රටාවට බලපෑම් සිදු වූ බව මාධ්‍ය පර්යේෂක Melvin L. DeFleur සිය පර්යේෂණවලින් තහවුරු කර තිබෙනවා. එසේ ම කුඩා දරුවන්ගේ කලහකාරී හැසිරීම් හා තරුණයන්ගේ ප්‍රචණ්ඩත්වය වැඩි කිරීමට දෘශ්‍ය මාධ්‍ය නැරඹීම හේතු වූ බවත් පර්යේෂණවලින් පෙන්වා දී තිබෙනවා.

අද ඊටත් වඩා තීව්‍ර ලෙස සමාජ මාධ්‍ය ජාල සහ ඩිජිටල් මාධ්‍ය ඔස්සේ එම බලපෑම සිදු ව අවසන්. සමාජ මනෝවිද්‍යාඥයන්

පෙන්වා දෙන්නේ මෙවැනි මාධ්‍ය භාවිත නිසා 'සාමූහික හුදෙකලාභාවය' ඇති කරන බව. මෙය විශේෂයෙන් කුඩා දරුවාගේ සිට බලපා තිබෙනවා. දරුවා ඉපදී මාස එකහාමාරෙන් දුරකතනයට ප්‍රතිචාර දක්වනවා. මව දරුවා නළවන්නට භාවිත කරන්නේ දුරකතනය. සයිබර්නටික්ස් විද්‍යාඥ Norbert Wiener අනාවැකි පළ කර තිබෙන්නේ මිනිසුන් යන්ත්‍ර සමඟ වැඩි සම්බන්ධතාවක් ඇති කරගෙන, තමන්ට ආසන්න මිනිසුන්ගෙන් දුරස්වීමට ඉඩ ඇති බව. අද සමාජයේ මේ අනාවැකිය සැබෑ වී තිබෙනවා.

ඩිජිටල් මාධ්‍ය යුගයේ තවත් වැදගත් සංසිද්ධියක් වන්නේ 'ඩිජිටල් ජානපදිකයන්' හෝ digital natives හෝ ලෙස හැඳින්වෙන පරම්පරාවක් බිහිවීම. **Mark Fenty** යන සමාජ විද්‍යාඥයා මේ අදහස ඉදිරිපත් කර තිබෙනවා. 1995න් පසු උපන් පරම්පරාව තාක්ෂණය සමඟ වැඩෙන නිසා ඔවුන්ට මේ පරිසරයට හුරු වීම පහසුයි. එම පරම්පරාවට දරා ගැනීමේ හැකියාව තිබුණත් වැඩිහිටි පිරිස් මේ පරිසරයට හුරු වීමේ අපහසුතාවට මුහුණදෙන බව පර්යේෂණවලින් හෙළි වී තිබෙනවා. ප්‍රසිද්ධ සංස්කෘතික විද්‍යාඥයෙකු (cultural theorist / media scholar) සහ ජනමාධ්‍ය අධ්‍යයන විශේෂඥයකු වන **Henry Jenkins** පෙන්වා දෙන්නේ නව මාධ්‍ය භාවිතයේදී ප්‍රේක්ෂකයන්ට විචාරාත්මක අවබෝධය සහ මාධ්‍ය සාක්ෂරතාව ඉතා වැදගත් බව.

දේශපාලන ක්ෂේත්‍රයට ද ඩිජිටල් මාධ්‍ය විශාල බලපෑමක් ඇති කර තිබෙනවා. තොරතුරු ප්‍රවාහය ජනතාව බලගැන්වීමට උපකාරී වුවත් ව්‍යාජ තොරතුරු, මිතුරන්ගෙන් ලැබෙන තොරතුරු හා ආවේගාත්මක, ප්‍රකෝපකාරී දේශපාලන ප්‍රචාර ජනතාවගේ තීරණවලට බලපෑම් කරනවා. මේ තත්ත්වය විග්‍රහ කළ සන්නිවේදන විද්‍යාඥ Manuel Castells පෙන්වා දෙන්නේ ඩිජිටල් ජාල සමාජයේ දේශපාලන බලය නව ආකාරයකට බෙදා හැරෙමින් ඇති බව. ඔහුට අනුව ජාල සමාජය තුළ බලය සමාජ සම්බන්ධතා මත ක්‍රියා කරනවා. සමාජ මාධ්‍ය, සමාජ බලපෑමක් ඇති කරන්නේ සක්‍රිය ජන පිරිසකින්.

සමාජ ජාල මාධ්‍යවල අලුත් ආර්ථික සහ දේශපාලන බල පද්ධතියක් ද වර්ධනය වී තිබෙනවා. ආර්ථික විද්‍යාඥයෙකු (Economist) සහ දේශපාලන විශේෂඥයකු වන Yanis Varoufakis මේ සම්බන්ධයෙන් හඳුන්වා දී තිබෙනවා 'Techno-Feudalism' යන නව සංකල්පයක්. ඔහුට අනුව තාක්ෂණික සමාගම් සහ ඩිජිටල් වේදිකා මගින් බලය සහ ආර්ථික වාසි කිහිපදෙනෙකු අතට සංකේන්ද්‍රණය වෙමින් සමාජය නව වහල්භාවයකට පත් විය හැකියි. Techno-Feudalism යනු තාක්ෂණය, ආර්ථික බලය සහ සමාජ පාලනය එකට සම්බන්ධ කරන නව පද්ධතියක්. සමාජ මාධ්‍ය, ඩිජිටල් සේවා සහ ගෝලීය තාක්ෂණික සමාගම් භාවිතය තුළ ජනතාව වඩාත් user-subject එකක් ලෙසයි පවතින්නේ. ඩිජිටල් මාධ්‍යයේ තවත් සමාජ බලපෑමක් වන්නේ තොරතුරු පිළිබඳ විශ්වසනීයත්වයේ අඩු වීම. Fake news, Misinformation, deepfake ආදිය නිසා පරිශීලකයන්ගේ යථාර්ථ අවබෝධය අවුල් කරනවා. මෙවැනි තොරතුරු නිසා සමාජයේ දේශපාලන තීරණ, මැතිවරණ හැසිරීම් සහ ජනමතය විකෘති විය හැකියි. තවදුරටත් මේ මාධ්‍ය භාවිතය පුද්ගල මානසික සෞඛ්‍යයට බලපාන බව පර්යේෂණවලින් පෙන්වා දී ඇති කරුණක්. සමාජ ජාල භාවිතය විසින් මත්ද්‍රව්‍ය භාවිතයට සමාන ඇබ්බැහිවීමක් ඇති කරනු ලබන බවත් එය මොළයේ ස්නායු රසායන ක්‍රියාවලියට බලපාන බවත් ඔවුන් පෙන්වා දෙනවා.

ඩිජිටල් මාධ්‍ය යනු සම්පූර්ණයෙන් ම නරක බලපෑමක් ඇති කරන්නක් ලෙස අන්තගාමී විය නොහැකියි. එය දැනුම ලබා ගැනීමේ ඉක්මන් ප්‍රවේශයක් ලෙස අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, ලෝකය පිළිබඳ අවබෝධය වැඩි කිරීම සහ සමාජ සංවර්ධනයට දායක වීම වැනි යහපත් ප්‍රතිඵල ළඟා කර දෙනවා. එහෙත් මේ වාසි ලබා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලි බුද්ධිය සහ සන්නිවේදන අධ්‍යාපනය තිබිය යුතුයි.

මේ මාධ්‍ය පරිසරය පුද්ගල අන්තර් සම්බන්ධතා වෙනස් කරන බව ඉතා පැහැදිලියි. පවුල් සම්බන්ධතා, ගුරු-සිසු සම්බන්ධතා, මිතුරු සම්බන්ධතා දුර්වල වී තිබෙනවා. ඒ වෙනුවට ව්‍යාජ සමාජ සම්බන්ධතා සහ මාර්ගගත හැඳුනුම්කම් වැඩි වීමක් දැකගත හැකියි. මෙය විශේෂයෙන් වැඩෙන වයසේ දරුවන්ට අනතුරුදායක තත්ත්වයක්. ඔවුන් සයිබර් අපරාධ, මූල්‍ය වංචා, ලිංගික අපහරණය වැනි අවදානම්වලට පහසුවෙන් ලක් වීමේ සම්භාවිතාව වැඩියි.

කෙසේ වෙතත් ඩිජිටල් මාධ්‍ය යනු සම්පූර්ණයෙන් ම නරක බලපෑමක් ඇති කරන්නක් ලෙස අන්තගාමී විය නොහැකියි. එය දැනුම ලබා ගැනීමේ ඉක්මන් ප්‍රවේශයක් ලෙස අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, ලෝකය පිළිබඳ අවබෝධය වැඩි කිරීම සහ සමාජ සංවර්ධනයට දායක වීම වැනි යහපත් ප්‍රතිඵල ළඟා කර දෙනවා. එහෙත් මේ වාසි ලබා ගැනීමට මාධ්‍ය සාක්ෂරතාව, විචාරශිලි බුද්ධිය සහ සන්නිවේදන අධ්‍යාපනය තිබිය යුතුයි.

මේ ගැටලුවලට විසඳුමක් ලෙස පර්යේෂකයන් සහ විද්‍යාඥයන් යෝජනා කරන්නේ මාධ්‍ය අධ්‍යාපනය ජාතික අධ්‍යාපන පද්ධතියට ඇතුළත් කිරීම. විශේෂයෙන් කුඩා වයසින් ම දරුවන්ට සමාජ මාධ්‍ය භාවිතයේ වාසි සහ අවදානම් පිළිබඳ දැනුවත් කිරීම වැදගත්. නීති පැනවීම පමණක් ප්‍රමාණවත් නැහැ. සමාජයේ දැනුවත් භාවිතය ප්‍රවර්ධනය කළ යුතුයි.

මේ අනුව සමස්තක් ලෙස බලන විට ඩිජිටල් සහ සමාජ ජාල මාධ්‍ය යනු සමාජය, දේශපාලනය, ආර්ථිකය සහ පුද්ගල ජීවිතය වෙනස් කරන බලවත් ශක්තියක් බව පැහැදිලියි. එය අවස්ථා සහ අවදානම් දෙක ම ගෙන එන්නක්. එම නිසා මේ තාක්ෂණය නිසි අධ්‍යාපනය, ප්‍රතිපත්ති සහ සමාජ දැනුවත්භාවය මත පදනම් ව භාවිත කළහොත් පමණක් සමාජයට හිතකර ප්‍රතිඵල ලබා ගත හැකි වනු ඇති.

# ජෛවීය උරුමය

රංගිකා අබේසේකර

ජෛව විවිධත්වය පිළිබඳ සංකල්පය විද්‍යාත්මක ලෝකයට ඇතුළු වී සංරක්ෂණ ක්ෂේත්‍රයට පිවිසියේ 1970 ගණන්වලදී. ඒ යුගයේදී එම සංකල්පය ජාත්‍යන්තර සම්මුති හා ඒකාබද්ධ වූ අතර ජාත්‍යන්තර ජෛව විවිධත්ව සංරක්ෂණ මතවාද ශ්‍රී ලංකාවේ සංරක්ෂණ මූලධර්ම ඇති කිරීමට ද සමත් වුණා. ඊට සමගාමීවයි ශ්‍රී ලංකාව ඊට අදාළ ජාත්‍යන්තර සම්මුති සමඟ ඒකාබද්ධ වුණේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් රන්ජන් මාරසිංහ සඳහන් කරන ආකාරයට මෙරට වන සත්ත්ව හා වෘක්ෂලතා සහ ඒවායේ වාසස්ථාන ආරක්ෂා කිරීම, සංරක්ෂණය හා ඒවා සඳහා ඇති වාණිජමය සහ වෙනත් අනිසි භාවිත වැළැක්වීම, වඳවීමේ තර්ජනයට ලක් ව ඇති වන සත්ත්ව හා වෘක්ෂලතා විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය (CITES - Convention on International Trade in Endangered Species of wild fauna and flora) ක්‍රියාත්මක කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම් අතරට අයත්.

1973 වසරේදී වඳවීමේ තර්ජනයට ලක් ව ඇති වනසතුන් සහ ශාක විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතිය අත්සන් කිරීමේ සංවත්සරය සැමරීම සඳහා යොදා ගත්තේ මාර්තු 03 දින. එම දිනයයි නිල වශයෙන් ලෝක ජෛව විවිධත්වය දිනය බවට පරිවර්තනය කර ගත්තේ. මේ සම්මුතියේ සාමාජික රටවල සමුළුවේදී තායිලන්තය විසින් කරන ලද යෝජනාවකට අනුව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය 2013 වසරේ දෙසැම්බර් 20 දින 'ලෝක වනජීවී දිනය' ස්ථාපිත කළා. 2014 වසරේදී එහි සමාරම්භක සැමරුමේ සිට පාරිසරික, ජානමය, සාමාජීය හා ආර්ථික වැදගත්කම දක්වා වනසතුන් සහ ශාකවල බහුවිධ වටිනාකම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා එම දිනය තීරණාත්මක වේදිකාවක් බවට වර්තමානයේ පරිණාමය වී තිබෙනවා.

සෑම වසරක ම නිශ්චිත තේමාවක් සහිත ව සමරන ලෝක වනජීවී දිනයේ 2026 වසරේ තේමාව වන්නේ "ඖෂධීය හා සුවඳවත් ශාක, සෞඛ්‍ය, උරුමය සහ ජීවනෝපාය සංරක්ෂණය කිරීම (Medicinal and Aromatic Plants, Conserving Health, Heritage and Livelihoods) යන්න. ඒ අනුව ඖෂධීය සහ සුවඳවත් ශාක කෙරෙහි අවධානය යොමු කිරීම, මානව සෞඛ්‍යය සහ



*Nepenthus*

ජීවනෝපාය විවිධ පරිසර පද්ධතිවල පැවැත්මට වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීම මෙවර අරමුණු කර තිබෙනවා.

ජීවියෙකුගේ පැවැත්ම තීරණය වන්නේ සොබාදහම හා බද්ධවීම මත. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි; "මෙවර ලෝක වනජීවී දිනයේ තේමාව වෙනත් වසරවලට සාපේක්ෂ ව වෙනස් මුහුණුවරක් ගන්නවා. මේ සංකල්පය යල්පැන ගිය අදහසක් ලෙස ඇතැමෙකුට තර්ක කිරීමට පුළුවන්. ඖෂධ ශාක හඳුනාගැනීමට නොහැකි වීම රටක පුරවැසියන් වශයෙන් අපගේ දුර්වලතාවක්. මේ සම්බන්ධයෙන් සාක්ෂරතාව ඇති කිරීමේ වසරක් ලෙස 2026 වසරේ තේමාව ලබා දී තිබෙනවා. වනජීවී දිනය යන්න විමසීමේදී සතුන් පිළිබඳ ඇති දිනයක් ලෙස සිතන්නට පුළුවන්. එහෙත් ශාක ගැන සිතිය යුතුයි. ශාක හා බැඳුණු දේශීය කර්මාන්ත තිබෙනවා. ඒවා ආරක්ෂා කිරීම වගකීමක්".

මෙවර තේමාව ශ්‍රී ලංකාවට වඩා වැදගත්. ඊට හේතුව මෙරට ඉතිහාසයට අනුව වනාන්තරයක් යනු ඖෂධාගාරයක්. වර්තමානය වන විට බොහෝ පිරිසකගේ සොබාදහම පිළිබඳ ඇති ආකල්පය සහ ඒ හා බැඳුණු ජීවිතය දුරස් වූවක්. එයට ප්‍රබල හේතුවක් වන්නේ ඖෂධ පවා එන්නතක් ලෙස හෝ බෙහෙත් පෙත්තක් ලෙස හෝ සැකසීමකට භාජනය කළ දෙයක් ලෙස භාවිතයට පැමිණීම. ඖෂධය සැකසූ අමුද්‍රව්‍ය පිළිබඳ ව අදහසක් ඇති වන්නේ නැහැ. එහෙත් ඖෂධ වර්ග ආනයනයට පෙර යුගවලදී අපේ පැරැන්නන් වනාන්තරවලින් සපයාගත් ඖෂධ ද්‍රව්‍ය සුදුසු මාත්‍රා අනුව භාවිතයට ගත්තා. එය ඔවුන්ගේ ජීවනෝපාය හා බැඳුණු සංස්කෘතික උරුමයක් ලෙසයි පැවැතියේ.

මෙරට වනාන්තර ආශ්‍රිත ව ජීවත්වන ප්‍රජාව ඖෂධ ද්‍රව්‍ය විශාල වශයෙන් වනාන්තරවලින් එක්රැස් කරනවා. බොහෝ ප්‍රදේශවල අරළු, බුළු, නෙල්ලි, කොතලහිඹුටු, මී පැණි, බඹර පැණි, බිං කොහොඹ, වළඳ සහල්, රසකිඳ, නාමල් රේණු, කුඹුක් පොතු, ඇහැළ පොතු, මී මල්, කොහොඹ මල් වැනි විවිධ ශාකවල සෑම කොටසක් ම ආහාර සඳහා හෝ ඖෂධ සඳහා හෝ භාවිත කරන ආකාරයක් දැකගත හැකියි. එහෙත් අවාසනාවකට බොහෝ ඖෂධ වර්ග හඳුනාගැනීමට වර්තමානයේ බොහෝ දෙනෙකුට හැකියාව සහ දැනුම නොමැති බවයි මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි අවධාරණය කරන්නේ.

අදහස් දක්වන ඇය; "වනාන්තරවලින් එකතු කරන, දැව නොවන ශාක ද්‍රව්‍ය තිබෙනවා ( Non Timber Forest Produce). ඒවා මෙරටට වටිනාකමක් ලබා නොදී මෙරටින් පිට ව යන අවස්ථා දැක ගැනීමට පුළුවන්. ශාකයකට තවත් පරම්පරාවක් ඇති කිරීමේ අවස්ථාව වර්තමානය වන විට අහිමි කර තිබෙනවා. අඛණ්ඩ ව ඉදිරියටත් මෙලෙස සිදු කළහොත් ඒ ඒ ශාක ඇතිවීම සඳහා පසේ ඇති බීජ බැංකුව (Feed Bank) විනාශ වී යනු ඇති. එවිට නැවත නැවත පැළ ඇති කිරීමේ කාර්යය සිදු කිරීමට අවකාශය

හිමි නැහැ. එය සිදුවන්නේ ශාකයක මල්, ඵල සෑදීමට ප්‍රථම ශාක ගලවා ගැනීම හේතුවෙන්. ශ්‍රී ලංකාවේ ඇති සෑම පැළයක ම කුමන හෝ ආකාරයේ ඖෂධ ගුණයක් අන්තර්ගත වෙනවා. විශේෂයෙන් ගෙවත්තේ ඇති ඖෂධ පවා වල් පැළ ලෙස උගුල්ලා දමන අවස්ථා වර්තමානයේ දැක ගැනීමට පුළුවන්".

තාක්ෂණයත් සමඟ ඉදිරියට යන ලෝකයේ මේ ශාකවල විවිධත්වය තේරුම්ගෙන, ඒවා වනයෙන් පිටතට ගෙනැවිත් ප්‍රජාව සම්බන්ධ කරගෙන ගෘහාශ්‍රිතකරණය කිරීමට අවධානය යොමු කිරීමෙන් එම ඖෂධීය ශාක වඳ වී යාම අවම කිරීමට පුළුවන්. මෙහිදී නැවත ප්‍රරෝහණය කිරීමේ ක්‍රමවේද පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත්. මහාචාර්යවරිය සඳහන් කරන ආකාරයට මේ සඳහා අවශ්‍ය පාරිසරික තත්ත්ව මොනවාද යන්න අධ්‍යයනය කළ යුතු අතර එම දැනුම ප්‍රජාව වෙත ගෙන යාමේ ක්‍රමවේදයක් ද තිබිය යුතුයි.


සොබාදහම හා බැඳුණු ශිෂ්ටාචාරයක් මෙන් ම ඒ හා බැඳුණු මානව ක්‍රියාකාරකම් ද තිබෙනවා. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ නයිට්‍රජන් අඩු ස්ථානවල වැවෙන බාඳුරා



Thottea siliquosa

නම් මාංශ භක්ෂක ශාකය (Nepenthus) එම ප්‍රදේශවල ඖෂධයක් ලෙස යොදා ගන්නා අවස්ථා දැක ගන්නට පුළුවන්. මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි පවසන්නේ බාඳුරා මලේ කෙණ්ඩිය ඇතුළේ තිබෙන වතුර, බහතේරීම ප්‍රමාද දරුවන්ට පෙවීම එකල චාරිත්‍රයක් වූ බව සහ අදටත් එම ප්‍රදේශවල උරුමය හා බැඳුණු එවැනි චාරිත්‍ර දැක ගන්නට පුළුවන් බව. 2025 වසරේ කිතුල් මැදීම සඳහා භාවිත කරන ලද පුරාණ දේශීය තාක්ෂණය යුනෙස්කෝ සංවිධානය මානව වර්ගයාගේ අස්පර්ශනීය සංස්කෘතික උරුම ලැයිස්තුවේ (Intangible Cultural Heritage) ලියාපදිංචි කර තිබෙනවා. එහිදී සඳහන් කර ඇත්තේ මේ අනන්‍යතාව ශ්‍රී ලාංකික ජනතාව සහ සොබාදහම අතර ශක්තිමත් සම්බන්ධතාවක් නිර්මාණය කිරීමට සමත් වන බව.

ඇතැම් ශාක සංරක්ෂණය කර තිබුණත් ඉතා භයානක අයුරින් පුද්ගලයන් සංවිධානය වී ශාක ජාවාරම සිදුකරන ආකාරයක් දක්නට පුළුවන්. එයයි ප්‍රධාන ගැටලුවක් ව තිබෙන්නේ. CITES සම්මුතියට ශ්‍රී ලංකාව ද 1979 වසරේදී අත්සන් කර තිබෙනවා. ඒ අනුව බොහෝ ශාක මේ සම්මුතියේ ලැයිස්තුගත වනවා. ඕකිඩ්, වල්ලපට්ට වැනි ශාකවල සියලු ම කොටස් භාවිතය සඳහා යොදාගන්නා බවත් ඒවා අන්තර්ජාතික වෙළෙඳාමේ ඉලක්ක වී ඇති බවත් තාක්ෂණය නිසි අයුරින් භාවිත කිරීමෙන් මේ ප්‍රධාන ගැටලු අවම කිරීමේ හැකියාව තිබෙන බවත් මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි සඳහන් කරනවා. ඒ පිළිබඳ අදහස් දක්වන ඇය; "වනජීවී, වන සංරක්ෂණ, රේගු, පොලිස් වැනි ආයතනවල නිලධාරින්ට ජාත්‍යන්තර වෙළෙඳාමට ලක් වන ඖෂධ වර්ග සහ සුවඳවත් ශාක පිළිබඳ ව දැනුම පුළුල් කළ යුතු වනවා. ඊට අමතර ව



Aristolochia bracteolata

තාක්ෂණය ඊට බද්ධ කළ යුතුයි. ලෝකයේ දැනටමත් මේ සඳහා තාක්ෂණික මෙවලම් භාවිත කරනවා. HPLC (High Pressure Analytical Technique Use To Separat, Identify And Quantify Compouents Within a Liquid mixture), Mass Spectrometry, Mass Photometry වැනි විවිධාකාර තාක්ෂණ ක්‍රමවේද ද එහිදී යොදා ගැනෙන්නේ ශාකයේ පවතින සුවිශේෂ ජානමය සහ රසායනික සංයුතිය හඳුනා ගැනීමට. මේ තාක්ෂණය ශ්‍රී ලංකාවේ දැනට යොදා ගන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත්. ජාවාරම්කරුවන් කරන විවිධ නිෂ්පාදන ඔස්සේ මෙරටින් මේ ශාක ද්‍රව්‍ය අපනයනය නැවැත්වීමට තාක්ෂණික ක්‍රමවේද වඩා වැදගත්".




Cissus quadrangularis

ප්‍රරෝහණය කරන ක්‍රමවේදය, නව ප්‍රභේද ඇති කිරීමේ ජානමය තාක්ෂණය ගැන විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, පර්යේෂකයන් පර්යේෂණ සිදු කළ යුතුයි. ශ්‍රී ලංකාව ආනයනික ප්‍රතිජීවක ඖෂධ විශාල ලෙස භාවිත කරන රටක්. එහෙත් ඒවා භාවිතය අවම කර උචිත ලෙස මෙරට ඖෂධ ශාකවලින් භාවිත කර බෙහෙත් වර්ග නිෂ්පාදනය කෙරෙහි පර්යේෂණවල නියැළීම අනාගතයේදී වඩා වැදගත් වනු ඇති.

මෙරට ඇති දේශීය ඖෂධ ශාක සහ සුවඳවත් ශාක සඳහා වෙනත් රටවල් පේටන් බලපත්‍ර ලබා ගැනීමට පොරබදන සමයක අවශ්‍ය වන්නේ දේශීය අනන්‍යතාව සහිත ව වැඩි ආදායමක් ලබා ගැනීමට නිවැරදි වැඩපිළිවෙළක්. මෙරට පාසල් අවදියේ දරුවාගේ සිට තරුණ පරම්පරාව සොබාදහම වෙත බද්ධ කර ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සාක්ෂරතාව ඇති කිරීමත් ඉතා වැදගත්. එවිට දේශීය ශාක හා බැඳුණු උරුමය ආරක්ෂා කිරීමට අවකාශ හිමිවනු ඇති. මේ අනුව ලෝක වනජීවී දිනය හුදෙක් සැමරීමකට එහා ගිය වනජීවී වෙළෙඳාම සහ වේගවත් වඳවීම මැඩපැවැත්වීමට පාදක වන වේදිකාවක් ලෙස යොද ගැනීමයි කළ යුතු වන්නේ.

# ක්ෂය කළ යුතු ක්ෂය රෝගය



**හර්ෂා සුගතදාස**

හුදෙකලා ආත්මයක වේදනාව අකුරු බවට පත් කළ ලෝක ප්‍රකට නවකතාකරුවෙකු වූ ෆ්රාන්ස් කෆ්කා, ඔහුගේ අකුරු සියල්ල පුළුස්සා දමන ලෙස සිය සමීප මිතුරා වූ මැක්ස් බ්‍රෝඩ්ට පවසා තිබුණා. ඊට හේතුව වූයේ ඒ වන විට කෆ්කා ක්ෂය රෝගයට (Tuberculosis) ගොදුරු වී සිටීම. වයස අවුරුදු 40 පසු වූ කෆ්කා ක්ෂය රෝගයෙන් මරණයට පත්වූයේ 1924 ජූනි 03 දින. එම කාල වකවානුවේදී ක්ෂය රෝගයට ප්‍රතිකාර නොතිබුණත් වර්තමානයේ එය නිට්ටාවට ම සුව කළ හැකි රෝගයක්.

ක්‍රි.ව. 1882දී ක්ෂය රෝගය මයිකෝබැක්ටීරියම් කියුබොකියුලෝයිස් (Mycobacterium Tuberculosis) නම් බැක්ටීරියාවෙන් වැලඳෙන බව රොබට් කොක් නම් වෛද්‍යවරයා සොයා ගත්තා. එහෙත් රෝගය සුවපත් කළ හැකි ඖෂධ සොයා ගත්තේ 1943 වසරේදී පමණ. මේ බැක්ටීරියාව ශරීරගත වන්නේ ශ්වසන මාර්ගයෙන්. ක්ෂය රෝගියෙකුගේ සෙම, කෙළ බිඳිති වාතයට එකතුවීමෙන් රෝගය බෝ වෙන්නට පුළුවන්. මෙය වාතය ඔස්සේ පැතිරෙන නිසා බොහෝ දෙනෙකුට ශරීරගත වීමේ අවදානමක් පවතිනවා. එහෙත් බැක්ටීරියාව ශරීරගත වූ පමණින් එය ක්‍රියාකාරී වන්නේ නැහැ. ආසාදිතයන්ගෙන් 10%ක පමණ පිරිසකටයි එලෙස ක්‍රියාකාරී වන්නේ. සති 2කට වඩා පවතින කැස්ස, සවස් කාලයේ පවතින උණ ගතිය, ශරීරයේ බර අඩු වීම, රාත්‍රියේ අධික ලෙස දහඩිය දැමීම ආදිය ක්ෂය රෝගයේ ලක්ෂණ. මේ එක් ලක්ෂණයක් හෝ පවතීනම් පරීක්ෂාවට යොමු වීම වැදගත්.

බැක්ටීරියාව ශරීරගත වූ පමණින් එය ක්‍රියාකාරී වන්නේ නැහැ. ආසාදිතයන්ගෙන් 10%ක පමණ පිරිසකටයි එලෙස ක්‍රියාකාරී වන්නේ. සති 2කට වඩා පවතින කැස්ස, සවස් කාලයේ පවතින උණ ගතිය, ශරීරයේ බර අඩු වීම, රාත්‍රියේ අධික ලෙස දහඩිය දැමීම ආදිය ක්ෂය රෝගයේ ලක්ෂණ. මේ එක් ලක්ෂණයක් හෝ පවතීනම් පරීක්ෂාවට යොමු වීම වැදගත්.

බැක්ටීරියාව ශරීරයේ සැඟවී සිටිනවා. බැක්ටීරියාව ශ්වසන මාර්ගයෙන් ශරීරගත වන නිසා ක්ෂය රෝගයට වැඩිපුර ම ගොදුරු වන්නේ පෙණහලු. එහෙත් හිසකෙස් සහ නියපොතු හැර ස්නායු පද්ධතිය, වකුගඩු, කොඳුඇට, සම යනාදී වශයෙන් ශරීරයේ සෑම අවයවයක් ම ක්ෂය රෝගයට ගොදුරු විය හැකියි. වැලඳෙන අවයව අනුව රෝග ලක්ෂණ එකිනෙකට වෙනස්. උදරය ආශ්‍රිත ව වැලඳුණහොත් පාචනය, උදරය ඉදිමීම, උදරය නෙරා ඒම වැනි ලක්ෂණ දකින්නට පුළුවන්. වකුගඩු ආශ්‍රිත ව මුත්‍රා පැසවීම, වකුගඩු ආසාදන; ඇස් ආශ්‍රිත ව ඇස් රතුවීම, ආලෝකය දෙස බැලීමට අපහසු වීම, පෙනීම දුර්වල වීම, හිසරදය; සම ආශ්‍රිත ව සමේ රතු පැහැ ලප ඇති වීම; මොළය ආශ්‍රිත ව සිහි මඳ ගතිය, වලිප්පුව වැනි තත්ත්ව ඇති වන්නට පුළුවන්.

ක්ෂය රෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහනේ අධ්‍යක්ෂ, වෛද්‍ය ප්‍රමිතා ශාන්තිලතා පවසන්නේ යම් පුද්ගලයෙකුට ක්ෂය රෝගයේ ලක්ෂණ හෝ සැකයක් හෝ තිබෙනවානම් සෙම පටල පරීක්ෂණයක් කරන බව. මේ සෙම පටල අන්වීක්ෂ පරීක්ෂණයක් හැටියටයි

සිදු කෙරෙන්නේ. අදහස් දක්වන ඇය; "සෙම පටල පරීක්ෂාවේදී අවස්ථා 3කදී සෙම පටල 3ක් ලබා ගන්නවා. එයින් එම තැනැත්තා ක්ෂය රෝගයට ගොදුරු වී ඇති බව තහවුරු වුවහොත් ප්‍රතිකාර පටන් ගන්නවා. ඊට අමතර ව ලෝක සෞඛ්‍ය සංවිධානය දැනුම් දී ඇති ආකාරයට එක්ස් කිරණ පරීක්ෂණයක් සිදු කෙරෙනවා. එහි යම් වෙනසක් හඳුනා ගතහොත් ඊළඟට පරීක්ෂණ සිදු කරන්නේ ජාන රෝපණය කර. ප්‍රතිකාර කිරීමේදී සාමාන්‍යයෙන් මාස 6ක් වැනි කාලයක් ගත වෙනවා. මුල් මාස 2 තුළ ඖෂධ වර්ග 4ක් ලබා දීමෙනුයි ප්‍රතිකාර පටන් ගන්නේ. සමහරුන්ට ඖෂධවලට ආසාත්මිකතා, අතුරු ආබාධ ඇති වෙනවා. එසේ වුවහොත් නේවාසික ප්‍රතිකාර දිය යුතුයි. මුල් මාස 2න් පසු ඖෂධ ක්‍රමක්‍රමයෙන් අඩු කර නොකඩවා ප්‍රතිකාර කරනවා. පෙණහලු ආශ්‍රිත ක්ෂය රෝගයට සාමාන්‍යයෙන් මාස 6ක් පමණ ගත වුණත් කොඳුඇට පෙළ, ස්නායු වැනි ක්ෂය රෝගය වැලඳුණු ස්ථානය අනුව ප්‍රතිකාර කළ යුතු කාලය වෙනස් වෙන්න පුළුවන්."

ශ්‍රී ලංකාවේ පවතින සෞඛ්‍ය දිස්ත්‍රික්ක 26හි (අම්පාර සහ කල්මුණේ සෞඛ්‍ය දිස්ත්‍රික්ක 2ක් වශයෙන් ගත් විට) ළය සායන 26ක් තිබෙනවා. ක්ෂය රෝගින් කුමන පළාතකින්, කුමන ස්ථානයකින් හමුවුවත් ඔවුන් ලියාපදිංචි කරන්නේ අදාළ දිස්ත්‍රික්කයේ. රෝගින් අධීක්ෂණය කිරීමටත් පසු විපරම් කිරීමටත් එය පහසුවක්. අද බොහෝ විට ඍජු ව ම නිරීක්ෂණය කරන චිකිත්සාව වන්නේ DOT (Directly Observed Therapy) ක්‍රමය. ඒ ඔස්සේයි ක්ෂය රෝගින්ට ප්‍රතිකාර කෙරෙන්නේ.

සෑම ළය සායනයකින් ම ක්ෂය රෝගින්ට ප්‍රතිකාර කෙරෙන්නේ නොමිලේ. නිසි පිළිවෙළට ඖෂධ ගැනීමෙන් ක්ෂය රෝගය නිට්ටාවට ම සුව කරගත හැකි වුවත් ඇතැම් රෝගින් මාස 2ක් 3ක් පමණ ප්‍රතිකාර ලබා, අතරමඟදී එය නවතා දමනවා. මෙය කිසිසේත් ම නොකළ යුත්තක්. ප්‍රතිකාර අතරමඟ නවතා දැමූ විට බැක්ටීරියාව විනාශ නොවී යටපත් වී තිබීම නිසා යළි රෝගය උත්සන්න වෙනවා. එවිට ක්ෂය රෝගියෙකුට සාමාන්‍යයෙන් ලබාදෙන ඖෂධවලට බැක්ටීරියාව මර්දනය කරන්නට බැහැ. ඖෂධ ප්‍රතිරෝධයක් ඇති වෙනවා. මෙවැනි අවස්ථාවක සිදු වන්නේ අධිමාත්‍රාවකින් ඖෂධ දීමට. එය රෝගියාට හිතකර නොවන්නා සේ ම රජයට අධික පිරිවැයක් දරන්නට සිදු වෙනවා. ඊටත් වඩා බරපතළ ම කාරණය

ශ්‍රී ලංකාවේ පවතින සෞඛ්‍ය දිස්ත්‍රික්ක 26හි (අම්පාර සහ කල්මුණේ සෞඛ්‍ය දිස්ත්‍රික්ක 2ක් වශයෙන් ගත් විට) ළය සායන 26ක් තිබෙනවා. ක්ෂය රෝගින් කුමන පළාතකින්, කුමන ස්ථානයකින් හමුවුවත් ඔවුන් ලියාපදිංචි කරන්නේ අදාළ දිස්ත්‍රික්කයේ. රෝගින් අධීක්ෂණය කිරීමටත් පසු විපරම් කිරීමටත් එය පහසුවක්. අද බොහෝ විට ඍජු ව ම නිරීක්ෂණය කරන චිකිත්සාව වන්නේ DOT (Directly Observed Therapy) ක්‍රමය. ඒ ඔස්සේයි ක්ෂය රෝගින්ට ප්‍රතිකාර කෙරෙන්නේ.

වන්නේ ක්ෂය රෝගය සම්පූර්ණයෙන් සුවපත් නොවුණු අයගෙන් රෝගය බෝ වීමේ අවදානම ඉහළ යෑම. ඖෂධ ප්‍රතිකාර නොකඩවා, නිර්දේශ කළ ආකාරයට සිදු කිරීම ඉතා වැදගත් වන්නේ මේ නිසා.

ක්ෂය රෝගය ව්‍යාප්තිය ගත් විට කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, ගාල්ල, කුරුණෑගල, කෑගල්ල, අනුරාධපුර, නුවරඑළිය යන දිස්ත්‍රික්ක කැපී පෙනෙනවා. සමස්ත රෝගින්ගෙන් 46%ක් වාර්තා වන්නේ බස්නාහිර පළාතෙන්. මේ අතරින් ඉහළ ම අවදානමක් තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ. ඊට හේතුව එම 46%න් හරි අඩක් ම වාසය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ වීම. කොළඹ දිස්ත්‍රික්කයේ සිටින රෝගීන්ගෙන් 50%ක් ම කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ජීවත් වන්නන්.

ශ්‍රී ලංකාවේ වසරකට වාර්තා වන ක්ෂය රෝගින්ගේ සාමාන්‍ය අගය 8000-9000ත් අතර වෙනවා. 2023 වර්ෂයේ 9,538ක් ද 2024 වර්ෂයේ 9,180ක් ද 2025 වර්ෂයේ 8,726ක් ද වශයෙන් ක්ෂය රෝගින් වාර්තා වීමෙන් එය තහවුරු කරගත හැකියි. ක්ෂය රෝගින්ගේ මරණ පිළිබඳ සලකා බැලීමේදී 2023 වසරේදී 748ක් ද 2024 වසරේදී 780ක් ද 2025 වසරේදී 749ක් ද වශයෙන් වාර්තා වෙනවා.

අදහස් දක්වන වෛද්‍ය ප්‍රමිතා ශාන්තිලතා; "ශ්‍රී ලංකාවේ බෝ වන රෝගවලින් සිදුවන මරණ ගැන සලකා බලන විට ඉහළ ම මරණ සංඛ්‍යාවක් වාර්තා වන්නේ ක්ෂය රෝගය හේතුවෙන්. මෙහිදී අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කරන විට ශ්‍රී ලංකාව සිටින්නේ අඩු අවදානම් රටක් හැටියට. දකුණු ආසියාවේ රටවල ක්ෂය රෝගය බහුල ව තිබෙනවා. වසරකට ලෝකයේ ක්ෂය රෝගින් මිලියන 10ක් පමණ සොයා ගැනෙනවා. එයින් මිලියන 1.2ක් පමණ මිය යනවා. මේ අතරේ 1,40,000ක් පමණ මරණයට පත් ව තිබෙන්නේ දරුවන්. ලෝක සෞඛ්‍ය සංවිධානය 2023 වසරේදී ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් ලක්ෂයකට ක්ෂය රෝගින් 62ක් සිටිය යුතු බවට ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ අනුව ලංකාවේ සමස්ත ජනගහනයෙන් වසරකට ක්ෂය රෝගින් 14,000ක් සොයා ගත යුතු වෙනවා. නමුත් සෑම වසරක ම වාර්තා වී තිබෙන්නේ 10,000කට අඩු රෝගින් පිරිසක්. හඳුනා නොගත් ක්ෂය රෝගින් 4,000ක් පමණ සමාජයේ සිටිනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය 2015 වසරේ අපට ඉලක්ක 3ක් දුන්නා 2035 වසර වන විට 2015 වසරට සාපේක්ෂ ව ක්ෂය රෝගින්ගේ මරණ සංඛ්‍යාව 95%කින් අඩු කර ගැනීම, රෝගි වීම 90%කින් අඩු කර ගැනීම සහ ක්ෂය රෝගියාගේ වියදම ශූන්‍ය (0) කිරීම ආදී වශයෙන්. හඳුනා නොගත් ක්ෂය රෝගින් සමාජයේ සිටින තුරු මේ ඉලක්කවලට යන්නට බැහැ. ඒ නිසා එම රෝගින් හඳුනා ගැනීමට පියවර ගෙන තිබෙනවා."

ක්ෂය රෝගයට ගොදුරු විය හැකි යැයි සැලකෙන අවදානම් කාණ්ඩ වන්නේ රෝගින්ගේ ආශ්‍රිතයන්, වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටි ප්‍රජාව, බන්ධනාගාරගත වූ අය, එච්.අයි.වී. ශරීරගත වූ අය, දියවැඩියාව වැලඳුණු අය, රුධිරය කාන්දුකරණයට ලක් වන අය, වකුගඩු රෝගින්, පිළිකා රෝගින්, දුම්පානයට සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ අය, බෝ නොවන රෝගවලට ගොදුරු වූ අය යනාදීන්. මේ කණ්ඩායම් පරීක්ෂාවට ලක් කිරීමෙන් සමාජගත වී සිටින හඳුනා නොගත් ක්ෂය රෝගින් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමට ක්ෂය රෝග මර්දන සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන ක්‍රියා කරනවා. ඒ, මාර්තු 24 දිනට යෙදෙන ලෝක ක්ෂය රෝග දිනය නිමිත්තෙන් 'ක්ෂය රෝගය අවසන් කළ හැකියි' යන මෙවර තේමාව යටතේ ක්‍රියා කරමින් ලෝක සෞඛ්‍ය සංවිධානය දී තිබෙන ඉලක්ක කරා ගමන් කිරීමට නව ක්‍රියාමාර්ග වෙත යොමු වෙමින්.


# සිනමා වසන්තයක් අබිමුව

**ගගන ලක්සර වර්නකුලසූරිය**

ගැංස්ටර් (Gangster) සිනමාව මෙරට මෑත සිනමා ඉතිහාසයේ එතරම් ප්‍රචලිත නැහැ. චමින්ද ජයසූරියගේ ෆාදර් (Father) සිංහල චිත්‍රපටය සිනමා ශාලා පුරවමින් සිටින්නේ මෙවැනි පසුබිමක. ෆාදර්, 80 දශකය අගභාග යේ සහ 90 දශකය මුල්භාගයේ පසුබිම් වූ සත්‍ය සිදුවීමක් වටා ගෙතෙන්නක්. ප්‍රචණ්ඩත්වය (Violence) කේන්ද්‍රීය චිත්‍රපටයේ ප්‍රධාන තේමාවක්. එය කොතරම් චිත්‍රපටයට බලපෑම් කරන්නේ ද යන්න ලිංගිකත්වය (Sex) පවා ප්‍රචණ්ඩත්වය තුළ ම යටපත් වෙනවා. ප්‍රචණ්ඩත්වය වගේ ම ලිංගිකත්වයත් එකලෙස ම සිනමාවට අමතක කර යා නොහැකියි.

චිත්‍රපටයේ කේන්ද්‍රීය චරිතය තරමක් සූක්ෂ්ම ව කියවිය යුතුයි. සමාජ අසාධාරණයට එරෙහි ව සටන් වදින නිල නොලත් 'වීරයෙකුගේ' කතාවෙන් අපට හමු වන්නෙත් ඒ වීරයාගෙන් වෙන් කර පෙන්වන්නට බැරි දේශපාලනික අර්බුදයක්. චිත්‍රපටයට අදාළ කාලානුරූපී පසුබිම ආසන්න ව 89-91 ලෙස සලකුණු කළහොත් මේ නිශ්චිත කාල සීමාවේ තාරුණ්‍යය යනු ඉතා ම සංකීර්ණ මාතෘකාවක්. එයට හේතුව 88-89 තරුණ කැරලි. මේ කැරලි ඉතා ප්‍රචණ්ඩ ලෙස මර්දනයට ලක්වෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුකරණයේ ම්ලේච්ඡ හස්තවලින්. පහසුවෙන් නිගමනය කළ හැකි සේ ම කතානායකයා වන 'ඩෙස්මන්' මේ නිශ්චිත කාලයේ සක්‍රිය දේශපාලනික අවබෝධයක් ඇති අයෙකු බව පෙනෙන්නට නැහැ. ඔහු එවැනි දේශපාලන වාතාවරණයකත් යුද හමුදාවට බැඳෙන්න ඉන්නෙත් ඒ නිසා වෙන්නට ඇති. 'ඔබ දේශපාලනය සොයාගෙන යන්න ඕනෙ නැහැ. දේශපාලනය ඔබ සොයාගෙන ගෙදර දොරඩකට ම එනවා' කියන්නා සේ ඩෙස්මන්ඩ්ට සිදුවුණෙත් එය. සමාජ අසාධාරණය-අයුක්තිය වැනි සංකල්ප වටා ඩෙස්මන්ඩ් කේන්ද්‍රගත වන්නේ ඉන්පසු. ඊට කලින් ඔහු ඒ කිසිවක් ගැන නොවෙහෙසෙන, දේශපාලනික ව උදාසීන පුරවැසියෙක්. එපමණක් නොව ඩෙස්මන්ඩ් තරුණයෙක්. පසුගිය තරුණ අරගලය විසඳුම්වලින් තොර ව අතුගා දැමුවත් තරුණ අසහනය එසේ අතුගෑවී යන්නේ නැහැ. මේ පීඩනය පිපිරෙන්නේ අයුක්තිය තමන්ගේ දොරකඩට ම පැමිණි පසු. ඉන්පසු අරගලකරුවන් වෙනුවට ගැංස්ටර්ලා බිහිවෙන්නේ කෙසේ ද? යන්නයි ෆාදර් ඔබට කියනු ඇත්තේ.

මනුෂ්‍ය දේශපාලනය යනු ශිෂ්ට භාවිතාවක්. එසේ වන්නේ සත්තු දේශපාලනය නොකරන නිසා සහ එය ශිෂ්ට භාවිතාවක් නොවන්නේ මිනිසා තව ම සතෙකු වන නිසා. ප්‍රචණ්ඩත්වය සහ ලිංගිකත්වය තවමත් අප තුළ පවතින මූලික සහජාශයක්. ආශාවක්. ශිෂ්ටාචාරය, දේශපාලනය ආදිය එම ලිංගිකත්වය සහ ප්‍රචණ්ඩත්වය පාලනය කරගැනීමේ උත්සාහයේ නිර්මිතයක්. දේශපාලනය පිළිබඳ සවිඥානික වෙන්නට උත්සාහ කළ උතුරේ තරුණයනුත් දකුණේ තරුණයනුත් එම කිසි ම දේශපාලන ශික්ෂණයක් තුළ නොවැඩුණු ඩෙස්මන්ඩ් වැනි තරුණයනුත් අයුක්තියට එරෙහි ව ප්‍රචණ්ඩත්වය එක ම අවියකොට ගැනීම අප තේරුම්






චිත්‍රපටයේ කේන්ද්‍රීය චරිතය තරමක් සූක්ෂ්ම ව කියවිය යුතුයි. සමාජ අසාධාරණයට එරෙහි ව සටන් වදින නිල නොලත් 'වීරයෙකුගේ' කතාවෙන් අපට හමු වන්නෙත් ඒ වීරයාගෙන් වෙන් කර පෙන්වන්නට බැරි දේශපාලනික අර්බුදයක්. චිත්‍රපටයට අදාළ කාලානුරූපී පසුබිම ආසන්න ව 89-91 ලෙස සලකුණු කළහොත් මේ නිශ්චිත කාල සීමාවේ තාරුණ්‍යය යනු ඉතා ම සංකීර්ණ මාතෘකාවක්.

ගන්නේ කෙසේ ද? අයුක්තියට එරෙහි ප්‍රචණ්ඩත්වය තුළ අයුක්තියක් නැති ද? 'ඔව්' හෝ 'නැහැ' හෝ ලෙස ඊට පිළිතුරු දිය නොහැකියි. ප්‍රචණ්ඩත්වය ආශාව කරගත් මනුෂ්‍ය ආත්මයක් ප්‍රචණ්ඩත්වය යටපත් කිරීමේ අරමුණෙන් දේශපාලනය ගොඩනඟාගෙන; ප්‍රති-ප්‍රචණ්ඩත්වයකින් දේශපාලන ප්‍රචණ්ඩත්වය විසඳන්නට උත්සාහ කිරීම දේශපාලනික සන්දර්භයකින් පමණක් තේරුම් ගන්නට බැහැ. ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මනෝභාවමය ප්‍රවේශයකුත් මෙතැනදී වැදගත් කාර්යයක් ඉටු කරනවා.

සිනමාව, සිනමා ප්‍රවණතා සහ ප්‍රචණ්ඩත්වය කාලානුරූපී ව දේශපාලනික පසුබිමක ස්ථානගත කිරීම වැදගත්. ෆාදර් පසුබිම් කාලයෙන් ම ගත්තොත් 80 දශකය යනු ලංකාවේ දේශපාලනික ව ඉතා අඳුරු දශකයක්. සිනමාවටත් එම කාලය එලෙස ම අඳුරු වූ බවයි ඉතිහාසයේ සලකුණු කර තිබෙන්නේ. 17 වසරක සාපයෙන් පසු අලුත් දේශපාලන බලාපොරොත්තුවකට 90 දශකය මැදභාගය වන විට ශ්‍රී ලංකාව ගමන් කළත් එම වසන්ත සමය අවසන් වුණේ 17 වසරට වඩා සාපදායක විභවයක් සහිත කණ්ඩායමකට දේශපාලනික ව කිරුළ පලඳවමින්. 2000 වසරින් පසු නැවතත් ම්ලේච්ඡත්වය කරා යන දේශපාලනික-සමාජීය දෘෂ්ටිවාද ශක්තිමත් වන්නට වුණේ මේ නිසා. උතුරේ තරුණ අරගලය, ත්‍රස්තවාදයක් කර අතුගා දමා සැමරුවත් ඒ ම්ලේච්ඡ ක්ෂතිමය (Traumatic) මතකවලින් ගැලවීම පහසු වුණේ නැහැ. සිනමාව මේ සඳහා ප්‍රතිචාර දැක්වූ ආකාරය මතු කරන්නට විදර්ශන කන්නංගර පවසන 'යුද වින්දන සිනමාව' සම්බන්ධ ප්‍රවාදය මා උපුටා දක්වනවා. ඒ අනුව යුද්ධයේ ප්‍රචණ්ඩ ක්ෂතිමය මතක අමතක කර දීමේ වගකීම බාර ගත් 'අහිංසක යුද කතා', 'ආඩම්බරකාර ඉතිහාස කතා' මෙන් ම 'පින්බර බණ කතා' මෙරට සිනමාව වසා ගත්තා. ප්‍රේක්ෂකාගාරය තොරන් බලන අතරේ නැවතත් මෙරට දේශපාලනය වියැකෙන්නට පටන් ගත්තා. පෙර තරමට ම එය ම්ලේච්ඡ නොවුණත් ප්‍රචණ්ඩත්වයක් ලෙස එම දේශපාලනික පීඩනය පුපුරා ගියේ පසුගිය ගෝල්ෆෙස් අරගලයෙන්. (මෙතැනදී ප්‍රචණ්ඩත්වය දක්වන්නේ සම්මතයන් උල්ලංඝනය කරන අදහසින්)

ඊට පසු පැමිණි සිනමාත්මක මොහොතෙයි ෆාදර් ස්ථානගත වන්නේ. මේ මොහොතේ ලංකාවෙ සිනමාවට අවශ්‍යතාවක් නැහැ කවුරු කෙරෙහිවත් උත්තර දෙන්නට







හෝ ප්‍රතිචාර දක්වන්නට. (යුද්ධය වැනි කාරණාවලට උත්තර දෙන්න කාලයක් සිනමාව මහන්සි වුණා). ඒ නිසා බොහෝ නිදහස් මාතෘකා ඔස්සේ ගලාගෙන යන 'සිනමා වසන්තයක්' ඇතුළේ ෆාදර්, රානි වැනි චිත්‍රපටවලින් මතු කරන දේශපාලනික ආතතිය ප්‍රේක්ෂකාගාරයට මඟ හැරෙනවා. අශෝක හඳගමගේ රානි නරඹන්නට ඒ මොහොත විසින් ප්‍රේක්ෂකාගාරය උනන්දු කරනු ලැබුවත් චිත්‍රපටය විසින් ප්‍රේක්ෂකාගාරය තෘප්තිමත් කරනු ලබන්නට අසමත් වන්නේ ඒ නිසා.

ෆාදර් ඊට වෙනස් ව ප්‍රේක්ෂකාගාරයේ ඓන්ද්‍රිය මැදිහත්වීමක් මත තිරගත වෙනවා. එනම් ප්‍රචාරණ ව්‍යාපාර වෙනුවට ප්‍රේක්ෂකාගාරයයි චිත්‍රපටය රැගෙන යන්නේ. මෙය සිනමාකරුගේ ප්‍රථම චිත්‍රපටය වීම නිසා ම රානි, වාලම්පුරි වැනි සිනමා කෘතිවලින් වෙනස් ව ෆාදර් චිත්‍රපටය ගැන පූර්ව නිගමන ප්‍රේක්ෂකාගාරය තුළ නැහැ. එවැනි පසුබිමකත් ෆාදර්, දුවන්නේ සිනමාකරු විසින් පසුගිය මොහොතේ තිබුණු දේශපාලන ආතතියත් මේ මොහොතේ තිබෙන 'ප්‍රචණ්ඩත්වයේ හිඟකම'ත් ආමන්ත්‍රණය කරනු ලබන නිසා බවයි මගේ උපන්‍යාසය. යුක්තිය විෂයෙහි නව බලාපොරොත්තු සහිත ව නැගුණු පසුගිය දේශපාලන කම්පනය ෆාදර් සමඟ අනුනාද වෙනවා. යුක්තිය සම්බන්ධ දීර්ඝ කතිකාවකින් හෙම්බත් ව සිටින පුරවැසි ප්‍රජාවක් විදිහට, යුක්තිය පසිඳලීමේ 'ඩෙස්මන්ඩ්මය' ක්‍රමය විසින් යුක්තිය පිළිබඳ බලාපොරොත්තුව සහ හිස්තැනත් පවතින ශිෂ්ට දේශපාලන කතිකා විසින් යටපත් කරන ප්‍රචණ්ඩත්වයේ හිස්තැනත් එක විට පුරවන්න සමත් වෙනවා. මේ ඔස්සේ ඇතිකරන දේශපාලනික සුවපහසු බවත් අවදානමකින් (Risk) තොර ව ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ අවස්ථාවත් විසින් ප්‍රේක්ෂකාගාරය ෆාදර් වෙත බැඳෙනවා.

ෆාදර් චිත්‍රපයට පසුබිම් වූ ඓතිහාසික මොහොතේ මතුවුණු යුක්තිය සම්බන්ධ කතිකාමය බලාපොරොත්තුව ආණ්ඩු මාරු කළා, ඉන්පසු යුක්තිය ආණ්ඩුවට බාර දී අප චිත්‍රපට බැලුවා. ඒ දේශපාලන මොහොත ඉවරවුණු විදිහයි ෆාදර් අපට මතක් කරන්නෙත්. මේ දේශපාලනික මොහොතට සමාන්තර දේශපාලනික මොහොතක් රැගෙන තිරය අද්දරට ෆාදර් ඇවිත් සිටින මොහොතේ අප චිත්‍රපට පමණක් බැලීම සුදුසු නොවන බවයි මගේ යෝජනාව.

යුක්තිය විෂයෙහි නව බලාපොරොත්තු සහිත ව නැගුණු පසුගිය දේශපාලන කම්පනය ෆාදර් සමඟ අනුනාද වෙනවා. යුක්තිය සම්බන්ධ දීර්ඝ කතිකාවකින් හෙම්බත් ව සිටින පුරවැසි ප්‍රජාවක් විදිහට, යුක්තිය පසිඳලීමේ 'ඩෙස්මන්ඩ්මය' ක්‍රමය විසින් යුක්තිය පිළිබඳ බලාපොරොත්තුව සහ හිස්තැනත් පවතින ශිෂ්ට දේශපාලන කතිකා විසින් යටපත් කරන ප්‍රචණ්ඩත්වයේ හිස්තැනත් එක විට පුරවන්න සමත් වෙනවා. මේ ඔස්සේ ඇතිකරන දේශපාලනික සුවපහසු බවත් අවදානමකින් (Risk) තොර ව ප්‍රචණ්ඩත්වය අත්විඳීමේ අවස්ථාවත් විසින් ප්‍රේක්ෂකාගාරය ෆාදර් වෙත බැඳෙනවා.



# මිනිසාට ඇස තියන රුසියානු ලිවිසැරිය

**නුවන් කුමාර කටුගම්පල**

“කිසියම් ලේඛකයකු හදවත් සසල කිරීමට පිළිසන් දෙන්නේනම්, ඔහු සත්‍ය වන්දනා කළ යුතු ය. මිනිස් චින්තනයේ බුද්ධිය විශ්වාස කළ යුතු ය. ජීවිතය කෙරෙහි බැඳුණු ප්‍රේමයෙන් යුක්ත විය යුතුය.” ‘රුසියාව’ ත්‍රෛමාසික සඟරාවේ පස් වැනි වෙළුමේ පනස් අට වැනි කලාපයෙන් මේ කියමන උපුටා ගැනුණේ ලාභ ඉපැයීම නොව මිනිසා ඥානනය කරවීම පරමාර්ථය කරගත් රුසියානු සාහිත්‍යයේ අදට ඔබින ගෝලීය ගැළපුම පිළිබඳ කතාබහකට ප්‍රවිශ්ටයක් වශයෙන්.

ලෝකයට රසවින්දනාත්මක මානවවාදී උත්තේජනයක් ලැබ දුන් සෝවියට් රුසියානු සාහිත්‍යය පිළිබඳ වත්මන් විචාරකයා සංවාද කරන්නේ එය පූර්ව සෝවියට් සාහිත්‍ය හෙවත් රුසියානු සාහිත්‍ය, සෝවියට් සාහිත්‍ය සහ නූතන රුසියානු සාහිත්‍ය වශයෙන් යුග තුනකට වෙන් කරමින්. මේ සංවාදවල ප්‍රබල තේමාවක් ව ඇත්තේ 21 වැනි සියවස උදෙසා සෝවියට් රුසියානු සාහිත්‍යයේ වලංගුභාවය කෙබඳු ද? යන්න. 2026 ජනවාරි 27 සහ පෙබරවාරි 03 දිනවල රුසියානු සාහිත්‍ය කවයේ 20 වැනි සංවත්සරය අළලා කොළඹ රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැති සාහිත්‍ය සංවාද මණ්ඩපයේ ද වැඩි බරක් වෙන් කර තිබුණේ මේ මාතෘකාවට.

1957 වසරේදී සෝවියට් දේශයත් ශ්‍රී ලංකාවත් අතර නිල රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇරඹෙන්නට පූර්වයේ සිට ම දෙරට අතර පැවතියේ දැඩි සාහිත්‍ය සබඳතා. රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇරඹීමේ පටන් සෝවියට් කෘති සිංහල භාෂාවට පරිවර්තනය වීම වේගවත් වූ බව පවසන නැගෙනහිර ආණ්ඩුකාර, ප්‍රවීණ පරිවර්තක, මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර ඉහත යුග තුනට ම අයත් රුසියානු සාහිත්‍ය සමස්ත ලෝකයට ම එක සේ වලංගු වන්නට හේතු පෙන්වා දෙනවා. විචිත්‍ර රුසියානු ළමා කෘති පරිවර්තනවලින් රුසියාව පිළිබඳ පාඨක මනසේ ඇඳි අලංකාර චිත්‍රය ළමා පාඨකයා වැඩිහිටියකු වූ පසු ද නොමැකී පැවතීමේ ගුණය ඒ අතර ප්‍රධානයි. ඉන් කියැවෙන්නේ එරට ළමා සාහිත්‍ය මානව චින්තන පෙරළියකට මග පාදන ප්‍රබල එකක් බව. ලස්සන වසීලිස්සා, හත්පෙති මල, සින්දු කියන වෘකයා, පණ ඇති තොප්පිය, වැඩ බැරි දාස, වීත්යාගේ ඉස්කෝලේ, වංගගිරිය, මගේ හපන්කම්, සංගීත පාඩම වැනි සිය ගණනක් වූ සිංහලයට පරිවර්තිත රුසියානු ළමා සහ යොවුන් පොත් එබඳුයි.

සිංහලයට පරිවර්තනය වූ නවකතා, කෙටිකතා සහ වෙනත් ශානරවල කෘති ද ලක් වුණේ ජනාදරයට. ඒ අතරට අයත් අම්මා, ගුරුගීතය, යුද්ධය හා සාමය, අපරාධය සහ දඬුවම, පෙරළු නැවුම් පස, මළ මිනිස්සු, ජමීලා, සුදු අන්තුවා, හතළිස් එක් වැන්නා, දොන් නදිය නිසල ව ගලා බසී, මගේ ජනරාල්, ගිනිමැළයට පිඹ පරමාණුව බිඳ, වංශවතුන්ගේ කැදැල්ල, සමුගනිමි ගුල්සාරි, සුදු නැව, දංගෙඩිය, වානේ පන්නරය ලැබූ හැටි, මිනිසුන් අතර, අඳ වාදකයා, රතු රුවල්, පුදුම රතු කුසුම, උපන් ලපය, සැබෑ මිනිසකුගේ කතාවක්, විප්ලවය මගේ තක්සලාව, යකඩ ප්‍රවාහය, ඔවුන් යුද වැදුණේ මව්බිම වෙනුවෙනි, කමකට නැති එකකුගේ ජීවිතය, ධීවර ගීතය, මගේ සරසවි, ඇනා කැරනිනා, ඔක්තෝබර් රුසියානු විප්ලවයේ කතාව, හිම කබාය සහ තවත් කෙටි කතා, සුන්දර නතාෂා, උණු පාන් සහ තවත් කතා, කොපු

තුළ සිටින මිනිසා, 19 වැනි ශතවර්ෂයේ රුසියානු කෙටිකතා, හාදුව, තුන් අවුරුද්ද ඇතුළු සිය ගණනක් වූ ජනප්‍රිය කෘති මෙරට සමාජයට කළ බලපෑම සුවිශාලයි.

දරුණු රාජාණ්ඩු පාලනයක, ශ්‍රේෂ්ඨ මහා විප්ලවයක සහ භූ දේශපාලනමය බිඳවැටීමක අත්දැකීම්වලින් දේශපාලනික ව හා සමාජීය ව මිරිකෙමින් පෝෂිත සෝවියට් දේශය සාහිත්‍යයට දැක්වූ සහනශීලීභාවය හේතුවෙන් රුසියානු කෘති පරිවර්තනය වී ලොවේ පාඨකයා අතට ගියේ ඉතා පහසු මිලකට. එම පොත් බොහොමයක පැවැතියේ වයස් භේදයකින් තොර ව නැවත නැවත රසවිඳීමට පොළඹවනසුලු ආකර්ෂණීයත්වයක්. ප්‍රේමය, මිත්‍රත්වය, උද්‍යෝගය, අභිප්‍රේරණය, ආදරය, ජයග්‍රහණය, සත්කාරය වැනි මානව ගුණාංග සරල ව සුන්දර ව විවරණය කිරීම, මිනිසාටත් ගහකොළටත් සතාසිව්පාවාටත් ආදරයෙන් කුතුහලය සහ ආස්වාදය සුරැක පාඨකයා ඇද බැඳ තබා ගැනීම වැනි වටිනාකම් ද රුසියානු




සාහිත්‍ය ජාත්‍යන්තරයේ ප්‍රචලිත වීමට බලපෑවා. පහසුවෙන් වැටහෙන සුබනම්‍ය භාෂාවෙන් අමතන, පරිකල්පනීය සහ අලුත් සිතුවිලි අවදි කරවන (Expert Thinking) රුසියානු සාහිත්‍යය ඕනෑ ම රටක ජනතාවට දනවන්නේ මිත්‍රශීලී හැඟීම්. මානව ජීවිතයේ ප්‍රමුඛතම බලාපොරොත්තු වන විනෝදය, ප්‍රමෝදය, ප්‍රීතිය, සැහැල්ලුව, සතුට සහ ආනන්දය ජනිත වන සාහිත්‍යයකුයි රුසියාව සතු. සිය දේශය පුබුදුවාලන අනාගත ජන සමාජයක් නිර්මාණය කිරීමේත් වංචාකාර, දූෂිත, චෞර, පාදඩ, ම්ලේච්ඡ, මජර ගති ලක්ෂණ සහිත භූමියේ දේශපාලන සහ ආර්ථික දේහයට වඩාත් මානුෂීය මුහුණුවරක් දෙන්නට මහජනයා ඒකරාශී කිරීමේත් ලා සාහිත්‍ය භාවිතාව ලෝකයට හුරු කළේ ප්‍රධාන වශයෙන් සෝවියට් රුසියාව. ශ්‍රී ලංකාවේත් එබඳු ප්‍රගතිශීලී ජනරාශියක් බිහිවීමට එයින් ලැබුණේ ප්‍රබල මතවාදී දායකත්වයක්.

ධනවාදය, නව ලිබරල්වාදය විසින් නොසලකා හරිනු ලබන 'මනුෂ්‍යත්වය', කොමියුනිස්ට්වාදය විසින් සැලකිල්ලට භාජනය කරවනු ලබන බව ප්‍රායෝගික ව ඔප්පු කරන්නට සෝවියට් රුසියානු සාහිත්‍යය ඉටු කළ මෙහෙය අතිමහත් බව කියන මහාචාර්ය රත්නසේකර නැවත යථාවත් කළ නොහැකි තරමට පෘථිවි ගෝල පරිසරයත් ඒ මත දිදුළ මානවීයත්වයත් විනාශ වී ඇති වර්තමානයට, එය පරිශීලනය කිරීම එදාට වඩා ඔබින බව අවධාරණය කරනවා.

ප්‍රවර්ධනය සඳහා රුසියානු සාහිත්‍ය කෘති නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරමින් ඔවුන්ගේ ජන සාහිත්‍යත් නව ගැමි සාහිත්‍යත් ලෝකයේ වෙනත් භාෂාවලට පරිවර්තනය කිරීම වේගවත් කර ඇති බව මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ සිංහල භාෂාව පිළිබඳ සහාය මහාචාර්ය බරිස් වල්හෝන්ස්කි පවසනවා. සිය විශ්වවිද්‍යාලයේ සිංහල භාෂා උපාධි පාඨමාලාවට එකතු වන ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂික ව ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අතර මොස්කව් සාහිත්‍ය අධ්‍යයන ආයතනය, විවිධ සාහිත්‍ය සංගම්, ඇතුළු රාජ්‍ය සහ පෞද්ගලික සංවිධානවල මූලිකත්වයෙන් ලෝක සාහිත්‍ය සහ විවිධ භාෂා අධ්‍යයනයට පාඨමාලා, සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු, ප්‍රදර්ශන, තරග, උලෙළ, පොත් එළිදැක්වීම් යනාදිය පවත්වන බවත් සිංහල සහ වෙනත් භාෂාවල පොත් පත් රුසියානු බසටත් රුසියානු පොත්පත් සිංහල ඇතුළු අනෙක් භාෂාවලටත් පරිවර්තනය කළ හැකි භාෂා විශාරද රුසියානුවන් ඉදිරියේදී වැඩි වැඩියෙන් කල එළි බසිනු ඇති බවත් කියනවා.

රුසියාවේ පළ වන 'සාහිත්‍ය හඳුනා ගැනීම' මාසික සඟරාවේ ප්‍රධාන සංස්කාරිකා, ළමා සාහිත්‍යවේදිනී මහාචාර්ය ලෝලා ස්වනරියෝවා පවසන්නේ රුසියානු සාහිත්‍ය ජාත්‍යන්තරයටත් ලෝක සාහිත්‍ය රුසියාවටත් හඳුන්වා දීමට තම සඟරාව ක්‍රියාත්මක කරන විදෙස් සාහිත්‍ය වෙනුවෙන් දායක වීමේ වැඩපිළිවෙළ යටතේ 2025 දෙසැම්බර් කලාපයේ හරි අඩක එනම්, පිටු 144ක සීගිරි කුරුටු ගී 20ක්, කව්සිළුමිණේ 1 සර්ගය, ගිරා සංදේශයේ කවි 30ක් ඇතුළු ව ශ්‍රී ලාංකේය සිංහල මාධ්‍ය සහ දෙමළ මාධ්‍ය ප්‍රවීණ සාහිත්‍යකරුවන් 28 දෙනකුගේ ගද්‍ය පද්‍ය නිර්මාණ රුසියානු භාෂාවට පරිවර්තනය කර පළ කළ බවත්.

තව ද රජය ලේඛකාධාර ව්‍යාපෘති වැඩි කිරීම, මොස්කව්හි සංචාරය කරන්නන්ට අවශ්‍ය මාර්ගෝපදේශ සාහිත්‍යමය ලේඛන අනුසාරයෙන් ඉදිරිපත් කිරීම,

දරුණු රාජාණ්ඩු පාලනයක, ශ්‍රේෂ්ඨ මහා විප්ලවයක සහ භූ දේශපාලනමය බිඳවැටීමක අත්දැකීම්වලින් දේශපාලනික ව හා සමාජීය ව මිරිකෙමින් පෝෂිත සෝවියට් දේශය සාහිත්‍යයට දැක්වූ සහනශීලීභාවය හේතුවෙන් රුසියානු කෘති පරිවර්තනය වී ලොවේ පාඨකයා අතට ගියේ ඉතා පහසු මිලකට. එම පොත් බොහොමයක පැවැතියේ වයස් භේදයකින් තොර ව නැවත නැවත රසවිඳීමට පොළඹවනසුලු ආකර්ෂණීයත්වයක්.

සාහිත්‍ය කෘති පදනම් කරගෙන පරිගණක ක්‍රීඩා සකස් කිරීම, විදෙස් රුසියානු සාහිත්‍ය පරිවර්තකයන් අගයනුවස් ලියෝතෝල්ස්තෝයි රන් පදක්කම වැනි ඇගයුම් ප්‍රදානය කිරීම, රුසියාවේත් ප්‍රංශය හා ශ්‍රී ලංකාව ඇතුළු ව වෙනත් රටවලත් වාර්ෂික ව රුසියානු සාහිත්‍ය උලෙළ, සංකථන, තරග සහ ප්‍රදර්ශන පැවැත්වීමත් සිදුකරන බවයි ඇය සඳහන් කරන්නේ. දියුණු ජනසන්නිවේදන සාහිත්‍යයක් ද රුසියාවේ තිබෙන අතර වැඩිහිටියන් (පෙර පරපුර) හා ළමයින් (වත්මන් පරපුර) අතර අන්‍යෝන්‍ය සම්බන්ධය වර්ධනය කිරීම මූලික කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද මගින් නූතන රුසියානු සාහිත්‍යයේ දේශීය හා ගෝලීය වටිනාකම ඉහළ නැංවීමට එරට පියවර ගෙන තිබෙනවා. මේ අනුව රුසියානු සාහිත්‍ය

ප්‍රතික්ෂේප කිරීමට, බැහැර කිරීමට සහ අභියෝගයට ලක් කිරීමට අනාගතයේදී කිසිවකුට ඉඩක් නොලැබෙනු ඇති.

ජාතික සහ ජාත්‍යන්තර ඇගයුම්ලාභී රුසියානු සාහිත්‍යවේදී, මේජර් ජනරාල් ආචාර්ය පාවෙල් ක්‍රිනියෝෆ් ප්‍රකාශ කරන ආකාරයට සොබාදහම, සත්ත්ව චර්යා, සෞන්දර්යය, දේශප්‍රේමය, යුද්ධය, අරගල සහ මානවහිතවාදය ද රුසියානු සාහිත්‍යයේ ප්‍රධාන පැතිකඩ. මේ කෘතිවල ප්‍රාදේශීය සහ උප භාෂාවල වචන භාවිතාව බහුල නිසා ඒවා ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවලට හෝ පරිවර්තනය කිරීමේදී පරිවර්තකයන් අසීරුතාවලට මුහුණපාන නිසා උසස් රසවින්දනයක් සහිත කෘති ජාත්‍යන්තරයේ ප්‍රචලිත වීම යම් පමණකින් සීමා වීමේ ගැටලුව ඔහු පෙන්වා දෙනවා.

බටහිර, ලතින් ඇමරිකානු, අප්‍රිකානු, ජපන්, චීන, අරාබි වැනි නව සාහිත්‍ය ධාරා ලෝකයේ ව්‍යාප්ත ව පැවතියදී තවදුරටත් සෝවියට් රුසියානු සාහිත්‍යය කර තබාගෙන යාම ප්‍රායෝගික ද? යන පැනය ඇතැමුන් විමසන බව මහාචාර්ය ටියුඩර් වීරසිංහ සාකච්ඡා කරනවා. සෝවියට් සංගමයත් කොමියුනිස්ට්වාදයත් බිඳ වැට්ටවීමට සමගාමී ව ඒ හා සම්බන්ධ කලා, සාහිත්‍ය, සංස්කෘතික සහ තාක්ෂණික ඵලදායිතාවත් ශාස්ත්‍රාලයීය වටිනාකමත් යටපත්වුණු නිසා බැලූ බැල්මට පෙනෙන්නේ සෝවියට් රුසියානු සාහිත්‍යයේ අදට වලංගුභාවයක් නැති බවක්. එහෙත් 21 වැනි සියවසේ මුල් දශකය අවසන් වන විට ධනේශ්වරයත් ලිබරල්වාදයත් මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතයේ ප්‍රධාන ක්ෂේත්‍ර පහ වන ආර්ථිකය, දේශපාලනය, ජීවනාර්ථය, මනුෂ්‍යත්වය, මානව සමාජ පරිණාමය යන ක්ෂේත්‍ර ඔස්සේ අර්බුදයට ලක් වූ බව ගෙනහැර දක්වන ඔහු එකී අර්බුද අතරින් පස් වැන්න ඇරඹෙන්නේ මානව වංශ කතාවේ පළමු වතාවට බවත් ප්‍රකාශ කරනවා. එම අර්බුදය විසඳීමට පූර්වාදර්ශයක් නොමැතිකමින් සිදු වුණේ ඒ පිළිබඳ කතිකාවක් සංවිධාන නොවීම, අර්බුද තත්ත්වය වර්ධනය වීම සහ අර්බුදය විසඳීමට තබා එහි ස්වභාවය තේරුම් ගැනීමටවත් බැරි වීම.

බටහිර ලිබරල්වාදයේ පැතිරීමත් සමඟ සෑම පෘථිවි වැසියකුට ම තිබෙන තම තමන්ට අනන්‍ය සංස්කෘතික කේතය (Cultural Code) විකෘති වීම තීව්‍ර වුණා. එසේ නන්නත්තාර වූ ලොව විවිධ ජනවර්ග සතු ව පැවතෙන ඉතිහාසය, සංස්කෘතිය, කලාව, සාහිත්‍යය, සභ්‍යත්වය මත හැඩගැසුණු ජීවිතය සහ හෙට දවස පිළිබඳ සැලසුම්, සංකල්ප පාදක සංස්කෘතික කේතය යළි නගා සිටුවීමේ අභියෝගාත්මක අවශ්‍යතාව ද මතු වුණා. එයින් අදහස් කරන්නේ මානව සමාජීය පරිණාමය යථාවත් කිරීම. එහිදී විශාලතම භූමිකාව භාර වන්නේ සෞන්දර්යයට. සෞන්දර්යය පවතින්නේ කලාව, සාහිත්‍ය, ඉතිහාසය මූලික විෂය ක්ෂේත්‍රවල බව කියන මහාචාර්ය ටියුඩර් වීරසිංහ "වසර 1000ක පමණ සමස්ත ඉතිහාසයක් ඇති රුසියානු සාහිත්‍යයේ මානවාදී ස්වරූපයේ වැදගත්කම පෙන්වා දෙමින් දාර්ශනිකයෙකු, චින්තකයෙකු සහ දේශකයෙකු

ගැඹුරු මානව සම්බන්ධතා සහ ආධ්‍යාත්මිකත්වය සාකච්ඡා වන සෝවියට් රුසියානු සාහිත්‍යයේ එකී සර්වකාලීන වලංගු බව ලෝකයාට වැටහුණත් ඔවුන් ස්වාභාවික ව හෝ ස්වයං ව හෝ ඊට නැඹුරු වන්නට සූදානම් නැහැ. එය සවිඥානික ව සිදු කළ යුත්තක්. ඒ සඳහා 21 වැනි ශතවර්ෂයට යෝග්‍ය සාහිත්‍යමය සංස්කෘතියක අනාගත ප්‍රතිරූපයක් නව පරම්පරාවට සම්ප්‍රේෂණය කළ යුතුයි. සෝවියට් රුසියානු සාහිත්‍යයට සහ අධ්‍යාපනයට ඉතා සංවිධිත ව එවැන්නක් සිදුකර අතීත අත්දැකීම් තිබෙනවා.

වූ තෝමස් වූම්, සෝවියට් රුසියානු සාහිත්‍යය මෙතරම් ලෝක ජනයා අතර ප්‍රචලිත වීමට හේතුව එහි ඇති නොකිලිටි, පාරිශුද්ධ, මානුෂිකත්වයේ විශිෂ්ටත්වය (Humanity) යැයි ප්‍රකාශ කරනවා. ඒ නිසා මානව නිදහසවත් ජාතික නිදහසවත් නොවන හුදු පුද්ගලික නිදහස පමණක් අපේක්ෂා කරන ලිබරල්වාදීන් ඊට බාධා වන සංස්කෘතිය, දේශපාලනය, ජනවර්ගය, ආගම, ලිංගිකත්වය යනාදී සමාජ සාධක මෙන් ම ප්‍රබල ම බාධකය ලෙස සලකන 'මනුෂ්‍යත්වය' වෙත දැඩි ප්‍රහාර එල්ල කරනවා. පරිණාමීය මානවයාගේ නැණවත් සහ බුද්ධිමත් අවධිය වන හෝමෝසේපියන්, හෝමෝටෙක්නිකස් දක්වා විතැන් කරවීම සිදු කරන්නේ ඒ අනුව. සමාජීය පරිණාමය (Social Evolution), මානව පරිණාමය (Human Evolution), සංක්‍රාන්තික ලිංගිකත්වය (Trans Gender) යනාදී විවිධ වේශවලින් හැසිරෙන්නේ මේ විතැන් කිරීමේ ක්‍රියාවලිය. ඊට හසුවූවන්ට කලාව, සාහිත්‍යය, දර්ශනය, ආගම-දහම වැනි කිසිවක් අදාළ නැහැ. එබැවින් අර්බුදයට ලක්වන මනුෂ්‍යත්වය සහ මනුෂ්‍යයා යළි නිර්මාණය කළ යුතුයි. එය ඉටු කිරීමට බටහිර විද්‍යාවට අපහසුයි. ඒ ශක්තිය ඇත්තේ පෙරදිග සභ්‍යත්වයට සහ රුසියානු සාහිත්‍යයට. ඒවා සතු මනුෂ්‍යයකු නිර්මාණය කිරීමේ බලය 19 වැනි හා 20 වැනි සියවස්වලට වඩා වලංගු වන්නේ මනුෂ්‍යයා ආධ්‍යාත්මික ව සහ දෘෂ්ටිවාදී ව පරිහාණියට පත් ව ඇති 21 වැනි සියවසට. සෝවියට් රුසියානු සාහිත්‍යය සහ පෙරදිග දර්ශනවාද මේ සඳහා පූර්ණ විසඳුම නොවුණත් බටහිරින් හඳුන්වා දුන් මනුෂ්‍යයා ප්‍රතිස්ථාපනය (Re-format) කිරීමේ ව්‍යාපෘතියට මුහුණදීමට එතරම් ප්‍රබල වෙනත් විකල්පයක් නැහැ."

රුසියානු සාහිත්‍යය බිහි ව ඇත්තේ වැඩවසම් සහ ධනේශ්වර ක්‍රමයට එරෙහි දෘෂ්ටිවාදයක් ආකාරයෙන් මනුෂ්‍යත්වය, සමාජ සාධාරණත්වය, මානව නිදහස උත්කර්ෂයට නංවන්නට. තමන්ගේ සියලු ප්‍රශ්න විසඳමින් අන්තර්ජාලය විසින් ම සමාජය ජීවත් කරවනු ලබන ජාතිය, ජන්මය, ඉතිහාසය, සංස්කෘතිය, භාෂාව ඇතුළු සමස්ත වටිනාකම් ජාලේශ්වරය විසින් නිෂේධනය කරනු ලබන මනුෂ්‍යත්වය බාදනය වූ අතථ්‍ය ඉඩකඩක (Virtual Space) වාසය කරන පරපුරට හොඳම නිරෝධායන ශක්තිය මේ සෝවියට් රුසියානු සාහිත්‍යයේ තිබෙනවා. ඓතිහාසික, මනෝවිද්‍යාත්මක, දාර්ශනික අගය, ගැඹුරු මානව සම්බන්ධතා සහ ආධ්‍යාත්මිකත්වය සාකච්ඡා වන සෝවියට් රුසියානු සාහිත්‍යයේ එකී සර්වකාලීන වලංගු බව ලෝකයාට වැටහුණත් ඔවුන් ස්වාභාවික ව හෝ ස්වයං ව හෝ ඊට නැඹුරු වන්නට සූදානම් නැහැ. එය සවිඥානික ව සිදු කළ යුත්තක්. ඒ සඳහා 21 වැනි ශතවර්ෂයට යෝග්‍ය සාහිත්‍යමය සංස්කෘතියක අනාගත ප්‍රතිරූපයක් නව පරම්පරාවට සම්ප්‍රේෂණය කළ යුතුයි. සෝවියට් රුසියානු සාහිත්‍යයට සහ අධ්‍යාපනයට ඉතා සංවිධිත ව එවැන්නක් සිදුකර අතීත අත්දැකීම් තිබෙනවා. එය ප්‍රයෝජනයට ගතහොත් බාදනය වූ මනුෂ්‍යත්වය නඟාසිටුවා යළි මනුෂ්‍යයකු නිර්මාණය කර ගැනීමට හැකියාව තිබෙනවා.

# මාධ්‍ය නියාමන භූමිකා

ප්‍රියාන් ආර් විජේබණ්ඩාර

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින යම් යම් ආයතන හා යාන්ත්‍රණ ඔස්සේ මාධ්‍ය නියාමනයක් සිදුවන බැව් පිළිගත යුතු ය. එහෙත් ඒ කෙබඳු මාධ්‍ය ද? නියාමනය ඵලදායී ලෙස සිදුවන්නේ ද? කාලීන තාක්ෂණික හා සමාජ-දේශපාලන-ආර්ථික-සංස්කෘතික තත්ත්ව සමග එම ක්‍රියාවලිය කෙතරම් බද්ධ වී ඇත් ද? යන්න විමසා බැලීම කාලෝචිත ය.

### ➤ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය (Public Performance Board)

1912 ඉංග්‍රීසි යටත්විජිත පාලන සමයේ පනවන ලද තීරණයකින් ආරම්භ වූ ක්‍රියාවලියකි. සංදර්ශන, ප්‍රසංග හා චිත්‍රපට යනාදිය මහජන ප්‍රදර්ශනයට පෙර නිරීක්ෂණය කර ඊට අදාළ නියාමනයෙහි යෙදීම මෙහි මූලික අරමුණ විය. 1951 අංක 23 දරන පනතින් එම ක්‍රියාවලිය සිදු කිරීමට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ස්ථාපනය කර තිබේ. මෙහි මූලික කාර්ය ලෙස වඩාත් සාකච්ඡාවට ලක්වන්නේ චිත්‍රපට ශාලාවට මුදා හැරීමේදී නිකුත් කරන සහතිකයට අදාළ ව U, X සහ A යන වර්ගීකරණයට චිත්‍රපට ලබා දීම මෙන් ම මණ්ඩල විසින් කලින් කලට සකස් කරනු ලබන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව චිත්‍රපටවල දෙබස්, තෝරා ගත් දර්ශන ඉවත් කිරීම යනාදියයි. ඇතැම් විටක චිත්‍රපට පූර්ණ වාරණයට ලක් කිරීමට ද පියවර ගත හැකි අතර එවැනි අවස්ථා අතිශය විරල ය.

එම අවස්ථා පහත පරිදි සාරාංශකොට දැක්විය හැකි ය.

'U' සහතිකය - අසීමාන්ත මහජන ප්‍රදර්ශනයට සුදුසු ය; සෑම කෙනෙකුට ම නැරඹිය හැකි ය.

'X' සහතිකය - වැඩිහිටියන්ට පමණක් සුදුසු ය; වයස අවුරුදු 18ට වැඩි ඕනෑ ම කෙනෙකුට නැරඹිය හැකි ය.

'A' සහතිකය - වැඩිහිටියන්ට වඩාත් සුදුසු ය; වැඩිහිටියන් සමග පැමිණෙන වයස අවුරුදු 18ට අඩු ළමයින්ට ද නැරඹිය හැකි ය.

පනතට අනුව රැඟුම් පාලක මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම අදාළ විෂයභාර ඇමතිවරයාගේ කාර්යයකි. එහෙත් එක් එක් කාල සීමාවලට මණ්ඩලයට සාමාජිකයන් පත් නොකර තනි පුද්ගලයෙකු (සභාපති) යටතේ ක්‍රියාත්මක වූ අවස්ථා ද දක්නට ලැබේ.

> ආනයනික චිත්‍රපට, ටෙලිනාට්‍ය හා වාණිජ වැඩසටහන් පිළිබඳ සමීක්ෂණ මණ්ඩලය 2006 අංක 11 දරන මුදල් පනතින් ස්ථාපිත කරන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමීක්ෂණ මණ්ඩලයකි. ටෙලිවිෂන් මාධ්‍ය ඔස්සේ විකාශනය කිරීමට නියමිත ආනයනික චිත්‍රපට, ටෙලි නාට්‍ය හා වාණිජ වැඩසටහන්වල ප්‍රමිතිය සලකා බලා නුසුදුසු දර්ශන ඇත්නම් ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබාදීම මෙම මණ්ඩලයෙන් සිදු වේ.

පවතින දේශපාලන තන්ත්‍රය අනුව මෙම ක්‍රියාවලිය සංකීර්ණ හා ගැටලුසහගත වූ අවස්ථා ද දැකිය හැකි ය. නිදසුනක්නම් අශෝක හඳගමගේ 'අක්ෂරය' චිත්‍රපටයට අදාළ සිදුවීම් පෙළගැසුණු ආකාරය සලකා බැලිය හැකි ය. 2005 වසරේ සැප්තැම්බර් මාසයේ නිකුත් වීමට නියමිත ව තිබූ චිත්‍රපටයට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය 'වැඩිහිටියන්ට වඩාත් සුදුසු' ප්‍රවර්ගය යටතේ සහතිකයක් දී තිබියදී එවකට විෂය භාර අමාත්‍යවරයා විසින් එම අවසරය යළි කැඳවන ලදී. අමාත්‍යවරයාගේ එම ක්‍රියාව අභියෝගයට ලක් කරමින් චිත්‍රපට අධ්‍යක්ෂවරයා නීතිමය ක්‍රියාමාර්ග ගත්තේ ය. එසේ තිබියදී ළමා ආරක්ෂණ අධිකාරිය විසින් මෙම චිත්‍රපටයේ දර්ශනයක් හේතුවෙන් බාල වයස්කාර දරුවෙකු අපයෝජනයට ලක්වන බවට චෝදනා කරමින් චිත්‍රපට අධ්‍යක්ෂවරයාට එරෙහි ව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව ප්‍රකාශ කරන ලදී. චිත්‍රපටයක් මහජන ප්‍රදර්ශනයට පෙර නැරඹීමට හැකියාව ඇත්තේ (නීතිමය වශයෙන්) රැඟුම් පාලක මණ්ඩලයට පමණක් බැවින් චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් තම චිත්‍රපටය ළමාරක්ෂණ අධිකාරිය විසින් නරඹන ලද්දේ කෙසේ ද? යන්න අභියෝගයට ලක් කරන ලදී. තතු මෙසේ තිබියදී විෂය භාර අමාත්‍යවරයා වෙනස්වීම ඇතුළු දේශපාලන වාතාවරණයේ යම් වෙනස්කම් හේතුවෙන් මෙම ක්‍රියාවලිය නැවත මුල සිට ආරම්භ කිරීම සුදුසු බැව් බලධාරින්ගේ තීරණය විය. තමන් නිවරදි ක්‍රමවේදය අනුගමනය කළ බැවින් නැවත මුල සිට චිත්‍රපට ප්‍රදර්ශනයට අවසර ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට චිත්‍රපට අධ්‍යක්ෂවරයා අකමැති විය. අවසන් ප්‍රතිඵලය වූයේ අගනා සිනමා කෘතියක් නැරඹීමේ අවස්ථාව ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන්ට අහිමි වීම ය.

### ➤ ආනයනික චිත්‍රපට, ටෙලිනාට්‍ය හා වාණිජ වැඩසටහන් පිළිබඳ සමීක්ෂණ මණ්ඩලය

මෙය 2006 අංක 11 දරන මුදල් පනතින් ස්ථාපිත කරන ලද ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමීක්ෂණ මණ්ඩලයකි. ටෙලිවිෂන් මාධ්‍ය ඔස්සේ විකාශනය කිරීමට නියමිත ආනයනික චිත්‍රපට, ටෙලි නාට්‍ය හා වාණිජ වැඩසටහන්වල ප්‍රමිතිය සලකා බලා නුසුදුසු දර්ශන ඇත්නම් ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබාදීම මෙම මණ්ඩලයෙන් සිදු වේ.

### ➤ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය (Sri Lanka Press Council)

1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ පවත්වාගෙන යන මෙය ශ්‍රී ලංකා පුවත්පත් මාධ්‍ය නියාමනය සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයයි. පුවත්පත්වල වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීම, පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම, පුවත්පත් ආචාරධර්ම පවත්වාගෙන යාම සහ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ඇති කිරීම ඇතුළු පරමාර්ථ ගණනාවක් මුල්කර ගනිමින් මෙම මණ්ඩලය පිහිටුවා තිබේ. පුවත්පත් මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ එහි කොමසාරිස්වරයා ය. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල විසින් පරිපාලනය මෙහෙයවනු ලැබේ. ඔවුන් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. එහිදී රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුළත් වේ. 1981 වසරේදී ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට කර ඇති පුවත්පත් මණ්ඩලය යටතේ ඇති ආචාරධර්ම මාලාවට අදාළ ව ආචාරධර්ම කඩ කිරීම පිළිබඳ මහජන පැමිණිලි විභාග කරනු ලබන්නේ සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. පුවත්පත් ආචාරධර්ම කඩ කිරීම පිළිබඳ විභාග කර තීන්දු ප්‍රකාශයට පත් කළ හැකි අතර මේ පනතෙන් මණ්ඩලයට අධිකරණ බලතල අර්ධ වශයෙන් ලබා දී තිබේ.

කාලීන අවශ්‍යතා හා තාක්ෂණයේ දියුණුව මෙන් ම මාධ්‍ය ක්ෂේත්‍රයේ අභිවර්ධනය වෙනුවෙන් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය වෙනුවට 'මාධ්‍ය කොමිෂන් සභාවක්' ස්ථාපිත කිරීමට මේ වන විට ක්‍රියාමාර්ග ගනිමින් තිබේ.

### ➤ ශ්‍රී ලංකා විදුලි සංදේශන කොමිෂන් සභාව (Sri Lanka Telecommunication Regulatory Commission - SLTRC)

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත යටතේ ස්ථාපිත ආයතනයකි. විදුලි සංදේශ නියාමන ආයතනය ලෙස විදුලි සංදේශ කර්මාන්තයේ නියාමනය, මහජන අයිති ආරක්ෂා කිරීම ආදිය මේ යටතේ සිදු කෙරේ. විදුලි සංදේශ සේවා සැපයීමේදී මෙන් ම ඊට අදාළ උපාංගවල ගුණාත්මකභාවය පිළිබඳ කටයුතු කිරීමේදී නව විදුලි සංදේශ ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම කොමිසමේ අරමුණු අතර වේ.

> 1973 අංක 05 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ පවත්වාගෙන යන මෙය ශ්‍රී ලංකා පුවත්පත් මාධ්‍ය නියාමනය සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයයි. පුවත්පත්වල වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීම, පුවත්පත් නිදහස ආරක්ෂා කිරීම, පුවත්පත් ආචාරධර්ම පවත්වාගෙන යාම සහ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ඇති කිරීම ඇතුළු පරමාර්ථ ගණනාවක් මුල්කර ගනිමින් මෙම මණ්ඩලය පිහිටුවා තිබේ. පුවත්පත් මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන්නේ එහි කොමසාරිස්වරයා ය.

ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශ සඳහා සංඛ්‍යා පද්ධති බෙදා දීම මෙමගින් සිදුවන කාර්යයකි. ජංගම දුරකතන භාවිතයේදී ග්‍රාහකයන්ට මතු වන ගැටලු පිළිබඳ පැමිණිලි කළ හැක්කේ ද මෙම ආයතනයට ය.

### ➤ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම (Press Complaints Commission of Sri Lanka - PCCSL)

ශ්‍රී ලංකා කර්තෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, වෘත්තීය මාධ්‍යවේදීන්ගේ සංගමය, පුවත්පත් ආයතනය යන ආයතන ඒකාබද්ධ ව පිහිට වූ ස්වයං නියාමන ආයතනයකි. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයට අනුබද්ධ ව 2003 වසරේදී මෙය පිහිටුවී ය. ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වෘත්තීය මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ පුවත්පත්වලින් සිදු වන ආචාරධර්ම කඩ කිරීම පිළිබඳ පැමිණිලි මෙම කොමිසම වෙත ඉදිරිපත් කළ හැකි ය. මහජනතාවගෙන් ලිඛිත ව ලැබෙන පැමිණිලි ඒ ඒ පුවත්පත් වෙත යොමු කර, ඊට අදාළ කරුණු විමසා බලා නිවැරදි කිරීමක් පළ කිරීමට ඉල්ලීම් කිරීම කොමිසම සිදු කරයි.

### ➤ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka Computer Emergency Readiness Team - SLCERT )

ශ්‍රී ලංකාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් Information and Communication Technology Agency - ICTA යටතේ 2006 වසරේදී පිහිටුවන ලද ආයතනයකි. රටේ ජාතික සයිබර් ආරක්ෂණ ආයතනය වශයෙන් ක්‍රියාත්මක වෙමින් විවිධ සංවිධාන හා පුද්ගලයන් විසින් සිදු කරනු ලබන සයිබර් අපරාධ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීම මේ ආයතනය සිදු කරයි. පරිගණක භාවිතයෙන් සිදු කෙරෙන මූල්‍ය සහ වෙනත් අපරාධ පිළිබඳවත් ත්‍රස්තවාදී සංවිධානවල ක්‍රියාකාරිත්වය කෙරෙහි දැනුවත් කිරීම් පිළිබඳවත් අනතුරු ඇඟවීම හා තාක්ෂණික විසඳුම් ලබා දීම මෙන් ම සමාජ මාධ්‍ය ජාලවලට අදාළ ව්‍යාජ ගිණුම් පිළිබඳ පැමිණිලි හා පරිගණක ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් මහජන පැමිණිලි විමර්ශනය කර ඊට අදාළ තාක්ෂණික විසඳුම් සැපයීම මෙහි කාර්ය වේ.

# සුද්දාගේ ක්‍රීඩාව

රා. මු. නිශ්ශංක



ශ්‍රී ලංකාවේ ක්‍රිකට් විකාශයේ වර්තමානය ශ්‍රී ලාංකේය වුවත් ඉතිහාසයේ ශ්‍රී ලංකා ක්‍රිකට් හැටියට තිබුණේ ලංකාවේ කොළඹ ක්‍රිකට්. එයට ඉඳහිට මහනුවර, මාතර සහ ගාල්ල ආශ්‍රිත ප්‍රධාන පාසල්වලින් ක්‍රීඩකයන් පැමිණියා. මේ සංස්කෘතිය ඇතුළේ ක්‍රිකට්, සුද්දාගේ ක්‍රීඩාව ලෙස මෙන් ම ඉහළ පංතියේ ක්‍රීඩාවක් ලෙස ද වර්ගීකරණය කළේ නරියා මිදි තිත්තයි කී ලෙස.

ප්‍රේමසර ඇපාසිංහ, පාලිත පෙරේරා, සමන් අතාවුදහෙට්ටි, මයිකල් කරුණාතිලක වැනි බොහෝ ගුවන්විදුලි සන්නිවේදකයන් එවකට ප්‍රධාන ම විද්‍යුත් මාධ්‍ය හැටියට පැවති ගුවන්විදුලියෙන් මවා පෙන්නන ක්‍රිකට්වලට ගම ආසක්ත වුණා. එහෙත් ඒ ක්‍රීඩාව දැසින් දැක නොවෙයි. කඩපිල් ගානේ ක්‍රිකට් වෙනුවට ක්‍රීඩාලෝලීන් අද මෙන් ම ජය පරාජය ගැන තර්ක කළේ රිකට් නම් ක්‍රීඩාවක් ගැන.

ගම බොහෝ දේ නොදැන වුවත් පත්තරවල අන්තිම පිටුවත් ගුවන්විදුලියේ උද්‍යසන විකාශය වූ බ්‍රිස්ටල් ක්‍රීඩා විසිතුරු සමඟත් ක්‍රිකට් ක්‍රීඩාව ගැන විශාල දැනුමක් එකතු කරගෙන මෙන් ඔවුන් කතාබහ කරන්නට වුණා. තරග දිනවලදී ගමේ පාසලේත් ඩෙස්ක් එක යටට සාක්කුවේ දාගෙන යා හැකි රේඩියෝ රිංගන්නට වුණා. විශේෂයෙන් 1981 වසරේදී ශ්‍රී ලංකාව ටෙස්ට් තත්ත්වය ලබන විට ගමටත් එය දැනෙන්නට වුණේ හරියට නොමිලේ ආහාර සලාකයක් ලෝකය දෙන්න තීරණය කළ ගානට ක්‍රීඩාලෝලීන් සිත් සතුටෙන් පුරවා ගනිමින්. ඊට වසර තුනකට පසුව ඉන්දියාව ලෝක ශූරයන් වී ශ්‍රී ලංකාවට ආ පසුව ඔවුන්ගෙන් ශ්‍රී ලංකාව පළමු ටෙස්ට් ජය උදුරා ගනිද්දී එවකට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන පසු දින රජයේ නිවාඩු දිනයක් බවට පත් කළේ රටේ ජනතාව ඒ තරම් ම ක්‍රිකට්ලෝලීන් වූ නිසා.

එහෙත් කුමන තත්ත්වයක වුවත් ක්‍රිකට් කොළඹ ක්‍රීඩාවක් වීම සහ දළ කාරයන්ගේ ක්‍රීඩාවක් වීම ගැන තිබුණු සමාජ මතය ගමේ හිත් පාරන්නට සහ රිදවන්නට වූයේ ඒ සඳහා අපේ එකෙක්ට නැති ඉඩ ගැන හැඟීම පැසවමින් පාරවන තුවාලයක් තත්ත්වයට පත් කර තිබුණු බැවින්. 89 සමාජ අරගලයක් නිර්මාණය වෙද්දී ද එක් සටන් පාඨයක වූයේ ' කොළඹට කිරි ගමට කැකිරි' යන්න. කොළඹ පාසල් කිහිපයක අදටත් කිරි තිබුණ ද ගමේ ඇති පහසුකම්වත් නැති, කැකිරිවත් නැති කොළඹ පාසල් ගණන විශාලයි. එහෙත් ක්‍රිකට් වැනි ක්‍රීඩාවලට ඇති ගමේ ඇල්ම, රටේ නියෝජනයක් දක්වා යන්නට ගමට බැරි පැසවීම එවක සටන් පාඨවලට ඇති කළේ අමුතු ශක්තියක්. එකල විරෝධාකල්ප ගීවලදී නන්දා මාලනිය ගැයූ ගීතයක් ද පාඨක ඔබට ද මතක ඇති.

කාකා බිබී නටන අතර
නරුම යහළු යෙහෙළියන්...
පන්දු කෙළින අතර
ඉහළ පාසල්වල අමනයන්...
රට ගිනිගෙන ඇති වග දුටු
මගේ එක ම පුතණුවන්...
එගිනි නිවන මඟ සෙවීම
වරදක් දැයි මට කියන්....

සැබවින් ම එහි තිබුණේ ක්‍රිකට් සම්බන්ධයෙන් අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රීඩාවක් ලෙස එන දේශපාලන විරෝධය විය හැකියි. එහෙත් එය පවතින පාලන ක්‍රමයට විරුද්ධ වන්නට බලපා ඇත්තේ

ඉහළ පාසල්වලට ඇති ක්‍රිකට් ක්‍රීඩා කිරීමේ අවස්ථා සඳහා ගමේ පාර වැසී තිබීම යන්න ද සාධාරණ තර්කයක්. අතැම් විට ගිනි නිවන්නට එකල ගිනි අවිය ගත් තරුණයන් සැඟ වී කරන දේශපාලන ව්‍යාපාරයෙන් පිට සවස්වරුවල ප්‍රසිද්ධියේ ජනතාව අතර ක්‍රිකට් පිති රැගෙන සතුටෙන් ක්‍රීඩා කළ බවට ද සාක්ෂි තිබෙනවා.

කෙසේ හෝ 1996 වසරින් පසුව ශ්‍රී ලංකාවේ ලෝක කුසලාන ජයග්‍රහණය සමඟ ශ්‍රී ලංකා ක්‍රිකට්වලට අසීමිත ව මුදල් ගලා එන්නට වුණා. එම මුදල්වලට සාපේක්ෂ ව කොළඹින් ක්‍රිකට් ගමට යාමේ පාරවල් ද විවර වුණා. සිමෙන්ති තණතීරු ලෙස ගමට පැමිණි පුහුණු බිම් වෙනුවට වර්තමාන ක්‍රිකට් පරිපාලනය ක්‍රීඩා බිම් මෙන් ම පාසල් සඳහා ක්‍රීඩා උපකරණ ලබා දෙන්නට ද ක්‍රියා කරමින් සිටිනවා. විශාල ධනයක් ඒ වෙනුවෙන් ද වැය කරනවා. පළමු පෙළ ක්‍රිකට් ක්‍රීඩා නොකරන පාසල්වලට ද සිය හැකියාව අනුව පෙරට එන්නට මේ නිසා පාරවල් සැකසෙමින් තිබීම ඉතා වැදගත්. කොළඹ හෝ ඉතිහාසයේ ක්‍රිකට් පැවති ප්‍රධාන නගරවල හෝ පාසල් අභිභවා විශේෂයෙන් ජාතික කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව ගම විසින් සම්පූර්ණයෙන් ම පාහේ ආක්‍රමණය කරනු ලැබීම ද සුවිශේෂ තත්ත්වයක්.

> ප්‍රේමසර ඈපාසිංහ, පාලිත පෙරේරා, සමන් අතාවුදහෙට්ටි, මයිකල් කරුණාතිලක වැනි බොහෝ ගුවන්විදුලි සන්නිවේදකයන් එවකට ප්‍රධාන ම විද්‍යුත් මාධ්‍ය හැටියට පැවති ගුවන්විදුලියෙන් මවා පෙන්නන ක්‍රිකට්වලට ගම ආසක්ත වුණා. එහෙත් ඒ ක්‍රීඩාව දෑසින් දැක නොවෙයි. කඩපිල් ගානේ ක්‍රිකට් වෙනුවට ක්‍රීඩාලෝලීන් අද මෙන් ම ජය පරාජය ගැන තර්ක කළේ රිකට් නම් ක්‍රීඩාවක් ගැන.

එවැනි වකවානුවක ලෝක කුසලාන විස්සයි20 තරගාවලියේ සම සත්කාරකත්වය ශ්‍රී ලංකාවට ලැබෙන විට ශ්‍රී ලංකාව සතු ජාතික කණ්ඩායමේ නියෝජනය, 1982 පළමු ටෙස්ට් තරගයේ නියෝජනයට වඩා කෙතරම් වෙනස් ද යන්න සිතා බැලිය යුත්තක්. මෙවර සංචිතයට නම් කර, අවසාන මොහොතේ ආබාධයක් නිසා කණ්ඩායම හැර ගිය ඒෂාන් මාලිංග පළමු පෙළ පාසල් ක්‍රිකට් ක්‍රීඩා නොකරන රත්නපුර සීවලී මධ්‍ය මහා විද්‍යාලය නියෝජනය කළ ක්‍රීඩකයෙක්. ඔහුගේ හිස්තැන පුරවන්නට කණ්ඩායමට කැඳවන ලද ප්‍රමෝද් මධුශාන් ද එවැනි ම පාසලකින් ක්‍රිකට් පිටියට පැමිණියෙක්. ඔහු අකුරු කර තිබෙන්නේ හම්බන්තොට ථේරපුත්ත පාසලෙන්.

පිරිමි සහ කාන්තා ජාතික ක්‍රිකට් කණ්ඩායම් සහ වයස් කාණ්ඩ ක්‍රිකට් කණ්ඩායම් ගත්ත ද යාපනය දක්වා ම රට ම නියෝජනය වන තත්ත්වයක් දකින්නට පුළුවන්. ඉහළ පාසල්වල තිබුණු සමාජ සංයුතිය වෙනස්. ඉංග්‍රිසි භාෂාවෙන් කතා කරන, වෙනස් ම සමාජ පංතියකට සම්බන්ධ පිරිසක් ලෙස ලෝකයට ක්‍රිකට් ක්‍රීඩා කරන පංතිය දැනුණේ ඒ නිසා. අතීතයේ ද ඒ ආකාරයට දක්ෂයන්ට ඉහළ පාසල්වල දොරටු විවර වුවත් අද තරම් නැහැ. අද රාජකීය කණ්ඩායමෙන් ජාතික කණ්ඩායමට එන ක්‍රීඩකයන් ද කතා කරන්නේ සිංහල බසින්. ඒ, ඉංග්‍රිසි සමාජයට ඇති අනන්‍යතාව සහ ආර්ථිකය ද පෙර මෙන් එම පවුල්වලට බද්ධ වී නැති නිසා.

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ දක්ෂතා සම්බන්ධයෙන් ගත් විට වර්තමානයේ එය අඛණ්ඩ ව නඩත්තු කර ගැනීමේ බරපතළ ගැටලුකින් පසුවනවා. කුමන ජයග්‍රහණය ලැබුව ද එය ස්ථාවර ව පවත්වාගෙන යා හැකි ද? යන්න පිළිබඳ නිරන්තර සැකයක් ඇති වන්නේ එබැවින්. ඊට හේතු ලෙස හැමෝටම ම අදහස් ප්‍රකාශ කරන්නට ඉතිහාසයේ තිබුණු කඩ මණ්ඩිය වෙනුවට ලෝකය සමඟ ම කතා කරන්නට සැකසුණු සමාජ මාධ්‍ය අවකාශයේ ප්‍රේක්ෂකයන් තමන්ට දැනෙන දේ කතා කරමින් සිටිනවා. ක්‍රීඩාව විෂයක් හැටියට හඳුනා ගන්නා මාධ්‍යකරුවන් හෝ ක්‍රීඩාවට සම්බන්ධ නොවන පිරිස් හෝ තමන්ට ක්‍රීඩාව දැනෙන හැටියට සහ විශේෂයෙන් පරාජය දරා ගැනීමට නොහැකි මානසික මට්ටමෙන් අදහස් වපුරනවා. කවුරුන් හෝ සමාජ මාධ්‍ය ජාලයට ආර්ථික වශයෙන් ලාභයක් ඇතුව ලියන දේ පරාජයට හේතුව සේ හැඳෑරීමකින් තොර ව බෙදා හැරීමත් දක්නට පුළුවන්.

ක්‍රීඩකයන් නොව රටේ බොහෝ දෙනා ගමට ක්‍රිකට් පැමිණීම ගැන සිහින දුටුවා. තමන් නොව තමන්ගේ පැත්තේ එකෙකු කණ්ඩායමේ ඉන්නවා දැක සතුටු වෙන්නට සිහින දුටුවා. එය දැන් බොහෝදුරට ඉටු වී තිබෙනවා. එසේ ම ඉටුවෙමින් ද තිබෙනවා. එහෙත් පරණ ක්‍රිකට් සංස්කෘතියේ තිබුණු උද්‍යෝගය, හඬා යාම සහ සටන්කාමීත්වය කෘත්‍රිම වී තිබෙනවා. එවැනි හැඟීමකින් කණ්ඩායමක් විදිහට බැඳුණු බව පෙනෙන්නේ අඩුවෙන්. ක්‍රිකට්මය නොවුණු ඒ තත්ත්වය නැවත ඇති කර ගැනීමට මේ ක්‍රීඩකයන් නැවත දුප්පත් කළ යුතු නැහැ. එහෙත් ඔවුන්ට ඔවුන් ව පෙනෙන සේ මනසට කතා කරන උපදේශනයක් අවශ්‍ය වී තිබෙනවා. එය සමාජ, දේශපාලනික සහ පුද්ගලයෙකුට මානව ආදරය සහ ගෞරවය සහිත ව ජීවත්වීමේ වටිනාකම කියා දෙන්නක් විය යුතුයි.

අප හුස්ම වැටෙන්න අවශ්‍ය තැනින් හුස්ම ගන්නට පටන් ගෙන නැහැ. පළමු දේ ආකල්පමය වශයෙන් ක්‍රීඩකයා සිටින ආස්ථානය සහ සැබෑ ක්‍රීඩාවට, ජයග්‍රහණයට ඇති දුර මීටර් 100ක වේගයෙන් පසු කළ යා නොහැකි බව පහදා දී ඊට මැරතන්මය වෙහෙසක් විඳීමට ක්‍රීඩක මනස වෙනස් කිරීම. එම වෙහෙස ඇතුළේ හමු වන කඳු දුර්ග දරාගන්නට සහ සාර්ථක ව පසු කර යන්නට මනස හුරු වූ පසු නුහුරු ඉලක්ක ගැන වෙහෙසීමට වඩා ජීවිතයේ සෑම දෙයක් ම ලැබෙන ක්‍රිකට්වලට සාධාරණය ඉටු කරන්නට ඔවුන්ගේ මනස සකස් වනු ඇති.



සම්බන්ධතාව යනු මනුෂ්‍ය ජීවිතයේ ගැඹුරු ම හැසිරීමයි. බ්‍රිතාන්‍ය යුගයේ සිට රටේ ආර්ථිකයට කඳුකරයේ ශ්‍රමය සමඟ බැඳී ජීවත් වූ මලෙයිහ ජනතාව රට ගොඩනඟද්දී දෘශ්‍යමාන නොවූ, බොහෝ කාලයක් නොසලකා හරින ලද්දන් වුණා.

මේ මොහොතේ උරහිස මත තැබූ අතක් නියෝගයක් නොව පිළිගැනීමක්. “ඔබ තවදුරටත් නොපෙනෙන ජනතාවක් නොවෙයි” යන්න කියන නිහතමානී වචන රහිත පණිවිඩයක් මේ.

සටහන
**අනුරුද්ධ ලොකුහපුආරච්චි**
ඡායාරූපය
ජනාධිපති මාධ්‍ය අංශය


**දෙසතිය** පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-